## සිව්වැනි කොටස

---

# මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාළ

## 1978 ප්‍රධාන නීති අණපනත්

---

පිටුව


| | | |
|---|---|---|
| 1. | 1974 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත. | I |
| 2. | 1978 අංක 10 දරන බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම (විශේෂ විධිවිධාන) පනත. | VI |
| 3. | 1978 අංක 13 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) පනත | XIII |
| 4. | 1978 අංක 20 දරන අපනයන (විශේෂ බදු) පනත. | XVI |
| 5. | 1978 අංක 28 දරන ජාත්‍යන්තර මූදල් සංස්ථා ගිවිසුම (සංශෝධන) පනත. | XXI |
| 6. | 1978 අංක 30 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත. | XXII |
| 7. | 1978 අංක 5 දරන බදු සමා පනත. | LVII |
| 8. | 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත. | LXII |
| 9. | 1978 අංක 18 දරන විසර්ජන පනත. | LXXII |

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත

(සහතිකය සටහන් කළේ 1978 ජනවාරි මස 31 වන දින)

**මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; ජනරජයේ ආර්ථිකය සංවර්ධනය කිරීම හා පුනර්ජීවනය කිරීම පිණිස අවශ්‍ය බලතල එකී කොමිෂන් සභාව වෙත පැවරීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී හෝ දිනවලදී එහි විධිවිධාන සියල්ල ම හෝ ඒවායින් කිසිවක් ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) (මෙහි මින් මතු ''කොමිෂන් සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව (1) වන වගන්තිය යටතේ එයට දෙන ලද නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් කොමිෂන් සභාව විසින් නඩු පැවරීම සහ එම නාමයෙන් කොමිෂන් සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය. තව ද සංස්ථා විසින් නීති ප්‍රකාරව ඉටු කරනු ලැබිය හැකි වෙනත් කාර්යයන් ඉටු කරනු ලැබීම ද ඒ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි ය.

3. කොමිෂන් සභාවෙහි අරමුණු;-

(අ) ජනරජයේ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම සහ නංවාලීම;

(ආ) ජනරජයේ ආර්ථික පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම;

(ඇ) ජනරජය ඇතුළත විදේශ ආයෝජන උනන්දු කරලීම සහ වැඩි දියුණු කිරීම;

(ඈ) විදේශ විනිමය උපයන ප්‍රභව විවිධ කරලීම සහ අපනයන ඉපයුම් වැඩි කරලීම;

(ඉ) ජනරජය ඇතුළත කාර්මික සහ වාණිජ ව්‍යවසා පිහිටුවීම හා සංවර්ධනය උනන්දු කිරීම සහ පෝෂණය කිරීම;

(ඊ) 4 වන වගන්තියෙහි සඳහන් බල ප්‍රදේශයෙහි කටයුතු පරිපාලනය කිරීම; සහ

(උ) ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියලු ක්‍රියා කිරීම

විය යුතු ය.

4. මේ පනතේ කාර්ය සඳහා බල ප්‍රදේශය මෙහි ''අ'' උපලේඛනයෙහි දක්වා ඇති පිඹුරෙහි පෙන්නුම් කර තිබෙන ප්‍රදේශය විය යුතු ය.

5. කොමිෂන් සභාවට:-

(1) බල ප්‍රදේශයෙහි සහ එම ප්‍රදේශය සම්බන්ධයෙන්; සහ

(2) යම් බලපත්‍රයක් ව්‍යවසායක් සහ ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් පාලන බලය තිබිය යුතු ය.

16. මේ පනතින් කොමිෂන් සභාව සතු කරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව:-

(අ) කොමිෂන් සභාවේ අරමුණු මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා කිරීමට හෝ පියවර ගැනීමේ;

(ආ) කර්මාන්ත වැඩබිම්වල කාර්ය සඳහා, සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා හෝ පොදු ආර්ථික සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ, විකිණීමේ හෝ බදුදීමේ හෝ බදු ගැනීමේ;

(ඇ) විකිණීම හෝ බදුදීම පිණිස කාර්මික ජනපද පිහිටුවීමේ;

(ඈ) ව්‍යවසා සමග ගිවිසුම්වලට ඇතුළත් වීමේ;

(ඉ) මේ පනතින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත නතු කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ සහ කටයුතු කිරීමේ; සහ

(ඊ) මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කටයුතු කිරීම සම්බන්ධ වූ හා හෝ ඊට ආනුෂංගික වූ වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතු ය.

17. (1) බල ප්‍රදේශය ඇතුළත හෝ ඉන් පිටත යම් ව්‍යවසායක් සමග ගිවිසුම්වලට ඇතුළත් වීමට සහ මෙහි ''ආ'' උපලේඛනයෙහි සඳහන් යම් නීතියකින් නිදහස් කිරීම කිරීමට හෝ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගවලට අනුකූලව එවැනි නීතිවලින් කිසිවක් ඒ ව්‍යවසාවලට අදළවීම සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ වෙනස් කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(2) එවැනි සෑම ගිවිසුමක් ම ලියවිල්ලකින් විය යුතු අතර එය කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි කරනු ලැබූ විට කොමිෂන් සභාව සහ ව්‍යවසාය අතර වලංගු හා අනුගම්‍ය ගිවිසුමක් විය යුතු ය.

18 (1) යම් අය කිරීමක් හෝ ගාස්තුවක් නියම කිරීමේ හෝ අය කිරීමේ බලය ඇතුළුව කොමිෂන් සභාව වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කර ඇත්තා වූ බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය ඉටු කිරීමට සහ කටයුතු කිරීමට අදළව සහ රීති සෑදීමට බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

19. මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය අරමුණු ක්‍රියාවේ යෙදවීමේ දී කොමිෂන් සභාව ආණ්ඩුවේ සාමාන්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු ය.

20. (1) කොමිෂන් සභාව විසින්:-

(අ) යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, නියමයක් හෝ නිවේදනයක් මුළු බල ප්‍රදේශය සඳහා හෝ එහි යම් නිශ්චිත කොටසක් සඳහා සෑදීම හෝ නිකුත් කිරීම; සහ

(ආ) යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත එවැනි යම් ලිඛිත නීතියකින් සතු කරනු ලැබූ හෝ පවරනු ලැබූ බලතල හෝ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් හෝ බල ප්‍රදේශය තුළ හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම

නීත්‍යනුකූල විය යුතු ය යන සුළු වශයෙන් වූ වෙනස් කිරීමට යටත්ව ඒ අතුරු ව්‍යවස්ථා, නියෝග, නියම හෝ නිවේදන සෑදීමට හෝ නිකුත් කිරීමට හෝ ඒ බලතල හෝ කටයුතු ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට බලය පවරනු ලැබූ බලධරයා, නිලධරයා හෝ තැනැත්තා සම්බන්ධයෙන් එකී යම් ලිඛිත නීතියක වූ සඳහන් කිරීම, කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වූවාක් මෙන් සමාන ආකාරයෙන් මෙහි "ඇ" උපලේඛනයෙහි සඳහන් තත්කාලය සඳහා වූ ලිඛිත නීති බල ප්‍රදේශය තුළ බලාත්මක විය යුතු ය.

(2) මේ වගන්තියෙහි සඳහන් යම් බලයක් හෝ කටයුත්තක් කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට යම් නිලධරයකු හෝ තැනැත්තකු කොමිෂන් සභාව විසින් රීති මගින් නම් කළ හැකි ය.

21. (1) මහා නගර සභා ආඥාපනත යටතේ මහා නගර සභාවක සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සියලු බලතල, කාර්ය හා කටයුතු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතුය.

(2) මහා නගර සභා ආඥාපනතේ I වන, II වන, III වන, IX වන, X වන, XI වන සහ XIV වන කොටස්වල ඇතුළත් විධිවිධාන හැර එම ආඥාපනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනතේ විධිවිධාන වලට අනනුකූල වන්නා වූ විධිවිධාන හැර බල සීමා ප්‍රදේශය තුල අදාළ විය යුතු අතර, එම ආඥාපනතේ මහා නගර සභාව සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමක්ම කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස ද මහ නගරසභාව සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමක්ම බලප්‍රදේශය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙසද අමාත්‍යවරයා සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමක් ම මේ පනතේහි පරිපාලනය පිළිබඳ විෂයය සහ කටයුතු පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස ද සලකනු ලැබිය යුතු ය.

OF MORATUWA LIBRARY LANKA

(3) මහා නගර සභා ආඥාපනත මගින් යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත සතු කර ඇති හෝ පවරා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට කොමිෂන් සභාව විසින් රීතියක් මගින් යම් නිලධරයකු හෝ තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(4) යම් ලිඛිත නීතියක පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමක් ම, බල ප්‍රදේශය තුළ කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

22. (1) මහා නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, සුළු නගර සභා ආඥාපනත සහ ගම් සභා ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතේ වූ සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයකින් බල ප්‍රදේශය සමන්විත වන කවර හෝ අවස්ථාවක මේ පනතේ 4 වන වගන්තිය ක්‍රියාත්මක වන දිනයෙහි සිට ඒ පරිපාලන ප්‍රදේශයට අදාළ සියලු කාර්ය සඳහා කොමිෂන් සභාව, එම පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සිට ඒ පළාත් පාලන ආයතනය විසුරුවා හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(2) එවැනි යම් ආඥාපනතක් යටතේ පිහිටුවන ලද යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතේ වූ සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයකින් බල ප්‍රදේශය සමන්විත නොවන කවර හෝ අවස්ථාවක අමාත්‍යවරයා විසින් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්. ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් නිදහස් කිරීම්, ගැලපීම් හා සුළු වශයෙන් වූ වෙනස් කිරීම් ඇතොත් ඒවාත් සමඟ (1) වන උපවගන්තියේ විධිවිධාන බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රදේශයට අදාළ විය යුතු යයි විධාන කළ යුතු අතර, මේ වගන්තිය අදාළ කිරීමේ දී උද්ගත විය හැකි යම් අවිස්ථානුගත කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම හෝ යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් නිශ්චය කිරීම හෝ ගැලපීම හෝ පිණිස අවශ්‍ය යයි ඔහු සලකන සියලු විධාන නිකුත් කිරීම විශේෂයෙන් ම ඒ නියමය මගින් කරනු ලැබිය හැකිය.

(3) මේ පනතේ 4 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයෙහි යම් ප්‍රදේශයක් තුළ බලපැවැත්වූ යම් පළාත් පාලන ආයතනයක් විසින් සාදනු ලැබූ සියලු අතුරු ව්‍යවස්ථා, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, ඒ ප්‍රදේශය තුළ තව දුරටත් බලපැවැත්විය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථා මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

23. මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කාර්ය ඉටු කිරීමේ දී හා කටයුතු කිරීමේ දී අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන කොමිෂන් සභාව විසින් අනුගමනය කළ යුතුය.

24. (1) අමාත්‍යවරයා විසින් නියෝග මගින්; —

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව හා යම් ව්‍යවසායක් හා අතර එළඹෙන්නා වූ යම් ගිවිසුමක ඇතුළත් කරනු ලැබිය හැකි හෝ සංයුක්ත කරනු ලැබිය හැකි මෙහි "ආ" උපලේඛනයෙහි දක්වා ඇති යම් ලිඛිත නීති අත්හැරීමක හෝ ඒවා සුළු වශයෙන් වෙනස් කිරීමක විෂයය හා ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය හැකිය;

(ආ) මෙහි "ඇ" උපලේඛනයෙහි දක්වා ඇති යම් ලිඛිත නීතියක විධිවිධාන, බල ප්‍රදේශයට අදාළ කිරීමේදී ඒ ලිඛිත නීතියේ විධිවිධාන සුළු වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම සහ මේ පනතේ විධිවිධාන යටතේ යම් බල ප්‍රදේශයකට අදාළවන්නා වූ මහා නගර සභා ආඥාපනතේ යම් විධිවිධානයක් සුළු වශයෙන් වෙනස් කිරීම කළ හැකිය;

(ඇ) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන යම් කාරණයක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය හැකිය.

(2) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබීමෙන් පසු හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය,

**25.** (1) 17 වන වගන්තිය යටතේවූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාව විසින්, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කුමක් වුවද, බැංකු ව්‍යාපාරය කරගෙන යන යම් ව්‍යවසායකට, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නාවූ තැනැත්තන් එහි ගනුදෙනු කරුවන් වශයෙන් බඳවා ගැනීමට සහ එම තැනැත්තන්ගෙන් ජංගම ගිණුම් මත හෝ අන්‍යාකාරයකින් තැන්පතු භාර ගැනීම පිණිස බලය දීමට කොමිෂන් සභාවට බලය ඇත්තේය.

(2) (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන ගනුදෙනු කරුවන්ගේ රහස් අංක යොදන ලද බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීමට, කොමිෂන් සභාව විසින් එවැනි යම් බැංකු ආයතනයකට බලය දිය හැකිය.

(ආ) එම බලය දෙනු ලැබූ අවස්ථාවක රහස් අංක යොදන ලද ගිණුමේ අනන්‍යතාව ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ යම් විදේශීය ආණ්ඩුවක යම් අධිකරණයකට, ආයතනයකට, අස්තිත්වයකට, දෙපාර්තමේන්තුවකට, නිලධරයකුට, අනුයෝජිතයකුට, නියෝජිතයෙකුට, හෝ වෙනත් යම් නෛතික පුද්ගලයකුට හෝ තැනැත්තකුට සම්පූර්ණයෙන්ම අලංඝනීය විය යුතුය: තවද, ඒ අනුව ඒ ගිණුම්වලට අදාළ යම් තොරතුරක් අනාවරණය කරන්නා වූ යම් තැනැත්තකු

වරදක් කරන අතර, දිසා අධිකරණයක් ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට එම අධිකරණයේ සාමාන්‍යඅධිකරණ බලය නොතකා අවුරුදු පහක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කරනු ලැබීම හා ඒ දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතුය.

(3) මේ වගන්තියේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ බැංකු ආයතනය විසින් භාරගන්නා ලද සියලු තැන්පතු ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නොවන වෙනත් ව්‍යවහාර මුදල්වලින් විය යුතුය.

27. (1) බල ප්‍රදේශය තුළ රේගු කාර්යාල පිහිටුවනු ලැබීමට කොමිෂන් සභාව විසින් අවසර දියයුතු අතර ස්වකීය රාජකාරිය අනුව බල ප්‍රදේශය තුළ හෝ එහි පරිමිතියෙහි යම් රේගු නිලධරයන්ගේ පැමිණ සිටීම අවශ්‍ය වන්නේ ද ඒ රේගු නිලධරයන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුතුය. කොමිෂන් සභාව විසින් අවශ්‍ය අවස්ථාවක යම් ප්‍රාදේශීය ව්‍යවසායක හෝ බලපත්‍ර ලත් ව්‍යවසායක භූමිය ඇතුළත ඒ හා සමාන පහසුකම් සැලැස්විය යුතුය.

(2) (අ) කොමිෂන් සභාව සමග එළඹුණු ගිවිසුම යටතේ එහි ඇතුළත් නියම වලට හා කොන්දේසි වලට යටත්ව බලය දෙනු ලැබ ඇත්නම් මිස යම් ප්‍රාදේශීය ව්‍යවසායක් හෝ බලපත්‍ර ලත් ව්‍යවසායක් විසින් තොග හෝ සිල්ලර වෙළඳාමක් පවත්වාගෙන යා නොයුතුය.

(ආ) කොමිෂන් සභාව සමග එළඹුණු ගිවිසුමේ නියමයන්ට අනුකූල නොවන කවර හෝ ආකාරයකින් එවැනි යම් ව්‍යවසායක භූමියෙන් පිටතට ගෙන යනු ලබන්නා වූ යම් භාණ්ඩ, බඩු හෝ වෙළඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර රාජ්‍ය සන්තක කිරීම, දණ්ඩනවලට සහ වැරදිවලට අදාළ විධිවිධානද ඇතුළත් රේගු ආඥාපනතේ විධිවිධාන එම භාණ්ඩ, බඩු හෝ වෙළඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාල විය යුතුය.

28, (1) කොමිෂන් සභාවේ කාර්ය අතුරෙන් යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය වන්නා වූ අවස්ථාවක ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව කොමිෂන් සභාව සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි අතර ඒ පනතේ විධිවිධාන, මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව අත්කර ගැනීමේ කාර්ය සඳහා අදල විය යුතුය. ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා එම ඉඩම හෝ එහි සම්බන්ධතාව පොදු කාර්යයක් සඳහා අවශ්‍යවන්නේ යයි සලකනු ලැබිය යුතුය.

(2) එවැනි යම් අත්කර ගැනීමක් සම්බන්ධයෙන් මේ පනතේ 4 වන වගන්තිය ක්‍රියාත්මක වන දිනයෙහි සිට ආරම්භ වන්නාවූ අවුරුදු පහක කාලය ඇතුළත යම් අවස්ථාවකදී ඉඩම් අත්කර ගැනීමේ පනතින් නියමිත පරිදි ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව අත්කර ගැනීමේ අදහස පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළකර ඇති අවස්ථාවක, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළඳ වටිනාකම, 1977 ජූලි මස 22 වන දිනයෙන් පසු ඒ ඉඩමෙහි යම් වැඩි දියුණු කිරීමක් කරන ලද නම්, ඒ වැඩි දියුණු කිරීම සඳහා සාධාරණ මුදලක් එකතු කරන ලද එදින ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වූ වෙළඳ වටිනාකම වශයෙන් සලකනු ලැබිය යුතුය.

29. යම් ප්‍රාදේශීය ව්‍යවසායක් හා කොමිෂන් සභාව හා අතර එළඹුණු ගිවිසුමෙහි අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස මෙහි පහත දක්වා ඇති නීතිවල විධිවිධාන යම් ප්‍රාදේශීය ව්‍යවසායකට හෝ බලපත්‍ර ලත් ව්‍යවසායකට හෝ අදාළ නොවිය යුතුය.

(අ) 1971 අංක 35 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත :සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත.

## ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 10 දරන බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් (විශේෂ විධිවිධාන) පනත

(සහතිකය සටහන් කළේ 1978 අප්‍රේල් මස 11 වන දින)

ශ්‍රී ලංකාව සාමාජිකයකු වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගිවිසුමේ කොන්දේසි වලට වැඩිදුර සංශෝධන පිළිගැනීම සඳහා වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ තීරණය බලගැන්වීම හා ක්‍රියාත්මක කිරීම පිණිස බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් පනත හා මුදල් නීති පනත සංශෝධනය කිරීම මගින් අවශ්‍ය නෛතික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සාමාජිකයකු වන හෙයින්ද අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසිවල සන්දර්භය, එවැනි සාමාජිකයෙකු වීමට ශ්‍රී ලංකාවට හිමිකම් ලබාදුන් (424 වන අධිකාරය වූ) බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් පනත සම්මත වීමට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ හෙයින්ද;

මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් පදනම් කර ගත් පහසුකමක් ඇති කිරීම පිණිස, අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසි සංශෝධනය කරන ලද හෙයින්ද, ශ්‍රී ලංකාවට ඒ සංශෝධනය පිළිගැනීමට හැකි කරවූ 1969 අංක 2 දරන බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් (විශේෂ විධිවිධාන) පනත සම්මතවීමට පෙර ඒ සංශෝධනයේ සන්දර්භය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ හෙයින්ද;

නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් පිහිටුවීම පිණිසත් එහි මෙහෙයවුම් සහ ගනුදෙනු පොදු අංශයක් සහ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයක් පවත්වාගෙන යාම මගින් ක්‍රියාත්මක කිරීම පිණිසත් මුල් කොන්දේසි වලට (මේ පූර්විකාවෙහි "යෝජිත සංශෝධන" යනුවෙන් සඳහන් කරනු ලබන) වැඩිදුර සංශෝධන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පාලක මණ්ඩලය විසින් යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබ ඇති හෙයින්ද;

යෝජිත සංශෝධන ඇතුළත් කරනු ලැබූ අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල සන්දර්භය වර්ෂ 1978 ක්වූ අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ හෙයින්ද;

පිහිටුවීමට අදහස් කර ඇති නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයට සහභාගි වීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හැකිවන පරිදි යෝජිත සංශෝධන පිළිගැනීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව තීරණය කර ඇති හෙයින්ද;

එම තීරණය සම්පූර්ණයෙන් බලගැන්වීම හා ක්‍රියාත්මක කිරීම පිණිස මෙහි මින් මතු දක්වා ඇති විධිවිධාන සැලැස්වීම අවශ්‍යවන හෙයින්ද;

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 10 දරන බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සවකීය අත්සන යටතේ වූ සාධන පත්‍ර මගින් මූල්‍ය අරමුදල වෙත —

(අ) නව මූල්‍ය ක්‍රමයක් පිහිටුවීම සහ වෙනත් ඇතැම් වෙනස්කම් ඇති කිරීම පිණිස, ඒ අරමුදලේ ගිවිසුම් කොන්දේසි වලට යෝජනා කර ඇති (වර්ෂ 1978 ක් වූ අප්‍රේල් මස 4 වැනි දින ජාතික රාජ්‍ය සභාවේ සභාගත කරනලද අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල සන්දර්භයට ඇතුළත් කළ සංශෝධනය වන) සංශෝධනය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිළිගෙන ඇති බව ප්‍රකාශ කෙරෙන පිළිගැනීමේ සාධන පත්‍රයක්; සහ

(ආ) එවැනි සංශෝධනයක් පිළිගැනීමේ හේතුවෙන් ඇති වන සියලු බැඳීම් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් එහි නීතියට අනුකූලව භාර ගන්නා බව ද ඒ සියළු බැඳීම් ඉටුකිරීම සහ ඒවා නිදහස් කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන ඇති බව ද ප්‍රකාශ කෙරෙන සාධන පත්‍රයක්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් තැන්පත් කිරීමට බලය එම සාධන පත්‍රවල නම් කරනු ලැබූ යම් තැනැත්තකු වෙත පැවරීමට ජනාධිපතිවරයාට මෙයින් බලය දෙනු ලැබේ.

3\. මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම් පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :-

''ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට දයක මුදල

3\. (1) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් හෝ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් මගින් හෝ අරමුදල විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ගෙවනු ලැබිය යුතු ශ්‍රී ලංකාවේ දයක මුදල් කොටස, අරමුදලේ ගිවිසුමේ III වන කොන්දේසියේ 1 වන සහ 4 වන වගන්තිවල විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(2) ශ්‍රී ලංකාව සඳහා නියමිත ප්‍රමාණය වැඩි කිරීමේ හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ශ්‍රී ලංකාවේ දයක මුදල වැඩි කරනු ලැබූ අවස්ථාවක, ඒ දයක මුදලේ වැඩි කරන ලද ප්‍රමාණය, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් හෝ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් මගින් හෝ අරමුදල විසින් නිශ්චය කරනු .ලබන වෙනත් යම් ව්‍යවහාර මුදලකින් හෝ ගෙවීම සඳහා අරමුදල් ගිවිසුමේ III වන කොන්දේසියේ 3 වන වගන්තිය යටතේ අවශ්‍ය විය හැකි මුදල් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(3) පොලී නොදරන සහ ගනුදෙනු කළ නොහැකි නෝට්ටු හෝ වෙනත් බැඳීම් අරමුදල් ගිවිසුමේ III වන කොන්දේසියේ 4 වන වගන්තිය යටතේ අරමුදල විසින් භාර ගැනීම නිසා නොවේනම් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ආපසු ගෙවනු ලැබිය යුතු ශ්‍රී ලංකාවේ දයක මුදලේ යම් කොටසක් වෙනුවෙන් අරමුදල විසින් එම වගන්තිය යටතේ භාර ගැනීමට තීරණය කරනු ලබන යම් පොලී නොදරන සහ ගනුදෙනු කළ නොහැකි නෝට්ටු හෝ වෙනත් බැඳීම්, තමා සුදුසුයයි කල්පනා කරන අන්දමකින් ඇති කොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පොදු සම්පත් ගිණුමට නිකුත් කිරීමේ බලය ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයාට මෙයින් දෙනු ලැබේ.''

4\. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

''ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කරනු ලබන වෙනත් ගෙවීම්

4\. (1) ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින්-

(අ) (සාමාජිකයන්ගේ ව්‍යවහාර මුදල්වල විනිමය අගයෙහි වෙනස්වීම් වලට අදාළ) අරමුදල් ගිවිසුමේ V කොන්දේසියේ 11 වන වගන්තිය යටතේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පොදු සම්පත් ගිණුමට ගෙවිය යුතු සියලු මුදල්;

(ආ) අරමුදල් ගිවිසුමේ XIII වන කොන්දේසියේ 3 වන වගන්තියේ නියමිත රක්ෂණය, එනම් එකී කොන්දේසිය යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නාමෝදිෂ්ට තැන්පත්කරු විසින් ගෙවීමට අපොහොසත් වීමේ හෝ ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් සිදුවන අලාභවලට එරෙහිව අරමුදලේ වත්කම් රක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල්;

(ඇ) මේ පනත යටතේ ඇති කර, අරමුදලේ පොදු සම්පත් ගිණුමට නිකුත් කරන ලද යම් නෝට්ටු හෝ බැඳීම් නිදහස් කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල්;

(ඈ) (අරමුදලින් සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීමට අදාළ) අරමුදල් ගිවිසුමේ ''ඒ'' උපලේඛනය යටතේ හෝ (අරමුදල ඈවර කිරීමට අදාළ) එහි ''ඕ'' උපලේඛනය යටතේ අරමුදලට හෝ එහි යම් සාමාජිකයකුට ගෙවීමට නියමිත යම් වන්දියක්;

(ඉ) මහ බැංකුව විසින්, අරමුදල් ගිවිසුමේ XVI වන කොන්දේසියේ 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් ගෙවන ලද සහ අරමුදල් ගිවිසුමේ XX වන කොන්දේසියේ 4 වන වගන්තිය යටතේ ගෙවිය යුතු ලෙස තක්සේරු කරන ලද සියලු මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවට;

(ඊ) (මුදල් ලබා ගැන්මේ විශේෂ අයිතිවාසිකම් අංශය ඈවර කිරීම පරිපාලනය කිරීමට අදාළ) අරමුදල් ගිවිසුමේ "එ" උප ලේඛනයේ 8 වන වගන්තිය යටතේ ඒ අරමුදලේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයේ යම් සහභාගී වන්නකුට ශ්‍රී ලංකාව විසින් ගෙවීමට නියමිත හෝ ගෙවීමට බැඳී සිටින යම් වන්දියක්; සහ

(උ) ඒ අරමුදලෙහි මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයේ සහභාගිවන්නකු ලෙස ස්වකීය බැඳීම් ඉටු කිරීම පිණිස ඒ අරමුදලට හෝ එහි යම් සාමාජිකයකුට ගෙවීමට ශ්‍රී ලංකාවට නියමිත හෝ ශ්‍රී ලංකාව බැඳී සිටින, (ඊ) ඡේදයෙහි සඳහන් වන්දි ස්වභාවයේ මුදල් නොවන සියලු මුදල් ගෙවනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන්, අරමුදල් ගිවිසුමේ යම් විධිවිධානයන් යටතේ අරමුදලට ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ යම් ව්‍යවහාර මුදලක් වෙනුවට භාර ගැනීමට අරමුදල් ගිවිසුමේ III වන කොන්දේසියේ 4 වන වගන්තිය යටතේ අරමුදල විසින් තිරණය කරනු ලබන යම් පොලී නොදරන සහ ගනුදෙනු කළ නොහැකි නෝට්ටු හෝ වෙනත් බැඳීම් ආණ්ඩුව වෙනුවෙන් ඇති කර, පොදු සම්පත් ගිණුමට නිකුත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා කල්පනා කරන්නේනම් ඔහු විසින් ඔහු සුදුසුයයි කල්පනා කරන අන්දමකින් එසේ කරනු ලැබිය හැකිය."

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි, (1969 අංක 2 දරන පනතින් ඇතුළත් කරන ලද) 8 "අ" වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයේ මෙහෙයවුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ විශේෂ විධිවිධාන

8අ. (1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම අත්කර ගැනීමට, දැරීමට මෙහෙයවීමට නැතහොත් ඒවා සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවට-

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම සම්බන්ධයෙන් අරමුදල් ගිවිසුමේ XX වන කොන්දේසියේ 2 වන වගන්තිය යටතේ ඒ අරමුදලට ගෙවිය යුතු ගාස්තු කිසිවක් ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු මුදල් ගෙවීමට;

(ආ) එකී XX වන කොන්දේසියේ 1 වන වගන්තිය යටතේ එවැනි මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඒ අරමුදල විසින් ගෙවියයුතු පොලිය ලබාගෙන ස්වකීය අරමුදලට බැර කිරීමට

මෙයින් බලය දෙනු ලැබේ".

6. 8 අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8ආ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

"ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පොදු සම්පත් පරිහරණය සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන

8ආ. ශ්‍රී ලංකා මහ බැංකුවට-

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඒ අරමුදලෙහි සාමාජිකයකු විසින් මිලට ගන්නා ලද ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලෙහි ශේෂයන් අරමුදල් ගිවිසුමේ V වන කොන්දේසියේ 3(ඉ) වන වගන්තිය අනුව ශ්‍රී ලංකාව විසින් තෝරාගන්නා ලද නිදහස්ව පරිහරණය කළ හැකි ව්‍යවහාර මුදලක් සඳහා ඒ මිලට ගත් අවස්ථාවේ දී හුවමාරු කළ හැකි බවට වගබලා ගැනීම පිණිස; සහ

(ආ) අරමුදලින් ස්වකීය ව්‍යවහාර මුදල් මිලට ගන්නා අරමුදලේ යම් සාමාජිකයකුට අරමුදල් ගිවිසුමේ V වන කොන්දේසියේ 7 (ඒ) වන වගන්තිය අනුව, ශ්‍රී ලංකාව විසින් තෝරා ගන්නා ලද නිදහස්ව පරිහරණය කළ හැකි ව්‍යවහාර මුදලක් සඳහා නැවත මිලට ගන්නා අවස්ථාවේදී හුවමාරුව පිණිස (නැවත මිලට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අරමුදල විසින් නිශ්චිතව දක්වා ඇත්නම්) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ලබා ගත හැකි බවට වගබලා ගැනීම පිණිස

පියවර ගැනීමට මෙයින් බලය දෙනු ලැබේ".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (1969 අංක 2 දරන පනතින් ඇතුළත් කරන ලද) 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථකථනයට ඉහතින්ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :-
"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනතේ 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ; තවද,

(ආ) "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්: —

"අරමුදල් ගිවිසුම" යන්නෙන්-

(අ) මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් (එහි සන්දර්භය 1968 නොවැම්බර් මස 23 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තබන ලදී.) පදනම් කරගත් පහසුකමක් ඇති කිරීම පිණිස; සහ

(ආ) නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් පිහිටුවීම (එම සංශෝධනය වර්ෂ 1978 ක්වූ අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරන ලද ගිවිසුමේ කොන්දේසිවල සන්දර්භයෙහි ඇතුළත් කරන ලදී.) පිණිස

මුලින් සම්මත කරනු ලැබ තදනන්තරව සංශෝධනය කරනු ලැබුවා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගිවිසුමේ කොන්දේසි අදහස් වේ.'

8. මුදල් නීති පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ පනතේ 3 වන වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය අදේශ කිරීමෙන්:-

"රුපියලේ මුල් අගය

3. (1) මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අනුව හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරනු ලබන වෙනත් පොදු වටිනාකමක් අනුව හෝ ශ්‍රී ලංකා රුපියලේ මුල් අගය තීරණය කළ යුතු යයි මුදල් මණ්ඩලය විසින් ඒකමතික තීරණයක් මගින්, අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ යුතු අතර එසේ නිර්දේශ කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් ඒ නිර්දේශයේ සඳහන් නියමයන්ට අනුකූලව, ශ්‍රී ලංකා රුපියලේ මුල් අගය ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් තීරණය කොට, ප්‍රකාශයට පත් කළ යුතුය:

එසේ වුවද, නිත්‍ය එහෙත් සමායෝග කළ හැකි මුල් අගයන් මත පදනම් වූ විනිමය වැඩ පිළිවෙලවල් ආරම්භ කිරීම හෝ පවත්වාගෙනයාම, ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් අනුව නුවුවමනා බව මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම තීරණයක් නොකළ යුතු යයි හෝ මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කළ යුතු යයි යනුවෙන් මුදල් මණ්ඩලය විසින් ඒකමතික තීරණයක් මගින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි අතර එවැනි යම් නිර්දේශයක් කරන ලද විට, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ නියමයක් කිරීමෙන් වැළකී සිටීම හෝ මේ වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කළ යුතුය.

(2) පහත සඳහන් අවස්ථානුගත කරුණු යටතේ, ශ්‍රී ලංකා රුපියලේ මුල් අගය වෙනස් කිරීම අවශ්‍යවන බව මුදල් මණ්ඩලයේ මතය වන්නේ නම්, එසේ ශ්‍රී ලංකා රුපියලේ මුල්අගය වෙනස් කරන ලෙස මුදල් මණ්ඩලය විසින් ඒකමතික තීරණයක් මගින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකිය. එකී අවස්ථානුගත කරුණු නම්—

(අ) පවත්නා මුල් අගය දිගටම පවත්වාගෙන යාම නිසා, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය, සේවා නියුක්තිය හා නියම ආදායම පිළිබඳව උසස් මට්ටමක් සහ නිෂ්පාදන සම්පත්වල පූර්ණ වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමට හා පවත්වා ගෙනයාමට බාධාවක් වේනම් හෝ අනිසි ලෙස බාධාවක් වීමට ඉඩ ඇත්තේ නම් නැතහොත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් උපයෝගී බාහිර වත්කම්වල දරුණු පහත වැටීමකට හේතුවේ නම් හෝ හේතු වීමට ඉඩ ඇත්තේ නම් හෝ ඒ පහත වැටීම–

(i) ශ්‍රී ලංකාවේ බාහිර බැරකම් විශාල පරිමාණයකින් වැඩි කිරීමෙන්; හෝ

(ii) ප්‍රවර්තන ගනුදෙනු සමථයකට පත් කිරීමෙහි ලා විදේශ ව්‍යවහාර මුදල් බවට රුපියල පරිවර්තනය කිරීම පිළිබඳ සීමා කිරීම් නිතර නිතර යොද ගැනීමෙන්; හෝ

(iii) ප්‍රධාන අපනයන කාර්මික ව්‍යාපාර එකකට හෝ වැඩි ගණනකට අනිසි හෝ අඛණ්ඩව දෙනු ලබන ආණ්ඩුවේ ආධාර මගින් ; හෝ

(iv) අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමේ ප්‍රමාණය සීමා කිරීමට සැලසුම් කරන ලද පියවර දිගට ම අනුගමනය කිරීමෙන්

හැර, වළක්වනු ලැබිය නොහැකි නම්; හෝ

(ආ) පවත්නා මුල් අගය පවත්වා ගෙන යාම නිසා, ප්‍රවර්තන ගිණුමේ ගෙවුම් ශේෂයේ දිගටම පවත්නා අතිරික්තයක් හා මේ පනතින් බලය දෙන ලද ආණ්ඩුවේ වෙනත් ක්‍රියාවකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාවකින්, ප්‍රමාණවත් ලෙස නිවැරදි කළ නොහැකි මූල්‍ය අසමතුලිත භාවයක් බිහි කරයි නම් හෝ බිහි කිරීමට ඉඩ ඇත්තේ නම්; හෝ

(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයන්ගේ ව්‍යවහාර මුදල්වල මුල් අගයෙහි ඒකාකාර සමානුපාතික වෙනස්කම් ඒ මූල්‍ය අරමුදල විසින් කරනු ලැබේ නම්,

එවැනි නිර්දේශ මත, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන යම් නියමයක් මගින් ඒ නිර්දේශවල නිශ්චිත නියමයන් අනුව සංශෝධනය කරනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උප වගන්තිය හෝ යටතේ කරන ලද යම් නියමයක් එය පල කරනු ලැබූ දිනයෙහි සිට දින දහයක කාල සීමාවකින් පසුව, ඒ කාලසීමාව ඇතුළත ජාතික රාජ්‍ය සභාව විසින් ඒ නියමය අනුමත කරනු ලැබුවහොත් මිස, වලංගුව බල පැවැත්වීම අවසන් විය යුතුය:

එසේ වුවද, නියමය පළ කරනු ලැබූ දිනයෙහි ජාතික රාජ්‍ය සභාවේ සභාවාර නොපැවතුනි නම්, ජාතික රාජ්‍ය සභාව ඊළඟට රැස්වන දිනයෙහි සිට දින දහයක කාල සීමාවකින් පසුව, ඒ කාලසීමාව ඇතුළත ජාතික රාජ්‍ය සභාව විසින් ඒ නියමය අනුමත කරනු ලැබුවහොත් මිස, ඒ නියමය වලංගුව බල පැවැත්වීම අවසන් විය යුතුය''.

(2) ඒ පනතේ 5 වන වගන්තියෙහි —

(1) ඒ වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්: —

''(ආ) ශ්‍රී ලංකා රුපියලෙහි මුල් අගය සම්බන්ධයෙන් තීරණයක් කර ඇත්නම්, ශ්‍රී ලංකා රුපියලෙහි මුල් අගය රැක ගැනීම සහ ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු සඳහා රුපියල් නිදහස් ලෙස පරිහරණය කිරීම;''

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්; —

''(ආආ) ශ්‍රී ලංකා රුපියලෙහි මුල් අගය සම්බන්ධයෙන් තීරණයක් කර නොමැති නම් විදේශීය ව්‍යවහාර මුදල් වලට අදාලව ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය අනුපාතිකයේ ස්ථායිතාව රැක ගැනීම;''

(3) ඒ පනතේ 65 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් ; —

ජාත්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්තිය තිරණය කිරීම පාලනය කරන මූලධර්ම

**65** ස්වකීය ජාත්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේදී මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රුපියලෙහි මුල් අගය පවත්වා ගෙන යාමට උත්සාහ දැරිය යුතුය; නැතහොත්, 3 වන වගන්තිය යටතේ ඒ මුල් අගය පිළිබඳව තීරණයක් කර නොමැති අවස්ථාවක, රටේ පවත්නා සංකල්පනා වලට අනුරූප වන් අන්දමේ විනිමය වැඩ පිළිවෙළවල් පවත්වා ගෙන යා යුතු අතර ඒ අනුව ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු සඳහා එය නිදහස් ලෙස පරිහරණය කිරීම සහතික වන පරිදි එහි විනිමය වෙනත් ව්‍යවහාර මුදල් සමග ගැලපිය යුතුය.''.

(4) ඒ පනතේ 66 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන්: —

'' (2) ජාත්‍යන්තර සංචිතයේ ප්‍රමාණවත් භාවය පිළිබඳව නිශ්චය කිරීමේදී ශ්‍රී ලංකාවට ලැබේ යයි සහ ශ්‍රී ලංකාව විසින් ගෙවනු ලැබේ යයි අපේක්ෂා කරනු ලබන විදේශ විනිමය පිළිබඳ ඇස්තමේන්තුවලින්ද, ශ්‍රී ලංකා මහ බැංකුවේම, විදේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ බැරකම්වල ප්‍රමාණය සහ පරිණතවීම මගින් ද දන්නා පමණින් හෝ ඇස්තමේන්තු කළ හැකිතාක් දුරට ආණ්ඩුවේ සහ බැංකු ආයතනවලද ශ්‍රී ලංකාවේ වෙනත් තැනැත්තන්ගේ ද විදේශ විනිමය වත්කම්වල හා බැරකම්වල ප්‍රමාණය හා පරිණතවීම මගින්ද මුදල් මණ්ඩලය මෙහෙයවනු ලැබිය යුතුය. ශ්‍රී ලංකාවේ විදේශීය ව්‍යවහාර මුදල් වත්කම්වලින් යම් කොටසක්, මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම්වලට හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරනු ලබන වෙනත් පොදු අගයකට හෝ ජාත්‍යන්තර ගනුදෙනු වලදී නිදහස් ලෙස පරිහරණය කළ හැකි හෝ ඇවුරුණු හෝ විදේශීය ව්‍යවහාර මුදල්වලට හෝ කෙළින්ම නැතහොත් අන්‍යාකාරයකින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිදහස් ලෙස පරිවර්තනය කරනු නො ලැබිය හැකි ව්‍යවහාර මුදල්-වලින් දරනතාක් කල්, එම කරුණද මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ ප්‍රමාණවත් භාවය නිශ්චය කිරීමේ දී සැලකිල්ලට ගත යුතුය'';

(5) ඒ පනතේ 67 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (iii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(iii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් අංශයෙන් දරනු ලබන එවැනි මුදල් ලබා ගැනීමේ අයිතිවාසිකම්වල, මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට සම්පූර්ණ ප්‍රමාණය හෝ සම්පූර්ණ ප්‍රමාණයෙන් උපරිම සියයට ප්‍රමාණය";

(6) ඒ පනතේ 69 වන වගන්තිය ඉවත් කිරීමෙන්;

(7) ඒ පනතේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු වෙනුවෙන් ගෙවීම් කිරීමේ කාර්යය සඳහා මුදල් මණ්ඩලයේ මතය අනුව එම ව්‍යවහාර මුදල් සඳහා නියත හෝ බලාපොරොත්තු සහගත ප්‍රමාණවත් ඉල්ලීමක් ඇතහොත් මිස නැතහොත්.එවැනි ව්‍යවහාර මුදලක් අත්කර ගැනීම ජාතික යහපත උදෙසා වන බවට අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් මිස, මුදල් ලබා ගැනීමේ විශේෂ අයිතිවාසිකම් වලට හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරනු ලබන වෙනත් පොදු වටිනාකමකට හෝ ජාත්‍යන්තර ගනුදෙනු-වලදී නිදහස් ලෙස පරිහරණය කළ හැකි විදේශීය ව්‍යවහාර මුදල්වලට හෝ කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිදහස් ලෙස පරිවර්තනය කරනු නොලැබිය හැකි යම් ව්‍යවහාර මුදලකින් විදේශ විනිමය මිලට ගැනීමට මේ උප වගන්තියෙහි ඉහතින් වූ විධිවිධාන කිසිවකින් ඒ බැංකුවට නියම කරනු නොලැබිය යුතුය.";

(8) ඒ පනතේ 73 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සාමාජිකයකු නොවන රටක ව්‍යවහාර මුදලට රුපියල සමග ජාත්‍යන්තර වෙළෙඳ පොළවල ඒ ව්‍යවහාර මුදල සඳහා වූ විනිමය අනුපාතිකවල පදනම මත ගණන් බලනු ලැබූ සම අගයක් තිබිය යුතුය; තවද ජාත්‍යන්තර වෙළෙඳ පොළවල දක්වා ඇති අනුපාතික අතර අපසරණයක් ඇත්තේ නම් සම අගය තීරණය කිරීම පිණිස කවර අනුපාතිකයන් උපයෝග කරගත යුතු දැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ය.";

(9) ඒ පනතේ 74 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) විදේශීය නෝට්ටු සහ කාසි මිලට ගැනීම සහ විකිණීම සඳහාවූ අනුපාතික සම්බන්ධයෙන් හැර, අත්පිට ගනුදෙනු සඳහා (1) වන උපවගන්තිය යටතේ තීරණය කරන ලද අනුපාතික, 73 වන වගන්තිය යටතේ තීරණය කරන ලද නෛතික සම අගයන්ගෙන් සියයට හතර හමාරකට වැඩියෙන් වෙනස් නොවිය යුතුය. විදේශීය නෝට්ටු සහ කාසි මිලට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන්, එම ගනුදෙනුවල හෝ ඒවාට ආනුෂංගික අතිරේක වියදම් පිළිබඳ මණ්ඩලය විසින් සැලකිල්ල දැක්විය හැකිය."

(10) ඒ පනතේ 76 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) වාණිජ බැංකු විසින් අත්පිට විනිමය, මිලට ගනු ලැබිය හැකි අවම අනුපාතිකය සහ අත්පිට විනිමය ඒ බැංකු විසින් විකුණනු ලැබිය හැකි අවම අනුපාතිකය මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය. මුදල් මණ්ඩලය විසින් 73 වන වගන්තිය අනුව, ව්‍යවහාර මුදලක නෛතික සම අගය සහතික කර තිබෙන අවස්ථාවක, එම ව්‍යවහාර මුදල සඳහා ස්ථාපිත උපරිම සහ අවම විනිමය අනුපාතික එම සම අගයෙන් සියයට හතර හමාරකට වැඩියෙන් වෙනස් නොවිය යුතුය."; තවද

(11) ඒ පනතේ 79 වන වගන්තියෙහි—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) මුදල් ලබාගැනීමේ විශේෂ අයිතිවාසිකම් වලට හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරන ලද වෙනත් පොදු වටිනාකමකට හෝ විදේශීය ගනුදෙනු වලදී නිදහස් ලෙස පරිහරණය කරනු ලැබිය හැකි විදේශීය ව්‍යවහාර මුදල්වලට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ නිදහස් ලෙස පරිවර්තනය කරනු ලැබිය හැකි වූද ශ්‍රී ලංකා රුපියලට අදාළව ඒ විදේශීය ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියලෙහි මුල් අගයෙහි හෝ නෛතික සම අගයන්හි හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතිකවල වෙනස්වීම් වලින් උද්ගතවන්නාවූ ද, බැංකු ආයතනවල විදේශීය ව්‍යවහාර මුදල්වල ශුද්ධ වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ඒ බැංකු විසින් ලබා ගන්නා ලද යම් ප්‍රතිප්‍රමාණ කිරීමේ ලාභ හෝ ඒ බැංකු විසින් දරන ලද යම් ප්‍රතිප්‍රමාණ කිරීමේ අලාභ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුළුමනින්ම භාරගෙන ඒ අනුව ඒවා හර කිරීම හෝ බැර කිරීම කරනු ලැබිය යුතුය."; තවද,

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"බැංකු ආයතන විසින් දරනු ලබන විදේශ විනිමය දැරීම් සම්බන්ධයෙන් ප්‍රතිප්‍රමාණ කිරීමේ ලාභ සහ අලාභ."

---

## ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 13 දරණ මෝටර් රථ (පැවරීමේ බද්ද) පනත

(සහතිකය සටහන් කළේ 1978 මැයි මස 11 වන දින)

**ඇතැම් මෝටර් රථ පැවරීම සම්බන්ධයෙන් බද්දක් නියම කොට අය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 13 දරන මෝටර් රථ (පැවරීමේ බද්ද) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ පනත අදළවන මෝටර් රථයක පළමු ලියා පදිංචි අයිතිකරුවන කිසිම තැනැත්තකු විසින්, රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමතිය ඔහු ලියවිල්ලකින් ලබා ගතහොත් මිස ඒ මෝටර් රථය පළමුවෙන් ලියා පදිංචි කළ දිනයෙහි සිට අවුරුදු හතක කාලයක් ඇතුළත පැවරීම නොකළ යුතුය:

එසේ වුවද ඒ මෝටර් රථය විකිණීම සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනතේ 110 වන වගන්තියෙහි නිශ්චිත ආකාරයට ගණන් බලන ලද මුදලක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවා ඇත්නම් මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් මේ පනත අදළ වන මෝටර් රථයක පළමු ලියාපදිංචි අයිතිකරුවකුට අදළ නොවිය යුතුය:

එසේම තවදුරටත් මේ පනත අදළවන මෝටර් රථයක පළමු ලියාපදිංචි අයිතිකරු විසින් මේ පනත ආරම්භ වන දිනයට පෙර එම මෝටර් රථය විකිණීමකින් නොවන අන් ආකාරයකින් පවරනු ලැබීම මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවකින් වැළැක්වෙන ලෙස කියවා අර්ථ නිරූපණය කිරීම නොකළ යුතුය.

(2) මේ පනත අදළ වන මෝටර් රථයක් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් කරන පැවරීමක්, ඒ පැවරීම මේ පනත ආරම්භ වන දිනට පෙර හෝ පසුව සිදු වුව ද අවලංගු සහ බලරහිත වන අතර ඒ පැවරීමම නීතියෙහි ලා කිසිදු බලපෑමක් නොතිබිය යුතුය.

3. මේ පනත අදාළ වන මෝටර් රථයක පළමු ලියාපදිංචි අයිතිකරුවන යම් තැනැත්තකු විසින්, ඉල්ලුම් පත්‍රයෙහි, යෝජිත පැවරුම්ලාභී ලෙස නිශ්චිත තැනැත්තා වෙත එම මෝටර් රථය පැවරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතිය සඳහා වූ ඉල්ලීමක් ඒ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් සපයනු ලබන ආකෘතියක ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, මේ පනත අදාළ වන මෝටර් රථයක පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු අදාල බද්ද, යෝජිත පැවරුම්ලාභී ලෙස ඒ ඉල්ලුම් පත්‍රයෙහි නිශ්චිත තැනැත්තා විසින් ගෙවනු ලැබුවහොත් සහ ගෙවනු ලැබුවහොත් පමණක් රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමතිය දිය යුතුය.

4. මේ පනත අදාළ වන මෝටර් රථයක පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන අදාළ බද්ද—

(අ) ඒ මෝටර් රථයේ තාරබර හොණ්ඩර දහ හතක් නොඉක්මවන්නේ නම් රුපියල් පන්දහසක්; සහ

(ආ) ඒ මෝටර් රථයේ තාරබර හොණ්ඩර දහ හතක් ඉක්මවන්නේ නම් රුපියල් දස දහසක්;

විය යුතුය.

5. මේ පනත අදාළ වන මෝටර් රථයක් පැවරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතිය සඳහා 3 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් පිට, යෝජිත පැවරුම්ලාභී ලෙස ඒ ඉල්ලුම් පත්‍රයෙහි නිශ්චිතව සඳහන් තැනැත්තා විසින්, ඒ මෝටර් රථය පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන අදාළ බද්ද රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලබන අවස්ථාවක, ඒ බද්ද ගෙවන ලද්දේ යම් පැවරීමක් සම්බන්ධයෙන් ද ඒ පැවරීම ඇත්ත වශයෙන්ම සිදු නොවූ බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වුවහොත් රුපියල් පණහක මුදලක් අඩු කරන ලද ඒ බදු මුදල ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් පිට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය. ඒ මෝටර් රථය එම තැනත්තා වෙත පැවරීම සඳහා තමා විසින් දෙන ලද ලිඛිත අනුමැතිය රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ අවස්ථාවෙහි දී ම අවලංගු කළ යුතුය.

6. (1) මේ පනත අදාළ වන මෝටර් රථයක් 2 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කරන ලද පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඒ මෝටර් රථයේ සන්තකයෙහි වෙනසක් සිදු වී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මෝටර් රථයෙහි සන්තකය දරන (මේ වගන්තියෙහි "සන්තකය දරන තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන් ඒ මෝටර් රථය, එහි සන්තකය දරන තැනත්තා වෙත පැවරීම පිණිස පළමු ලියාපදිංචි අයිතිකරු විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතිය සඳහා 3 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තාක් මෙන් ඒ මෝටර් රථය පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන අදාළ බද්ද, ඒ බද්දෙන් සියයට විස්සකට සමාන මුදලක දඩයක් ද සමග, ඒ දැන්වීම ලැබුණු දිනයෙහි සිට මාස එකක කාලයක් ඇතුළත ගෙවන ලෙස නියම කළ හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ යවන ලද දැන්වීමක් සන්තකය දරණ තැනැත්තකු වෙත ලැබුණු දින සිට එක් මාසයක කාලයක් ඇතුළත ඒ දැන්වීමෙහි නියමයන්ට අනුව කටයුතු කිරීම ඔහු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ තැනත්තා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර එම දැන්වීමෙහි නිශ්චිත බද්ද ගෙවීම පැහැර හැර ඇති මුදලක් ලෙස සලකනු ලැබිය යුතුය. තවද ගෙවීම පැහැර හැර තිබෙන බදු මුදලෙහි විස්තර සහ ගෙවීම පැහැර හැරිය තැනත්තාගේ නම සහ පදිංචි ස්ථානය ඇතුළත් සහතිකයක් රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකිය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින්, ගෙවීම පැහැර හැර තිබෙන බදු මුදල අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව නඩු නොපැවරීමට හේතු දක්වනු

පිණිස ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවනු ලැබිය යුතුය. ප්‍රමාණවත් හේතු දක්වනු නොලැබුවහොත් ගෙවීම පැහැර හැර තිබෙන බදු මුදල, ඒ ගෙවීම පැහැර හරින්නාට ඒ මහෙස්ත්‍රාත්වරයා නියම කළ දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එය අයකර ගනු ලැබිය යුතුය. එසේ අයකර ගන්නා ලද මුදල රෙජිස්ට්‍රාර්වරයාවෙත ප්‍රේෂණය කළ යුතුය

(3) (1) වන උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමකට අනුව ක්‍රියාකරමින් සන්තකය දරණ තැනැත්තා විසින් අදාල බදු මුදල ගෙවනු ලබන අවස්ථාවක හෝ අදාළ බදු මුදල, (2) වන උප වගන්තිය යටතේ සන්තකය දරන තැනැන්තාගෙන් අයකර ගනු ලබන අවස්ථාවක, අවස්ථා- වෝචිත පරිදි එම බද්ද ගෙවන ලද්දේ හෝ අයකර ගන්නා ලද්දේ යම් මෝටර් රථයක් සම්බන්ධයෙන් ද එම මෝටර් රථයෙහි අයිතිකරු ලෙස මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ ලියා පදිංචි කරනු ලැබීම සඳහා හිමිකම ඒ තැනැත්තාට තිබිය යුතුය. එසේ ලියාපදිංචි කරනු ලැබූ විට, ඒ තැනැත්තාට සන්තකයෙහි මාරුවීම සිදුවූයේ කරන ලදැයි කියන යම් පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන්ද ඒ පැවරීම 8 වන වගන්තිය යටතේ නඩු පැවරීමක කාර්යය සඳහා හැර අනෙක් සියලු කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව කරන ලද පැවරීමක් ලෙස සහ එබඳු පැවරීමක්ව පැවති ලෙස සලකනු ලැබිය යුතුය,

(4) (2) වන උපවගන්තියේ සහ (3) වන උපවගන්තියේ කාර්ය සඳහා ''බද්ද'' යන යෙදුමට (1) වන උප වගන්තිය යටතේ නියම කරන ලද දඩයක් ද ඇතුළත් වන්නේය.

7, මේ පනත අදාළ වන මෝටර් රථයක අලුත් අයිතිකරු ලෙස මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබීමේ හිමිකම —

(අ) යම් තැනැත්තකු එසේ අලුත් අයිතිකරුවූයේ යම් පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන්ද ඒ පැවරීම රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ඇතිව කරන ලද බවට; නැතහොත්,

(ආ) එම තැනැත්තා එසේ අලුත් අයිතිකරු වූයේ යම් පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන්ද ඒ පැවරීම සඳහා, රෙජිස්ට්‍රාර්වයාගේ පූර්ව ලිඛිත අනුමතිය මේ පනතේ යම් විධි- විධානයක් යටතේ අවශ්‍ය නොවූනු බවට

රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් කරත හොත් මිස, කිසිම තැනැත්තකුට නොතිබිය යුතුය.

8. මේ පනත අදාළ වන මෝටර් රථයක පළමු ලියාපදිංචි අයිතිකරු වන යම් තැනැත්තකු 2 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් එම මෝටර් රථය පැවරුවේ යයි සැලකෙන අවස්ථාවක ඔහු මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට —

(අ) එම මෝටර් රථයේ තාරබර හොණ්ඩර දහ හතකට වැඩි නොවේ නම් රුපියල් හය දහසකට නොඅඩු දඩයකටද;

(ආ) එම මෝටර් රථයේ තාරබර හොණ්ඩර දහ හතකට වැඩි වෙයි නම් රුපියල් දෙලොස් දහසකට නොඅඩු දඩයකට ද ඔහු යටත්විය යුතුය.

9. මේ පනත අදාළ වන මෝටර් රථයක්, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරද 2 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ද විකිණීමක් මගින් පවරා ඇතැයි සැලකෙන අවස්ථාවක, එම මෝටර් රථයේ පළමු ලියාපදිංචි අයිතිකරු විසින්, ඔහු එම මෝටර් රථය පැවරුවේ යැයි සැලකෙන්නේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා වෙත එම මෝටර් රථය පැවරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතිය සඳහා මේ පනත ආරම්භ වීමෙන් පසු ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද නම්, ඒ මෝටර් රථය පවරනු ලැබී යයි සැලකෙන තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අදළ බද්දට සමාන මුදලක් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට මාස දෙකක් ඇතුළත යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබුව හොත් ඒ මෝටර් රථය රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව පවරා ඇති ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

**10.** මේ පනතේ විධිවිධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් එකතු කර ගනු ලැබූ සියලු බදු රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

**11.** 1963 අංක 11 දරන මුදල් පනතේ **X** වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

**12.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද මේ පනතෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය.

**13.** මේ පනතෙහි —

''මෝටර් රථය'' යන්නට මෝටර් වාහන පනතෙහි ඇති අර්ථයම විය යුතුය;

''මේ පනත අදාළවන මෝටර් රථය'' යන්නෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද මෝටර් රථයක් වන්නාවූද,මෝටර් වාහන පනතේ 31 වන වගන්තියේ (4) වන උපවගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් ආදායම් බලපත්‍රයක් නිකුත් කිරීමේදී බලපත්‍ර ගාස්තුව ගෙවනු නොලැබිය යුතු මෝටර් රථයක් නොවන්නාවූ ද 1970 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පසුව පළමු වරට ලියාපදිංචි කරන ලද මෝටර් රථයක් අදහස් වේ;

''රෙජිස්ට්‍රාර්වරයා'' යන්නෙන් මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර්වරයා හෝ මේ පනතේ කාර්ය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තෙක් හෝ අදහස් වේ;

''පැවරීම'' යන්න එහි ව්‍යාකරණානුකූල ප්‍රභේද හා සජාතීය යෙදුම් සමඟ මේ පනත අදාළ වන මෝටර් රථයක් සම්බන්ධයෙන් යෙදෙන විට එයට —

(අ) එවැනි මෝටර් රථයක් විකිණීමක හේතුවෙන් උද්ගත වන එම මෝටර් රථයේ සන්තකයෙහි වෙනස්වීමක්;

(ආ) මේ පනත ආරම්භ වන දිනයෙහි හෝ ඉන් පසුව —

(i) තෑගි දීමක හෝ උකස් කිරීමක හේතුවෙන් උද්ගත වන; හෝ

(ii) කිනම් ආකාරයකින් විස්තර කර ඇතද යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ මුදල හෝ මුදලෙහි වටිනාකම සැලකිල්ලට ගෙන

එම මෝටර් රථය සම්බන්ධයෙන් වූ සන්තකයෙහි වෙනස් වීමක් ඇතුළත් වේ.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 20 දරන අපනයන (විශේෂ බදු) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජුනි මස 22 වන දින]

**1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියට පෙර ඇතැම් බඩු අපනයනය කර 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියෙහි හෝ ඉන් පසුව ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් ලබාගත් තැනැත්තන්ට, ඒ බඩු 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියෙහි හෝ ඉන් පසුව අපනයනය කරන ලද නම් ඒ තැනත්තන් විසින් ඒ බඩු සම්බන්ධයෙන් ගෙවීමට යටත්වන අපනයන බද්ද හා සෙස් බද්ද ගැන සැලකිලිමත්ව ආගණනය කරන ලද බද්දක් නියම කිරීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 20 දරන අපනයන (විශේෂ බදු) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** යම් තැනත්තකු විසින් —

(අ) 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියට පෙර යම් බඩු අපනයනය කර ඇති, සහ

(ආ) ඒ බඩු සඳහා හෝ වෙනුවෙන් 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියෙහි හෝ ඉන් පසුව ශ්‍රී ලංකා රුපියල් වලින්, ගෙවීමක් ලබා ඇති හෝ බැර කිරීමක් ලබා ඇති හෝ අන්‍යාකාරයකින් ප්‍රතිලාභයක් ලබා ඇති

අවස්ථාවක, ඒ තැනැත්තා —

(i) ඒ බඩු 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියෙහි හෝ ඉන් පසුව අපනයනය කරන ලද නම් ඒ බඩු සම්බන්ධයෙන් අය කළ යුතු වන හා ගෙවිය යුතු වන යම් අපනයන බද්දක හා සෙස් බද්දක මුදලෙහි එකතුව; සහ

(ii) ඒ බඩු අපනයනය කරන ලද අවස්ථාවේ දී ඒ බඩු සම්බන්ධයෙන් අයකරන ලද සහ ගෙවන ලද යම් අපනයන බද්දක හා සෙස් බද්දක මුදලෙහි එකතුව

අතර වෙනසට සමාන මුදලක (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දකට යටත් විය යුතුය:

එසේ වුව ද 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියට පෙර යම් බඩු අපනයනය කර ඒ බඩු සඳහා හෝ වෙනුවෙන්, 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියෙහි හෝ ඉන් පසුව ශ්‍රී ලංකා රුපියල් වලින්, ගෙවීමක් ලබා ඇති හෝ බැර කිරීමක් ලබා ඇති හෝ අන්‍යාකාරයකින් ප්‍රතිලාභයක් ලබා ඇති තැනැත්තකු, ඒ බඩු අපනයනය කිරීමෙන් ඒ තැනැත්තාට ලැබෙන විදේශ විනිමය යම් වාණිජ බැංකුවක් විසින් මිලට ගැනීම පිණිස 1977 නොවැම්බර් මස 15/16 වන දින මධ්‍යම රාත්‍රියට පෙර ඒ බැංකුව සමග එළඹුණු ගිවිසුමක නියම අනුව ශ්‍රී ලංකා රුපියල් වලින් ඒ තැනැත්තා ඒ ගෙවීම ලබා ඇත්නම් හෝ එසේ බැර කරනු ලැබ ඇත්නම් හෝ ඒ ප්‍රතිලාභය ලබා ඇත්නම් බද්දට යටත් නොවිය යුතුය.

3. බද්දට යටත් වන සෑම තැනැත්තකුම —

(අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි; හෝ

(ආ) බද්දට ඔහු යටත් වන්නේ යම් බඩු අපනයනය කිරීමක් හේතුකොට ගෙන ද ඒ බඩු සඳහා හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් එම තැනත්තා ගෙවීම ලබන, බැර කිරීම ලබන හෝ අන්‍යාකාරයකින් ප්‍රතිලාභයක් ලබන දිනයෙහි

යන දින දෙකින් පසුව යෙදෙන දිනයෙහි සිට සති දෙකක් ඇතුලත —

(i) කොමසාරිස් ජනරාල්වරයා වෙත බද්ද ගෙවිය යුතුය; තවද

(ii) බදු මුදල ආගණනය කරනු ලැබුවේ යම් අපනයන බදුවලට හා සෙස් බදුවලට සැලකිල්ල දක්වමින් ද ඒ බදු පිළිබඳව විස්තර දක්වෙන වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතුය.

4. (1) මේ පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් හෝ ඉන් කොටසක් 3 වන වගන්තියෙහි සඳහන් දිනයෙහි හෝ ඊට පෙර හෝ නොගෙවන ලද අවස්ථාවක, ඒ බද්ද හෝ එහි කොටස ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර —

(අ) ඒ පැහැර හැරීම කළ තැනැත්තා පුද්ගලයකු හෝ සමාගමක් නම් ඒ පුද්ගලයා හෝ සමාගම; හෝ

(ආ) ඒ පැහැර හැරීම කළ තැනැත්තා ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම කොටස් කරුවකුම

මේ පනතේ කාර්ය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය.

(2) යම් මුදලක් සම්බන්ධයෙන් බද්ද ගෙවීම පැහැර හැර ඇතැයි සලකනු ලබන අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති මුදලට අමතරව, ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට විස්සකට සමාන මුදලක් ඒ පැහැර හැරි තැනැත්තා විසින් දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතුය.

5. බද්දට යටත් යම් තැනැත්තකු 3 වන වගන්තියෙහි සඳහන් දිනයෙහි හෝ එදිනට පෙර හෝ ඒ බද්ද ගෙවා නොමැති බව හෝ ඒ බද්ද වශයෙන් ඔහු ගෙවිය යුතුව තිබුණ මුදලට වඩා අඩු මුදලක් ඒ තැනත්තා විසින් ගෙවා ඇති බව හෝ තක්සේරු කරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ තක්සේරුකරු විසින්, ස්වකීය විනිශ්චයට අනුව ඒ තැනත්තා විසින් බද්ද වශයෙන් ගෙවිය යුතුව තිබුණ මුදල හෝ අතිරේක මුදල අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකි අතර, එසේ තක්සේරු කරන ලද බද්ද, 4 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක් වේ නම් ඒ දණ්ඩනය ද සමග ගෙවන ලෙස ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

6. (1) 5 වන වගන්තිය යටතේ කරන ලද යම් තක්සේරුවක මුදල පිළිබඳව අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තක්සේරු කිරීම පිළිබඳ දැන්වීම භාරදෙනු ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත එම තක්සේරුවට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත ආයාචනයක් කරනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ තමා වෙත කරන ලද යම් ආයාචනයක් සම්බන්ධයෙන් ස්වකීය තීරණයට එළඹීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ආයාචකට, ඔහුගේ කරුණු පෞද්ගලිකව හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා මගින් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් දිය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත යම් ආයාචනයක් කර ඇත්තේ යම් තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ ආයාචනය මත කරනු ලැබිය හැකිය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත කරන ලද යම් ආයාචනයක් සම්බන්ධයෙන් වූ ඔහුගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනත්තකු විසින් එම තීරණයට විරුද්ධව, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය වෙත ආයාචනය කරනු ලැබිය හැකිය. සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන ආයාචන වලට අදාළ, ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ උපවගන්තිය යටතේ වූ ආයාචනයකට අදාළ විය යුතුය.

(5) (4) වන උප වගන්තිය යටතේ සමාලෝචන මණ්ඩලය වෙත කරන ලද ආයාචනයක් සම්බන්ධයෙන් වූ ඒ මණ්ඩලයේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව නීතිය පිළිබඳ ප්‍රශ්නයක්මත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කළ හැකිය. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන අභියාචන වලට අදාළ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ උපවගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

7. 6 වන වගන්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත තක්සේරුවකට විරුද්ධව ආයාචනයක් කර නොමැති අවස්ථාවක හෝ බද්දෙහි මුදල ආයාචනයේ දී තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක හෝ එම තක්සේරුව නැතහොත් අවස්ථාවෝචිත පරිදි ආයාචනයේ දී අඩු කරන ලද, ස්ථිර කරන ලද හෝ වැඩි කරන ලද පරිදි වූ තක්සේරුව සියලු කාර්ය සඳහා බද්දෙහි මුදල සම්බන්ධයෙන් අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

8. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 109 වන වගන්තියෙහි විධිවිධාන, ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් හා ආදායම් බද්ද වෙනුවට බද්ද ගැන එහි සඳහන් කර ඇත්තාක් මෙන් ද ඒ පනතේ වෙනත් යම් වගන්තියක විධිවිධාන පිළිබඳව ඒ වගන්තියෙහි ඇති සඳහන් කිරීම, ඒ වෙනත් වගන්තියෙහි විධිවිධාන මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් මේ පනතෙහි දක්වා ඇති ආකාරයට අදාළ කිරීම ගැන සඳහන් කිරීමක් වූවාක් මෙන්ද අදාළ විය යුතුය.

9. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 110 වන වගන්තියෙහි විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන්ද ආදායම් බද්ද වෙනුවට බද්ද ගැන එහි සඳහන් කර ඇත්තාක් මෙන් ද අදාළ විය යුතුය.

10. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 111 වන වගන්තියෙහි විධිවිධාන, ඒවා මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ ආදායම් බද්ද වෙනුවට බද්ද ගැන එහි සඳහන් කර ඇත්තාක් මෙන් ද, ඒ පනතේ වෙනත් යම් වගන්තියක විධිවිධාන පිළිබඳව ඒ වගන්තියෙහි ඇති සඳහන් කිරීම, ඒ වෙනත් වගන්තියෙහි විධිවිධාන මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් මෙ පනතෙහි දක්වා ඇති ආකාරයට අදාළ කිරීම ගැන සඳහන් කිරීමක් වූවාක් මෙන්ද අදාළ විය යුතුය.

11. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 112 වන වගන්තියෙහි විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන්ද ආදායම් බද්ද වෙනුවට බද්ද ගැන එහි සඳහන් කර ඇත්තාක් මෙන්ද අදාළ විය යුතුය.

12 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 113 වන වගන්තියෙහි විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන්ද ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද පිළිබඳව ඒ වගන්තියෙහි වූ සඳහන් කිරීම බද්ද ගැන වූ සඳහන් කිරීමක් වූවාක් මෙන්ද අදාළ විය යුතුය.

13. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 114 වන වගන්තියේ විධිවිධාන, ඒවා මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් සහ ආදායම් බද්ද වෙනුවට බද්ද ගැන එහි සඳහන් කර ඇත්තාක් මෙන්ද, ඒ පනතේ යම් පරිච්ඡේදයක විධිවිධාන පිළිබඳව ඒ වගන්තියෙහි ඇති සඳහන් කිරීම ඒ වෙනත් පරිච්ඡේදයෙහි විධිවිධාන මේ පනතෙහි විධිවිධාන වූවාක් මෙන් මේ පනතෙහි දක්වා ඇති ආකාරයට අදාළ කිරීම ගැන සඳහන් කිරීමක් වූවාක් මෙන්ද අදාළ විය යුතුය.

14. 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන හා 13 වන වගන්තිවල "බද්ද" යන්නට 4 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක් ද ඇතුළත් වේ.

15. 1978 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට ඉහතින්ම වූ වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය යටතේ නිසැකව දැන ගැනීමේ කාර්ය සඳහා, 2 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා ගෙවීමට යටත් වන්නා වූ ද, ඒ තැනැත්තා විසින් ගෙවා ඇත්තා වූ ද බද්දෙහි මුදල, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, ඒ ලාභ සහ ආදායම නිෂ්පාදනය කිරීමේදී දරන ලද වියදමක් ලෙස සලකනු ලැබිය යුතුය.

16. 1980 මාර්තු මස තිස්එක් වන දින.හෝ එදිනට පෙර ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මගින්, මේ පනත යටතේ යම් තැනත්තකු විසින් ගෙවනු ලැබීමට යටත් මුදලට වැඩියෙන් ඒ තැනත්තා විසින් යම් බද්දක් හෝ දණ්ඩනයක් ගෙවා ඇති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, වැඩියෙන් ගෙවන ලද මුදල ආපසු ලැබීම සඳහා ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතුය:

එසේ වුව ද මේ වගන්තියෙහි වූ කිසිවක් ආයාචන සඳහා යම් කාල සීමාවක දීර්ඝ කිරීමක් හෝ අඩු කිරීමක් හෝ අවලංගුව පවතින යම් ආයාචනයක් වලංගු කිරීමක් හෝ අවසානාත්මක හා තීරණාත්මක වූ යම් තක්සේරුවක ප්‍රතිශෝධනයකට අවසර දීමක් හෝ ලෙස කියැවීම හෝ තේරුම් ගැනීම හෝ නොකළ යුතුය.

17. කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ දැන්වීමෙහි සඳහන් කාලයක් ඇතුළත මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වාර්තා හෝ වෙනත් තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට නියම කළ හැකිය.

18. (1) (අ ) 3 වන වගන්තියෙන් නියමිත පරිදි වාර්තාවක් සැපයීම පැහැර හරින; හෝ

(ආ) 17 වන වගන්තිය යටතේ යවන ලද යම් දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ

(ඇ) 3 වන වගන්තිය හෝ 17 වන වගන්තිය හෝ යටතේ සපයන ලද වාර්තාවක දැනදැනම අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන; හෝ

(ඈ) 17 වන වගන්තිය යටතේ යවන ලද දැන්වීමක නියම අනුව ක්‍රියා කිරීමේදී දැනදැනම අසත්‍ය හෝ වැරදි තොරතුරු සපයන

යම් තැනත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(2) වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක—

(අ ) ඒ පුද්ගල මණ්ඩලය සමාගමක් නම්, ඒ සමාගමෙහි සෑම අධ්‍යක්ෂවරයකුම, සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම කොටස් කරුවකුම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය:

එසේ වුවද ඒ වරද තමාගේ දැනුම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ සමාගමෙහි අධ්‍යක්ෂවරයකු විසින් හෝ ඒ ව්‍යාපාරික ආයතනයෙහි කොටස් කරුවකු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

19. මේ පනත ක්‍රියාත්මක වීමේ දී මේ පනත යටතේ යම් තැනැත්තකු බද්ද හෝ දරන්නට සිදු වූ යම් දණ්ඩනයක් හෝ ගෙවීමට යටත්වීමේ හේතුවෙන් ඒ තැනත්තාට සැළකිය යුතු දුෂ්කරතාවන් ඇතිවීමට ඉඩ ඇතැයි අමාත්‍යවරයාගේ මතය වන යම් අවස්ථාවක් උද්ගත වූවහොත් අවස්ථාවෝචිත සියලු කරුණු අනුව ඒ බද්ද නැතහොත් දණ්ඩනය අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ හා යුක්ති සහගත යයි අමාත්‍යවරයා සලකතහොත් අමාත්‍යවරයා විසින්, ඒ බද්ද හෝ දණ්ඩනය අත්හැරීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකිය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"තක්සේරුකරු" යන්නට 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය;

"සෙස් බද්ද" යන්නෙන් රේගු ආඥාපනත නොවන වෙනත් යම් පනතක් මගින් හෝ පනතක් යටතේ අයකරනු ලබන හෝ නියම කරනු ලබන යම් සෙස් බද්දක් අදහස් වේ;

"වාණිජ බැංකුව" යන්නට මුදල් නීති පනතේ 127 (1) වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය;

"සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් තැනක වලංගුව පවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් සමාගමක් අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය;

"අපනයන බද්ද" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන බඩු සම්බන්ධයෙන් රේගු ආඥාපනත යටතේ අය කරනු ලබන රේගු බද්ද අදහස් වේ;

"ව්‍යාපාරික ආයතනය" යන්නෙන් ලාභය සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ අදහසින් එකිනෙකා සමග හවුල් ව්‍යාපාරයකට ඇතුළත්ව සිටින පුද්ගලයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හෝ, පුද්ගලයන් එක්කෙනකු හෝ ඊට වැඩි ගණනක් සහ සංස්ථා හෝ සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ, සංස්ථා හෝ සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් වූ මණ්ඩලයක් අදහස් වේ;

"බඩු" යන්නෙන් බඩු අපනයනය සඳහා යම් අපනයන කරුවකුට 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත යටතේ නිකුත් කරනු ලබන යම් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ලැබීම සඳහා හිමිකම් නොතිබුණේ යම් බඩු සම්බන්ධයෙන් ද ඒ බඩු අදහස් වේ;

"තැනැත්තා" යන්නට ව්‍යාපාරික ආයතනයක් ද ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතුය.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 12 වන දින]

**ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් පනතේ 3 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 3අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

"දායක මුදල් වැඩි කිරීම

3අ. ව්‍යවස්ථා මාලාවේ II වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදය අනුව සංස්ථාවේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධය වැඩි කරනු ලබන්නාවූ ද, ව්‍යවස්ථා මාලාවේ II වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ දායක වීමට ශ්‍රී ලංකාවට හිමිකම් ඇති, ඒ වැඩි කරන ලද ප්‍රාග්ධන ස්කන්ධයේ අනුපාතයට දායක වීමට ශ්‍රී ලංකාව තීරණය කරන්නා වූ ද අවස්ථාවක, සංස්ථාව විසින් ඉහතකී (ඇ) ඡේදය යටතේ තීරණය කරනු ලබන කොන්දේසිවලට අනුකූලව, ඒ දායක මුදල ගෙවීම සඳහා අවශ්‍ය වන මුදල, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය."

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 30 දරන දේශීය ආදායම (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 21 වන දින]

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 30 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(v) යම් දේපළක අයිතිකරු මිය ගිය විට 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ යම් තැනැත්තකුට අයත් වීම ;

(vi) යම් දේපළක අයිතිකරු විසින් වෙනත් යම් තැනැත්තකුට 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ තෑගි කිරීම නිසා ඒ දේපළ පිළිබඳ අයිතියේ පැවරීමක් සිදුවීම ; සහ

(vii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ ශ්‍රී ලංකාවේ සංස්ථාගත යම් සමාගමක කොටස් වන යම් දේපළක් විකිණීමෙන්, තෑගි දීමෙන් හෝ අන්‍යාකාරයකින් ඒ දේපළෙහි අයිතිකරුගෙන් වෙනත් යම් තැනැත්තකුට අයත්වීම. " ;

(2) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයෙහි—

(අ) (vi) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(vi) (අ) ඒ තැනැත්තා විසින් දේපළ අත්කර ගැනීම, භාරයක් යටතේ අර්ථලාභියකු වශයෙන් වූ ස්වකීය තත්ත්වයෙන් එම භාරය යටතේ භාරකරු විසින් එම තැනැත්තා වෙත කරනු ලබන දේපළ පැවරීමකින් හෝ පොල්මංකරුවකු විසින් පාලනය කරනු ලබන්නේ යම් මිය ගිය තැනැත්තකුගේ දේපළක් ද, ඒ මියගිය තැනැත්තාගේ අන්තිම කැමැති පත්‍රයක් සහිත හෝ රහිත උරුමක්කාරයකුගේ තත්ත්වයෙන් එම තැනැත්තා වෙත එම පොල්මංකරු විසින් කරනු ලබන දේපළ පැවරීමකින් හෝ වන අවස්ථාවක, ඒ අත්කර ගන්නා අවස්ථාවේදී ඒ දේපළෙහි වටිනා කම, ඒ භාරකරු හෝ පොල්මංකරු විසින් අත්කර ගනු ලැබූ දිනය 1957 අප්‍රේල් මස 1 වන දිනයට කලින් නම් 1957 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි පැවැති වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතුය ; තව ද ඒ අත්කර ගැනීමේ දිනය 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයට පසුව නම් ඒ භාරකරු හෝ පොල්මංකරු ඒ දේපළෙහි සන්තකය ලත් වේලාවේ ඒ දේපළෙහි පැවති වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය; තව ද

(ආ) ඒ තැනැත්තා විසින් දේපළ අත්කර ගැනීම, (මෙහි මින් මතු මේ අනුඡේදයෙහි "ත්‍යාගදයකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු විසින් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරන ලද තෑග්ගක් මගින් වන්නාවූ ද පළමු සඳහන් තැනැත්තා විසින් ඒ අත්කර ගන්නා ලද දිනයෙහි සිට එක් අවුරුද්දක් ඇතුළත ඒ දේපළ පවරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ අත්කර ගත් වේලාවේ ඒ දේපළෙහි පැවති වටිනාකම—

(i) ත්‍යාගදයකයා විසින් ඒ දේපළ 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර අත්කර ගන්නා ලද නම්, 1957 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි පැවැති වෙළෙඳ අගයෙහි; හෝ

(ii) ත්‍යාගදයකයා විසින් ඒ දේපළ 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව මිලට ගන්නා ලද නම්, ත්‍යාගදයකයා දේපළ මිලට ගත් වටිනාකමෙහි; හෝ

(iii) 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, මිලට ගැනීමෙන් හැර, ත්‍යාගදයකයා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද නම්, ඒ දේපළ ත්‍යාගදයකයා විසින් අත්කර ගන්නා ලද වේලාවේ ඒ දේපළෙහි වෙළෙඳ අගයෙහි

සහ ත්‍යාගදයකයා විසින් ඒ දේපළ ත්‍යාගයක ආකාරයෙන් නොව, විකිණීමක් මගින් පවරනු ලැබුවේ නම් 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ත්‍යාගදයකයාට හිමිකම් තිබූ යම් අඩු කිරීමක මුදලෙහි මුළු ගණනට සමාන ප්‍රමාණයක් විය යුතු ය ;"; තව ද

(ආ) (viii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(viii) ඒ දේපළ—

(අ) 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ ප්‍රසාද කොටස් හෝ කොටස්වල වෙළෙඳ අගයට වඩා අඩු මිලකට 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ කොටස් ; හෝ

(ආ) 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ ප්‍රසාද කොටස් සහ කොටස්වල වෙළෙඳ අගයට වඩා අඩු මිලකට 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ කොටස් ; සහ

(ඇ) (අ) අනුඡේදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි සඳහන් කොටස් ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද්දේ සමාගමක යම් කොටස් පදනම් කරගෙන ද, ඒ කොටස්

ඇතුළත් වන හෝ යම් අවස්ථාවක ඇතුළත්ව තිබුණු කොටස් වත්කම වන, එම සමාගමේ ඒ තැනැත්තාගේ කොටස් වත්කමෙහි කොටසකින් සමන්විත වූ හෝ සමන්විත වන කොටසක් වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් එම දේපළ අත්කර ගන්නා ලද වේලාවේ ඒ දේපළෙහි වටිනාකම (x) වන අනුඡේදයෙහි විධිවිධානවලට යටත් ව—

(i) 1957 අප්‍රේල් මස 1 වන දිනට කලින් ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද, ඒ කොටස් වත්කම සමන්විත වූ කොටස්වල 1957 අප්‍රේල් මස 1 වන දිනයෙහි පැවති වෙළෙඳ අගයෙහි ;

(ii) 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව බෙදා වෙන් කර දීම හෝ මිලට ගැනීම හෝ මගින් ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද ඒ කොටස් වත්කම සමන්විත වූ කොටස් අත්කර ගැනීමේ පිරිවැයෙහි;

(iii) මිලට ගැනීමෙන් හෝ බෙදා වෙන් කර දෙනු ලැබීමෙන් හැර 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද කොටස් වත්කම සමන්විත වූ (1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා වෙත වෙළෙඳ අගයට වඩා අඩු මිලකට නිකුත් කරන ලද කොටස් හෝ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද ප්‍රසාද කොටස් හෝ ඇතුළත් නොවන) කොටස්වල, ඒ අත්කර ගත් දිනයෙහි පැවති වෙළෙඳ අගයෙහි

එකතුව ඒ කොටස් වත්කම සමන්විත වූ හෝ සමන්විත වන මුළු කොටස් සංඛ්‍යාවෙන් බෙදූ විට එන ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් විය යුතු ය. තවද ඒ අනුව, එක් කොටසකට වැඩි ගණනකින් දේපළ සමන්විත වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද වේලාවේ දේපළෙහි වටිනාකම, මේ අනුඡේදයේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව නිශ්චය කර, දේපළ සමන්විත වන කොටස් සංඛ්‍යාවෙන් වැඩි කරන ලද, එක් කොටසක වටිනාකමට සමාන ප්‍රමාණයක් විය යුතු ය;''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (3) පහත දැක්වෙන අඩුකිරීම් කිරීමෙන් පසු ප්‍රාග්ධන ලාභයක මුදල ආගණනය කරනු ලැබිය යුතු ය:—

(අ) ඒ ලාභය ලැබුණේ යම් ගනුදෙනුවකින් ද ඒ ගනු දෙනුව සිදුවීමට පෙරාතුව ම ඒ දේපළෙහි අයිතිකරු වූ තැනැත්තා විසින් හුදෙක් ඒ දේපළ අත්කර ගැනීම සම්බන්ධයෙන් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරනු ලැබූ (ගැනුම් මිලක් වේනොත් එය හැර) යම් වියදමක් ;

(ආ) 10 වන වගන්තිය හෝ 53 වන වගන්තිය හෝ 53අ වන වගන්තිය හෝ 53ආ වන වගන්තිය යටතේ මතු දැක්වෙන වියදම වෙනුවෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දී නැති නම්, ඒ දේපළට යම් දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් කිරීමේ දී, ඉහත කී අයිතිකරු විසින් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරනු ලැබූ වියදම ;

(ඇ) එම ලාභය ලැබුණේ යම් ගනුදෙනුවකින් ද හුදෙක් ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ඉහත කී අයිතිකරු විසින් දරනු ලැබූ වියදම ; සහ

(ඈ) 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සිදුවන යම් නිශ්චල දේපළක අයිතියේ වෙනස්වීමක් සිදු වූ විට—

(අ) ප්‍රාග්ධන ලාභය ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද අවස්ථාවේ දී ඒ දේපළෙහි 3 වන වගන්තියේ අර්ථානුකූල අගය ; සහ

(ආ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි හෝ සඳහන් යම් වියදමක් අඩු කිරීමෙන් පසු අයිතියේ එම වෙනස ඇතිවන අවස්ථාවේ දී ඒ දේපළෙහි අගය

යන දෙක අතර වෙනසින්—

(i) ප්‍රාග්ධන ලාභය ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමෙන් පසු අවුරුදු පහකට අඩු නොවන එහෙත් අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් තුළ දී අයිතිය වෙනස් වන අවස්ථාවක සියයට විසි පහකට සමාන මුදලක්, සහ

(ii) ප්‍රාග්ධන ලාභය ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමෙන් පසු අවුරුදු පහළොවකට වැඩි කාලයක දී අයිතියේ වෙනස සිදුවන අවස්ථාවක සියයට පනහකට සමාන මුදලක්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අඇ) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධුරයෙන් යම් තැනැත්තකුට ලැබෙන පඩිනඩි, විශ්‍රාම වැටුප් සහ වෙනත් යම් ප්‍රතිලාභ,";

(2) ඒ උපවගන්තියේ (අඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:—

"(අෘ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ සමාගමක් විසින් ඒ ගිවිසුමේ නියම යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය තුළ හෝ ඉන්පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභවලින් හා ආදායමෙන් හෝ යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්;

(අෟ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ යම් සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ වාසික නොවන යම් තැනැත්තකුට 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ගෙවනු ලබන යම් ලාභාංශයක්:

(අඏ) ලෝක සංචාරක සංවිධානයේ ආදායම ;

(අඐ) ලෝක සංචාරක සංවිධානය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් පුද්ගලයකුගේ නිල පඩිනඩි ;

(අළු) නීති අධ්‍යාපන සභා ආඥපනත මගින් පිහිටුවන ලද, සංස්ථාගත නීති අධ්‍යාපන සභාව යනුවෙන් හඳුන්වනු ලබන සංස්ථාවේ ආදායම ;";

(3) ඒ උපවගන්තියේ (ඏ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඏ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 6 වන වගන්තිය අදාළ වන්නා වූ සංස්ථාවක් විසින් හෝ ඒ වගන්තිය අදාළ වන්නා වූ ව්‍යාපාරයක අයිතිකරු විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ ව්‍යවසායක් වන යම් ව්‍යාපාරයක් විසින් හෝ, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ හෝ ව්‍යාපාරයේ කාර්ය සඳහා 1958 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද යම් විද්‍යාඥයකුගේ, කාර්මික ශිල්පියකුගේ, විශේෂඥයකුගේ හෝ උපදේශකයකුගේ පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී උද්ගත

නොවන යම් ආදායමක්; එසේ වුවත් ඒ සංස්ථාවෙහි හෝ ව්‍යාපාරයෙහි ඒ විද්‍යාඥයාගේ, කාර්මික ශිල්පියාගේ, විශේෂඥයාගේ හෝ උපදේශකයාගේ සේවා නියුක්තිය නතර වන දිනය හෝ, අවස්ථාවෝචිත පරිදි 6 වන වගන්තියෙන් හෝ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ ඇති කර ගන්නා ලද ගිවිසුමකින් ඒ සංස්ථාව හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් දෙන ලද බදු නිදහස අවසාන වන දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනයෙහි ඒ නිදහස් කිරීම අවසන් විය යුතු ය ;'' ;

(4) ඒ උපවගන්තියේ (උඋඋ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

''(උඋඋ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද මේ වගන්තියේ කාර්ය සඳහා අදාළ අමාත්‍යවරයාගේ නිර්දේශය අනුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා අනුමත ව්‍යාපාරයක් ලෙස ප්‍රකාශිත එවැනි යම් ව්‍යාපාරයක අයිතිකරු විසින් 1968 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද, යම් විද්‍යාඥයකුගේ, කාර්මික ශිල්පියකුගේ, විශේෂඥයකුගේ හෝ උපදේශකයකුගේ පඩිනඩි හා ශ්‍රී ලංකාවෙහි උද්ගත නොවන යම් ආදායමක්; එසේ වුවත් ඒ අනුමත ව්‍යාපාරයෙහි ඒ විද්‍යාඥයාගේ, කාර්මික ශිල්පියාගේ, විශේෂඥයාගේ හෝ උපදේශකයාගේ සේවා නියුක්තිය නතර වන දිනය හෝ ඒ ව්‍යාපාරය අනුමත ව්‍යාපාරයක්වීම අවසන් වන දිනය හෝ යන දින දෙකින් පළමුව එළඹෙන දිනයෙහි දී ඒ නිදහස් කිරීම අවසන් විය යුතු ය. ;'' ;

(5) ඒ උපවගන්තියේ (ක) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ;—

''(ක) 54 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් ශ්‍රී ලංකාවෙහි වාසිකයකු ලෙස සලකනු ලබන යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් දෙනු ලබන යම් විදේශ දීමනාවක් හෝ නියෝජනීය දීමනාවක් සහ යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්තව ඇත්තා වූ වෙනත් යම් පුද්ගලයකු විසින් සේවා නියුක්තියෙන් ලබා ගන්නා ලද ලාභවලින්, කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, විදේශ දීමනාවට සමාන වූ කොටසක්:'';

(6) ඒ උපවගන්තියේ (දආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (දඇ) ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමතය ඇතිව යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් හෝ යම් වාණිජ බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක ඔහුගේ බැරට ඇති විදේශීය ව්‍යවහාර මුදල් වෙනුවෙන් ඔහු ශ්‍රී ලංකාවෙහි නිර්වාසිකවන කාලසීමාව තුළ දී ඔහුට උපචිත වන පොලිය:''; සහ

(7) ඒ උපවගන්තියේ (න) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ;-

'' (නන) ධීවර බෝට්ටු, නාවික යන්ත්‍ර, ධීවර ආම්පන්න සහ වෙනත් ධීවර උපකරණ මිලට ගැනීම සඳහා සහනාධාරයක් වශයෙන් ධීවර අමාත්‍යාංශය විසින් යම් තැනැත්තකුට ගෙවන ලද යම් මුදලක්;

(ననන) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකුට සහනාධාරයක් වශයෙන් ගෙවන ලද යම් මුදලක්;''.

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියෙහි පිළිවෙලින් 6ආ වන, 6ඇ වන, 6ඈ වන සහ 6ඉ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:—

"ධීවර කර්මාන්තයෙහි, සතුන් ඇති කිරීමෙහි සහ කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ඇතැම් සමාගම්වල ලාභ සහ ආදායම් නිදහස් කිරීම.

6ආ (1) 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව, සංස්ථාගත කරනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද ඒ දිනයෙහි හෝ ඉන් පසුව මෙහි පහත සඳහන් ව්‍යාපාර එකක් හෝ වැඩි ගණනක් පවත්වා ගෙන යාම ආරම්භ කළා වූ ද පවත්වා ගෙන යාමෙහි ලා පමණක් නිරතව සිටින්නා වූ ද යම් සමාගමකට මේ වගන්තිය අදාළ විය යුතු ය.ඒ ව්‍යාපාර නම්:—

(අ) අක් වෙරළෙහි හෝ ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම සඳහා වූ ව්‍යාපාරයක්;

(ආ) අක් වෙරළෙහි හෝ ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම සහ, එවැනි යම් කාර්යයක නිෂ්පාදන සකස් කිරීම සඳහා වූ ව්‍යාපාරයක්;

(ඇ) සතුන් ඇති කිරීම සඳහා වූ ව්‍යාපාරයක් ;

(ඈ) තේ, රබර්, පොල් හෝ වී හැර පැලෑටි, තාල වර්ගයේ රුක්, ගස්, පඳුරු හෝ ආහාර ද්‍රව්‍ය ඉඩම්වල වගා කිරීම සහ එවැනි වගාවක නිෂ්පාදන සකස් කිරීම සඳහා වූ ව්‍යාපාරයක් ; හෝ

(ඉ) තේ, රබර්, පොල් හෝ වී, හැර පැලෑටි, තාල වර්ගයේ රුක්, ගස්, පඳුරු හෝ ආහාර ද්‍රව්‍ය ඉඩම්වල වගා කිරීම සඳහා වූ ව්‍යාපාරයක්;

එසේ වුව ද මේ වගන්තිය—

(i) 1977 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව පවත්වා ගෙන යමින් තිබුණු ව්‍යාපාරයක්; හෝ

(ii) 1977 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව පවත්වා ගෙන යමින් තිබුණු යම් වෙළෙඳ ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්-කරණය කිරීමෙන් පිහිටු වන ලද ව්‍යාපාරයක් හෝ

පවත්වා ගෙන යන යම් සමාගමකට අදාල නොවිය යුතුය.

(2) 3 (1) (අ) වන වගන්තියේ අර්ථානුකූලව, (1) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක ලාභ සහ ආදයම වන ඒ උපවගන්තියෙහි සඳහන් ව්‍යාපාරයකින් හෝ ව්‍යාපාරවලින් ලැබෙන ඒ සමාගමේ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභයක් නොවන) ලාභ සහ ආදායම, සමාගම සංස්ථාගත කරනු ලැබූ දිනයෙන් ආරම්භව 1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

6ඇ. (1) බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරනු ලැබුවා වූ ද, අමාත්‍ය-වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද යම් ව්‍යාපාරයකට—

(අ) එය වී කෙටීම සඳහා වූ ව්‍යාපාරයක් නොවන බවට ; සහ

(ආ) ඒ ව්‍යාපාරය කලින් පැවති යම් වෙළෙඳ ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු ලැබූ ව්‍යාපාරයක් නොවන බවට; සහ

(ඇ) නිෂ්පාදනය හෝ සෑදීම කර ගෙන යනු ලබන ස්ථානය, මහා නගර සභා ආඥා පනතේ අර්ථානුකූලව, මහා නගර සභාවක පරිපාලන සීමාවලින් පිටත පිහිටා ඇති බවට

තක්සේරුකරු සෑහීමට පත්වන අවස්ථාවක මේ වගන්තිය අදාළ විය යුතුය.

(2) 3 (1) (අ) වන වගන්තියේ අර්ථානුකූලව (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයක ලාභ සහ ආදායම වන, ඒ ව්‍යාපාරයේ (ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ හෝ ආදායම නොවන) ලාභ සහ ආදායම, (3) වන උපවගන්තියෙහි සහ (4) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, ව්‍යාපාරය අරම්භ වූ දිනයෙන් ආරම්භව 1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස්විය යුතුය.

(3) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ යම් වේලාවක දී එවැනි යම් ව්‍යාපාරයක ප්‍රාග්ධනය රුපියල් පන් ලක්ෂය ඉක්මවන අවස්ථාවක, ඒ පෙරාතුව වූ වර්ෂයේ දී උද්ගත වන ඒ ව්‍යාපාරයේ ලාභ සහ ආදායම, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ආදයම් බද්දෙන් නිදහස් නො විය යුතුය.

(4) යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය සඳහා ඒ ව්‍යාපාරයේ ලාභ සහ ආදායම් නිදහස් කිරීම—

(i) ඒ පෙරාතුව වූ වර්ෂය මුළුල්ලේ ම ඒ ව්‍යාපාරය පැවති අවස්ථාවක රුපියල් එක් ලක්ෂය; සහ

(ii) ඒ පෙරාතුව වූ වර්ෂයෙහි කොටසක් තුළ පමණක් ඒ ව්‍යාපාරය පැවති අවස්ථාවක, ඒ පෙරාතුව වූ වර්ෂයේ දින සංඛ්‍යාවට ඒ ව්‍යාපාරය පැවති ඒ වර්ෂයේ දින ගණන දරන අනුපාතය අනුව රුපියල් එක් ලක්ෂයට අනුපාත වන මුදල

ඉක්මවන ඒ ලාභ සහ අදයම් කොටසට ඒ තක්සේරු වර්ෂය සඳහා අදළ නො විය යුතුය.

(5) මේ වගන්තියෙහි "ප්‍රාග්ධනය" යන්නෙන්, එය යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) ඒ ව්‍යාපාරයේ යම් ඉඩමක, ගොඩනැගිල්ලක, පිරියතක, යන්ත්‍රෝපකරණයක හා සවිකිරීමක පිරිවැයෙහි; සහ

(ආ) ඒ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා තබා ගන්නා ලද ඒ ව්‍යාපාරයේ යම් ලාභයක් අඩු කළ පසු ඒ ව්‍යාපාරයේ අනෙක් වත්කම් වල වටිනාකමෙහි

එකතුව අදහස් වේ.

6ඇ. (1) නිවාස ඉදි කොට විකිණීම සඳහා ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් 1977 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ඉදි කිරීම ආරම්භ කරන ලද යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් ඒ තැනැත්තා විසින් විකුණනු ලබන අවස්ථාවක, ඒ විකිණීම ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි පළමුවර විකිණීම වන විට, මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට යටත්ව—

(අ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් නොඉක්ම වන්නේ නම් ඒ විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදයම මුළුමණින් ම ආදයම් බද්දෙන් නිදහස් විය යුතුය;

(ආ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් ඉක්මවන නමුත් වර්ග අඩි එක් දහස් දෙසිය පණහක් නො ඉක්මවන්නේ නම් ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන් සියයට හැත්තෑපහක් ආදයම බද්දෙන් නිදහස් විය යුතුය; තවද

(ඇ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහස් දෙසිය පණහක් ඉක්මවන නමුත් වර්ග අඩි දෙදහසක් නො ඉක්මවන්නේ නම් ඒ විකිණීමෙන් ලැබෙන ලාභ වලින් සහ ආදායමෙන් සියයට පණහක් ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය:

එසේ වුව ද—

(අ) ඒ විකිණීම, මහා නගර සභා ප්‍රදේශයක හෝ නගර සභා ප්‍රදේශයක පිහිටා ඇති, පර්චස් දහයක් ඉක්මවන ආබද්ධ ඉඩමක් සහිත නිවාසයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන්, කොමසාරිස් ජනරාල් වරයාගේ මතය අනුව, ඒ පර්චස් දහය ඉක්මවන ආබද්ධ ඉඩම් කොටස විකිණීමට අරෝපණය කළ හැකි ලාභ සහ ආදායම් කොටස;

(ආ) ඒ විකිණීම, මහා නගර සභා ප්‍රදේශයක් හෝ නගර සභා ප්‍රදේශයක් නොවන යම් ප්‍රදේශයක් තුළ පිහිටා ඇති, පර්චස් විස්සක් ඉක්මවන ආබද්ධ ඉඩමක් සහිත නිවාසයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන්, කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, ඒ පර්චස් විස්ස ඉක්මවන ආබද්ධ ඉඩම් කොටස විකිණීමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම් කොටස;

(ඇ) ඒ විකිණීම, මහා නගර සභා ප්‍රදේශයක හෝ නගර සභා ප්‍රදේශයක පිහිටා ඇති, පර්චස් පහක් ඉක්මවන ආබද්ධ ඉඩමක් සහිත තට්ටු නිවාසයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන්, කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, ඒ පර්චස් පහ ඉක්මවන ඉඩම් කොටස විකිණීමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම් කොටස;

(ඈ) ඒ විකිණීම, මහා නගර සභා ප්‍රදේශයක් හෝ නගර සභා ප්‍රදේශයක් නොවන යම් ප්‍රදේශයක් තුළ පිහිටා ඇති, පර්චස් දහයක් ඉක්මවන ආබද්ධ ඉඩමක් සහිත තට්ටු නිවාසයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ විකිණීමෙන් ලැබෙන ලාභ වලින් සහ ආදායමෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ඒ පර්චස් දහය ඉක්මවන ආබද්ධ ඉඩම් කොටස විකිණීමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදයම් කොටස

අවස්ථාවෝචිත පරිදි, ඒ නිවාසය හෝ තට්ටු නිවාසය විකිණීමෙන් උද්ගතවන ලාභ හා ආදයම නොවන බව මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය:

එසේම තවදුරටත්, ඒ විකිණීම කුලියට සින්නවීමේ නියම මත වූ විකිණීමක් වන අවස්ථාවක—

(i) ඒ විකිණීම, ඒ නියම මත විකිණීම සඳහා ගිවිසුමට එළඹුණු දිනයෙහි සිදු වූ ලෙස සලකනු ලැබිය යුතුය; තව ද

(ii) කුලියට සින්නවීමේ නියම මත විකිණීම සඳහා වූ එ ගිවිසුම යටතේ ගැනුම්කරු විසින් ගෙවිය යුතු සම්පූර්ණ මුදලින්, මිලට ගන්නා විසින් ගෙවිය යුතු වූ පොලිය ලෙස ආරෝපණය කළ හැකි කොටස, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවල සහ ආදායමෙහි කොටසක් නොවන බව මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(2) සමාගමක් විසින් ස්වකීය කොටස්කරුවන්ට යම් ලාභංශයක් හෝ ඒ ලාභංශයෙහි යම් කොටසක්, (1) වන උපවගන්තිය යටතේ ආදයම් බදුවලින් නිදහස් කරන ලද ලාභවලින් සහ ආදයමෙන් ගෙවනු ලබන අවස්ථාවක, ඒ ලාභංශය හෝ ඒ ලාභාංශයේ කොටස ආදයම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු අතර 25 (1) (ආ) වන වගන්තියේ සහ 27 (1) වන වගන්තියේ විධිවිධාන ඒ ලාභංශයට හෝ ඒ ලාභංශයේ කොටසට අදාළ නොවිය යුතුය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් ලාභංශයක් ගෙවීමෙහි ලා ලියන ලද හෝ කරන ලද බලපත්‍රයක්, චෙක්පතක් හෝ වෙනත් ඇණවුමක් නිකුත් කරන සෑම තැනැත්තකු ම විසින්, ඒ ලාභංශයට ඇතුළත් කර ඇත්තා වූ ද (1) වන උපවගන්තිය යටතේ ආදයම් බද්දෙන් නිදහස් කර ඇත්තා වූ ද ලාභවල සහ ආදයමේ ප්‍රමාණය දක්වමින්, ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් එයට ඇමිණිය යුතුය.

6ඉ. (1) මේ වගන්තිය, ඒ කෙටීම සඳහා 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරනු ලැබූ සහ ඒ සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් ව්‍යාපාරයකට අදාළ විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයක 3(1) (අ) වන වගන්තියේ අර්ථානුකූල වූ යම් ලාභ සහ ආදායම වන, (ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම නොවන) ඒ ව්‍යාපාරයේ ලාභ සහ ආදායම, ඒ ව්‍යාපාරය කලින් පැවති වෙළෙඳ ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවන ලද ව්‍යාපාරයක් නොවන බවට තක්සේරු කරු සෑහීමට පත්වුවහොත්, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ව්‍යාපාරය ආරම්භ කරන ලද දින ආරම්භ වී 1983 මාර්තු මස 31 වන දින අවසාන වන කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(3) කෘෂිකර්ම හා ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්—

(i) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ වී අලෙවි මණ්ඩලයට හෝ ඒ පනතේ අර්ථානුකූල වූ යම් බලයලත් ගැනුම්කරුවකුට හෝ ඒ ව්‍යාපාරය විසින් සපයනු ලැබිය යුතු සහල් ප්‍රමාණය, සහ

(ii) එසේ සපයනු ලැබිය යුතු සහල්වල තත්ත්වය

ඒ ව්‍යාපාරයේ ශක්නුතාව සහ ඒ ව්‍යාපාරය පිහිටි ප්‍රදේශය ගැන සැලකිල්ල යොමු කර, නිශ්චය කරනු ලැබිය හැකිය.

(4) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයක් විසින් ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී, කෘෂිකර්ම හා ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් නියම කරන ලද කොන්දේසි අනුව ක්‍රියා කරනු ලැබ ඇති බවට ඒ අමාත්‍යවරයා විසින් හෝ ඒ අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් අත්සන් කරන ලද සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීමට ඒ ව්‍යාපාරය පැහැර හැරි අවස්ථාවක, ඒ පෙරාතුව වූ වර්ෂයේ දී උද්ගත වන ඒ ව්‍යාපාරයේ ලාභ සහ ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අ) පිරියතක, යන්ත්‍රෝපකරණවල සහ සවිකිරීම්වල අයිතිකරු වශයෙන්, යම් තැනැත්තකු විසින් පවත්වා ගෙන යනු ලබන කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක, හෝ සේවා නියුක්තියක ඔහු විසින් ඒ පිරියත, යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම් පාවිච්චි කරනු ලැබීම කරණකොටගෙන එ පිරියතේ, යන්ත්‍රෝපකරණ වල සහ සවිකිරීම්වල උද්ගත වූ වැහැරීම් සහ ගෙවී යාම් නිසා ඇති වූ අගය ක්ෂයවීම් වෙනුවෙන්, කොමසාරිස් ජනරාල්වරයා විසින් තම අභිමතය පරිදි සාධාරණ යයි සලකනු ලබන්නා වූ ද, අඩුකළ අගයෙන් එක් වර්ෂයකට සියයට නියමිත අනුප්‍රමාණයක් අනුව සාමාන්‍යයෙන් ගණන් බලනු ලබන්නා වූ ද මුදලක් :

එසේ වුව ද, 1978 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය සඳහා වූ යම් ප්‍රභවයකින් ඒ තැනැත්තාට ලැබෙන ලාභ සහ ආදායම නිශ්චිතව දැන ගැනීමෙහි ලා, යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් සම්බන්ධයෙන් මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ යම් මුදලක් අඩු කළ යුතු වූ අවස්ථාවක, අඩුකළ අගයෙන් එක් වර්ෂයකට සියයට නියමිත අනුප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන මුදල වෙනුවට, 1977 අප්‍රේල් මස 1වන දිනයෙහි ඒ පිරියතේ, යන්ත්‍රෝපකරණයේ සහ සවිකිරීම්වල අඩු කළ අගයට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතුය;";

(ආ) (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ;—

"(ඌ) වෘත්තීය සුදුසුකම් ලත් තැනැත්තකු වන යම් තැනැත්තකු විසින්, තමා සාමාජිකයකු වන යම් වෘත්තිකයන්ගේ සංගමයක දායක මුදල් ගෙවීමේ ලා හෝ වෘත්තීය පොත්, සඟරා හා වර්තා මිලට ගැනීමේ ලා, 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව වැය කරන ලද යම් මුදලක් ;";

(ඇ) (ඍ) ඡේදයේ අතුරු ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු ඡේදය ආදේශ කිරීමෙන්;—

"එසේ වුව ද ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද යම් පිරියතක්, යන්ත්‍රෝප-කරණයක් හෝ සවිකිරීම් සම්බන්ධයෙන්—

(අ) ඒ අත්කර ගැනීම, ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කර ගෙන යනු ලබන යම් කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක හෝ සේවා නියුක්තියක ඔහු විසින් කලින් පාවිච්චි කරන ලද යම් පිරියතක්, යන්ත්‍රෝප කරණයක් හෝ සවිකිරීම් අලුත් කිරීමේ කාර්යය සඳහා කරන ලද්දක් නම් සහ ඒ අලුත් කිරීම සඳහා වැය වූ මුදල සඳහා (ඒ) ඡේදය යටතේ වූ අඩු කිරීමක් ලෙස ඉඩ දෙන ලද නම්, හෝ

(ආ) ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිල දී ගැනීමෙහි ලා සහ පිහිටුවීමෙහි ලා වැය කරන ලද මුදල සඳහා (ඔ) ඡේදය හෝ (ක) ඡේදය යටතේ වූ අඩු කිරීමක් ලෙස ඉඩ දෙන ලද නම්, හෝ

(ඇ) ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කර ගන්නා ලද නම් හෝ 1977 අප්‍රේල් මස 1 වන දිනට කලින් අත්කර ගනු ලැබ, ඒ දිනයේ දී හෝ ඉන් පසුව පළමුවරට ඔහු විසින් පාවිච්චි කරන ලද නම් මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට කිසිම අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු නොලැබිය යුතුය;";

(ඈ) (එ) ඡේදයේ අතුරු ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු ඡේදය ආදේශ කිරීමෙන්:—

"එසේ වුව ද, ඒ තැනැත්තා විසින් ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන්—

(අ) ඒ ඉදිකිරීම, මේ ඡේදයේ ඉහතින් වූ විධි විධානවල සඳහන් කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා ඔහු විසින් කලින් පාවිච්චි කරන ලද යම් ගොඩනැගිල්ලක් අලුත් කිරීම සඳහා කරන ලද්දක්නම් සහ ඒ අලුත් කිරීම සඳහා වැය වූ මුදල සඳහා (ඒ) ඡේදය යටතේ වූ අඩු කිරීමක් ලෙස ඉඩ දෙන ලද නම්, හෝ

(ආ) ඒ ඉදිකිරීම, 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරන ලද නම් මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට කිසිම අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු නොලැබිය යුතුය;"

(ඉ) (ඒ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඒ) ආදායම ඉපයීම සඳහා යොදවන ලද පිරියත්, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් (අලුත් කිරීම සඳහා නොව) අලුත්වැඩියා කිරීම සඳහා ඒ තැනැත්තා විසින් වැය කරන ලද යම් මුදලක් හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඌ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ (ග) ඡේදය යටතේ හෝ ආදායම් බදු ආඥාපනතේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් පිරියතක, යන්ත්‍රෝපකරණයක හෝ සවිකිරීම්වල අගය ක්ෂයවීම සඳහා කිසිම අඩු කිරීමකට හෝ ඒ සඳහා දීමනාවකට ඉඩ දී නොමැති නම් ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් අලුත් කිරීම සඳහා වියදම් වූ යම් මුදලක් හෝ මේ උපවගන්තියේ (ඒ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ (ච) ඡේදය හෝ (ජ) ඡේදය යටතේ යම් ගොඩනැගිල්ලක්, ආම්පන්නයක්, උපකරණයක් හෝ භාණ්ඩ පිළිබඳ අගය ක්ෂයවීම සඳහා කිසිම අඩු කිරීමක් සඳහා ඉඩ දී හෝ ඒ සඳහා දීමනාවක් දී නොමැති නම් එසේ යොදවන ලද ඒ ගොඩනැගිල්ල, ආම්පන්නය, උපකරණය හෝ භාණ්ඩ අලුත් කිරීම සඳහා වියදම් වූ යම් මුදලක් හෝ එසේ යොදවන ලද යම් ගොඩනැගිල්ලක්, ආම්පන්නයක්, උපකරණයක් හෝ භාණ්ඩ අලුත් වැඩියා කිරීම සඳහා වියදම් වූ යම් මුදලක්;"

(ඊ) (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඔඔ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් —

(අ) හුදෙක් ම යම් භාණ්ඩ හෝ බඩු පිළිබඳ අපනයන වෙළෙඳාම හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා වූ යම් සේවා සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටක දරන ලද සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී හුදෙක් ම—

(i) යම් භාණ්ඩ හෝ බඩු පිළිබඳ අපනයන වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම; හෝ

(ii) විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා වූ යම් සේවා සැපයීම

සම්බන්ධයෙන් ගමන් කිරීමේ ලා දරන ලද වියදම විනිමය පාලකවරයාගේ අනුමතය ඇතිව දරන ලද නම් සහ ඒ වියදම ඒ කාර්යය සඳහා ඔහු විසින් අවසර දෙන ලද ප්‍රමාණය නොඉක්මවන්නේ නම්, ඒ වියදම ;";

(උ) (ඕ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඕ) (i) 6 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (v) වන ඡේදයේ හෝ (vi) වන ඡේදයේ සඳහන් වන්නා වූ ද ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන්නා වූ ද යම් ව්‍යාපාරයක් සඳහා යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ගෘහභාණ්ඩ, උපකරණ හෝ භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, මිල දී ගැනීමේ ලා සහ පිහිටුවීමේ ලා නැතහොත් මිල දී ගැනීමේ ලා ඒ තැනත්තා විසින් වැය කරන ලද යම් මුදලක්, හෝ

(ii) එ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන දියඹ මුහුදේ මසුන් ඇල්ලීමේ හෝ අක් වෙරළේ මසුන් ඇල්ලීමේ යම් ව්‍යාපාරයක් සඳහා යම් ආම්පන්නයක් හෝ මෙවලමක් අවස්ථාවෝචිත පරිදි මිල දී ගැනීමේ ලා සහ පිහිටුවීමේ ලා නැතහොත් මිල දී ගැනීමේ ලා ඒ තැනැත්තා විසින් වැය කරන ලද යම් මුදලක් :

එසේ වුවද, ලාභ නිශ්චිතව දනගනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහාද ඒ කාලසීමාව තුළ ඒ තැනැත්තා විසින්, යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ගෘහ භාණ්ඩ, උපකරණ භාණ්ඩ, ආම්පන්න හෝ මෙවලම් විකුණා. ඉවත ලා, අන්‍යාකාරයකින් බැහැර කොට ඇති අවස්ථාවක නැතහොත් ඔහු ඒවායේ අයිතිකරුවීම අන්‍යාකාරයකින් අවසන් කර ඇති හෝ

ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමෙහි ලා මේ ඡේදය යටතේ හෝ (ග) ඡේදය යටතේ අඩු කිරීමක් කරනු ලැබිය හැකිව තිබුණේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරයේ එවැනි යම් පිරියත යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ගෘහ භාණ්ඩ, උපකරණ භාණ්ඩ, ආම්පන්න හෝ මෙවලම් පාවිච්චි කිරීම ඔහු විසින් අවසාන කර ඇති අවස්ථාවක –

(i) එවැනි යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ගෘහභාණ්ඩ, උපකරණ, භාණ්ඩ, ආම්පන්න හෝ මෙවලම් විකිණීමෙන් උපලබ්ධි කර ගත් මුදල, හෝ අවස්ථාචෝචිත පරිදි,

(ii) එවැනි යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ගෘහභාණ්ඩ, උපකරණ, භාණ්ඩ ආම්පන්න හෝ මෙවලම් ඉවත ලූ, අන්‍යාකාරයකින් බැහැර කළ, අන්‍යාකාරයකින් ඒවායේ අයිතිය අවසාන වූ හෝ එවැනි යම් ව්‍යාපාරයක ඒවා පාවිච්චි කිරීම අවසාන කරන ලද දිනයෙහි වෙළෙඳ අගය,

ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාට ලැබෙන. 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයේ අවස්ථානුකූල වූ ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්යය සඳහා ඒ ව්‍යාපාරයේ ලැබීම් වශයෙන් සලකනු ලැබිය යුතුය;'';

(ඍ) (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:–

''(ග) තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී ඔහු විසින් අත් කර ගන්නා ලද සහ ඔහු විසින් කර ගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කර ගෙන යනු ලබන යම් කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක, වෘත්තියක රක්ෂාවක හෝ සේවා නියුක්තියක ඔහු විසින් පාවිච්චි කරන ලද යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් සම්බන්ධයෙන් –

(i) ඒපිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිල දී ගැනීමෙන් අත් කර ගනු ලැබූ අවස්ථාවක, ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිල දී ගැනීමේ ලා සහ පිහිටුවීමේ ලා ඔහු විසින් වියදම් කරන ලද මුදලට, හෝ

(ii) ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ සවිකිරීම් මිල දී ගැනීමෙන් නොව අන්‍යාකාරයකින් අත් කර ගනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් අත් කර ගන්නා ලද දිනයේ දී ඒ පිරියතේ, යන්ත්‍රෝපකරණයේ සහ සවිකිරීම්වල වෙළඳ අගයෙහි සහ ඒවා පිහිටුවීමේ ලා ඔහු විසින් වියදම් කරන ලද යම් මුදලේ එකතුවට

සමාන දීමනාවක්:

එසේ වුවද, එවැනි යම් පිරියතක්, යන්ත්‍රෝපකරණ යක් හෝ සවිකිරීම් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට –

(අ) ඒ තැනැත්තා විසින් ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ සවිකිරීම 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්කර ගනු ලැබිණි නම් සහ පාවිච්චි කරනු ලැබිණි නම් සහ පාවිච්චි කරනු ලැබිණි නම්; හෝ

(ආ) ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ සවිකිරීම් මිල දී ගැනීමේ ලා සහ පිහිටුවීමේ ලා වැය කරන ලද යම් මුදලක් සඳහා (ඕ) ඡේදය හෝ (ක) ඡේදය යටතේ වූ අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබිණි නම්

මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම අඩු කිරීමක් සඳහා ඉඩ නොදිය යුතුය:

එසේම තවදුරටත්, ලාභ නිශ්චිතව දැනගනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාල සීමාව තුළ, ඒ තැනැත්තා විසින්, ඒ ව්‍යාපාරයේ එවැනි යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවි කිරීම් විකුණන ලද, ඉවත දමන ලද, අන්‍යාකාරයකින් බැහැර කරන ලද අවස්ථාවක නැතහොත් ඔහු එවැනි යම් පිරියතක, යන්ත්‍රෝපකරණයක හෝ සවිකිරීම්වල අයිතිකරු වීම අන්‍යාකාරයකින් අවසාන වූ හෝ ලාභ සහ ආදායම නිසැකව දැන ගැනීමෙහි ලා මේ ඡේදය

UNIVERSITY OF MORATUWA LIBRARY

යටතේ අඩු කිරීමක් කරනු ලැබිය හැකිව තිබුණේ යම්ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, එවැනි යම් ව්‍යාපාරයක එවැනි යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් පාවිච්චි කිරීම ඔහු විසින් අවසාන කරන ලද අවස්ථාවක—

(i) එවැනි යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් විකිණීමෙන් උපලබ්ධිකර ගත් මුදල හෝ අවස්ථාවෝචිත පරිදි,

(ii) එවැනි යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් ඉවත දමන ලද, අන්‍යාකාරයකින් බැහැර කරන ලද, අන්‍යාකාරයකින් අයිතිය අවසාන වූ හෝ එවැනි යම් ව්‍යාපාරයක එය පාවිච්චි කිරීම අවසාන කරන ලද දිනයෙහි වෙළෙඳ අගය, ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාට ලැබෙන, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායම් නිශ්චිතව දැනගැනීමේ කාර්ය සඳහා ඒ ව්‍යාපාරයේ ලැබීම් ලෙස සැලකිය යුතුය;

(ච) ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යාපාරයක ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති කාර්ය මණ්ඩලයේ, විධායක නිලධරයකු නොවන, යම් සාමාජිකයකුගේ පදිංචිය සඳහා වාසස්ථානයක් ලෙස ඒ ව්‍යාපාරයේ කාර්යය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ලා තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී ඔහු විසින් වැය කරන ලද මුදලට සමාන දීමනාවක්:

එසේ වුව ද යම් තැනැත්තකු විසින්—

(අ) 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙහි ලා වැය කරන ලද යම් මුදලක් සම්බන්ධයෙන්; හෝ

(ආ) ඒ ගොඩනැගිල්ල ඉදිකිරීමෙහි ලා වැය කරන ලද යම් මුදලක් සඳහා (ග) ඡේදය හෝ (ජ) ඡේදය යටතේ වූ අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබ් නම් එ මුදල සම්බන්ධයෙන්; හෝ

මෙ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ එ තැනැත්තා සඳහා කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය;

එසේම තවදුරටත් ලාභ නිශ්චිතව දැනගනු ලබන්නේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව තුළ, ඒ තැනැත්තා විසින්, ඒ ව්‍යාපාරයේ එවැනි යම් ගොඩනැගිල්ලක් විකුණන ලද, ඉවත දමන ලද, අන්‍යාකාරයකින් බැහැර කරන ලද අවස්ථාවක නැතහොත් ඔහු ඒ ගොඩනැගිල්ලේ අයිතිකරුවීම අන්‍යාකාරයකින් අවසාන වූ හෝ ලාභ සහ ආදායම නිසැකව දැන ගැනීමෙහි ලා මේ ඡේදය යටතේ අඩු කිරීමක් කරනු ලැබීම හැකිව තිබුණේ යම ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද එවැනි යම ව්‍යාපාරයක එවැනි යම් ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම ඔහු විසින් අවසාන කරන ලද අවස්ථාවක—

(i) එවැනි යම් ගොඩනැගිල්ලක් විකිණීමෙන් උපලබ්ධිකර ගත් මුදල හෝ අවස්ථාවෝචිත පරිදි,

(ii) එවැනි යම් ගොඩනැගිල්ලක් ඉවත දමන ලද, අන්‍යාකාරයකින් බැහැර කරන ලද, අන්‍යාකාරයකින් එහි අයිතිය අවසාන වූ හෝ එවැනි යම් ව්‍යාපාරයක එය පාවිච්චි කිරීම අවසාන කරන ලද දිනයෙහි වෙළෙඳ අගය

එවැනි යම් ව්‍යාපාරයකින් ඒ තැනැත්තාට ලැබෙන, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්ය සඳහා ඒ ව්‍යාපාරයේ ලැබීම් ලෙස සැලකිය යුතුය;

(ජ) තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී—

(i) ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන යම් කෘෂිකාර්මික හෝ කර්මික ව්‍යාපාරයක හෝ (5) වන උපවගන්තියේ අර්ථානුකූල යම් අනුමත ව්‍යාපෘතියක කාර්යය සඳහා—

(අ) කාර්ය මණ්ඩලයේ ශුභ සාධන ගොඩනැගිල්ලක් ලෙස පාවිච්චි කිරීම පිණිස; හෝ

(ආ) වාසස්ථානයක් වශයෙන් හැර, ඒ ව්‍යාපාරයේ හෝ ව්‍යාපෘතියේ කාර්යය සඳහා පරිහරණය පිණිස; හෝ

(ii) ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක කාර්යය පිණිස හුදෙක් ගුදමක් ලෙස පාවිච්චි කිරීම සඳහා

යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ලා ඔහු විසින් වැය කරන ලද මුදලින් සියයට පණහකට සමාන වන දීමනාවක්:

එසේ වුව ද, 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ලා යම් තැනැත්තකු විසින් වැය කරන ලද යම් මුදලක් සම්බන්ධයෙන්, මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තා සඳහා කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය:

එසේම තවදුරටත් ලාභ නිශ්චිතව දැනගනු ලබන්නේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාල සීමාව තුළ, ඒ තැනැත්තා විසින්, ඒ ව්‍යාපාරයේ එවැනි යම් ගොඩනැගිල්ලක් විකුණන ලද, ඉවත දමන ලද නැතහොත් එවැනි යම් ගොඩනැගිල්ලක අයිතිකරුවීම අන්‍යාකාරයකින් අවසාන වූ හෝ ලාභ හා ආදායම නිශ්චිතව දැන ගැනීමෙහි ලා මේ ඡේදය යටතේ අඩු කිරීමක් කරනු ලැබිය හැකිව තිබුණේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරයේ එවැනි යම් ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම ඔහු විසින් අවසාන කරන ලද අවස්ථාවක—

(අ) ඒ ගොඩනැගිල්ල විකිණීමෙන් උපලබ්ධි කර ගත් මුදල හෝ අවස්ථාවෝචිත පරිදි,

(ආ) ඒ ගොඩනැගිල්ල ඉවත දමන ලද, අන්‍යාකාරයකින් බැහැර කරන ලද, අන්‍යාකාරයකින් එහි අයිතිය අවසාන වූ හෝ එය යම් ව්‍යාපාරයක පාවිච්චි කිරීම අවසාන කරන ලද දිනයෙහි ඒ ගොඩනැගිල්ලේ වෙළෙඳ අගය

මේ ඡේදය යටතේ දෙන ලද දීමනාවට වැඩි වන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණය එවැනි යම් ව්‍යාපාරයකින් ඒ තැනැත්තාට ලැබෙන, 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්ය සඳහා ඒ ව්‍යාපාරයේ ලැබීම් ලෙස සැලකිය යුතුය'';

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

'' (5) යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්යය සඳහා--

(අ) අනුමත නොකරන ලද ව්‍යාපෘතියක් වන (කෘෂිකාර්මික ව්‍යාපෘතියක් නොවන) යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් ඔහු විසින් ආරම්භ කිරීමේ දී ඔහු විසින් පාවිච්චි කරනු ලැබීම සඳහා යම් අලුත් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් මිල දී ගැනීමේ ලා සහ පිහිටුවාලීමෙහි ලා ඔහු විසින් ඇත්ත වශයෙන් ම දරන ලද වියදමෙන් සියයට විස්සකට සමාන මුදලක්;

(ආ) යම් කෘෂිකාර්මික ව්‍යාපාරයක හෝ අනුමත ව්‍යාපෘතියක් වන යම් කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක දී ඔහු විසින් පාවිච්චි කරනු ලැබීම සඳහා යම් අලුත් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ සවිකිරීම් මිල දී ගැනීමේ ලා සහ පිහිටුවීමෙහි ලා ඔහු විසින් ඇත්ත වශයෙන් ම දරන ලද වියදමෙන් සියයට හතලිහකට සමාන මුදලක්;

(ඇ) අනුමත ව්‍යාපෘතියක් නොවන, යම් කාර්මික ව්‍යාපාරයක හෝ ඒ ව්‍යාපාරයේ කාර්යය සඳහා හෝ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල ශුභ සාධන ගොඩනැගිල්ලක් ලෙස හෝ ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ සිටින යටත් කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් වාසස්ථානයක් ලෙස පාවිච්චි කරනු ලැබීම පිණිස හෝ වාසස්ථානයක් වශයෙන් හැර, ඒ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පරිහරණය පිණිස වූ ගොඩනැගිල්ලක් ලෙස ඒ ව්‍යාපාරයේ කර්යයන් සඳහා යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ලා හෝ අලුත් කිරීමේ ලා ඇත්ත වශයෙන් ම ඔහු විසින් දරන ලද වියදමෙන් සියයට විස්සකට සමාන මුදලක්;

(ඈ) යම් අනුමත ව්‍යාපෘතියක හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක හෝ ඒ ව්‍යාපෘතියේ හෝ ව්‍යාපාරයේ කාර්ය සඳහා හෝ ඒ ව්‍යාපෘතිය හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන්, කාර්ය මණ්ඩල ගෘහ සාධන ගොඩනැගිල්ලක් ලෙස හෝ ඔහු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යටත් කාර්ය මණ්ඩලයේ යම් සාමාජික යකු විසින් වාසස්ථානයක් ලෙස පාවිච්චි කරනු ලැබීම පිණිස හෝ වාසස්ථානයක් වශයෙන් හැර ඒ ව්‍යාපෘතියේ හෝ ව්‍යාපාරයේ කාර්ය සඳහා පරිහරණය පිණිස වූ ගොඩනැගිල්ලක් ලෙස ඒ ව්‍යාපෘතියේ හෝ ව්‍යාපාරයේ කාර්ය සඳහා යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ලා හෝ අලුත් කිරීමේ ලා ඔහු විසින් ඇත්ත වශයෙන්ම දරන ලද වියදමෙන් සියයට හතලිහකට සමාන මුදලක්

අඩු කරනු ලැබිය යුතුය:

එසේ වුව ද කිසිම තැනැත්තකුට —

( i ) මේ උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ, යම් පිරියතක්, යන්ත්‍රෝප කරණ හෝ සවිකිරීම් මිලට ගැනීම හා පිහිටුවා ලීම සඳහා--

(අ) ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිලට ගැනීම සහ පිහිටුවාලීම සඳහා වියදම් කරන ලද මුදල සඳහා (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය යටතේ අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබ ඇත්නම්; හෝ

(ආ) ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිලට ගැනීම සහ පිහිටුවාලීම සඳහා වූ වියදම ඔහු විසින් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරන ලද නම් හෝ ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඔහු විසින් මිලට ගනු ලැබ, ඒ දිනට පසුව ඔහු විසින් පළමුවරට පාවිච්චි කරන ලද නම්;

(ii) මේ උපවගන්තියේ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය යටතේ යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙහි හෝ අලුත් කිරීමෙහි ලා ඇත්ත වශයෙන් ම දරන ලද වියදම් සඳහා--

(අ) ඒ ගොඩනැගිල්ල අලුත් කිරීම සඳහා දරන ලද වියදම සඳහා (1) වන උපවගන්තියේ (ඒ) ඡේදය යටතේ අඩු කිරීමක් ලෙස ඉඩ දෙනු ලැබ ඇත් නම්; හෝ

(ආ) ඒ ගොඩනැගිල්ල ඉදි කිරීමේ හෝ අලුත් කිරීමේ වියදම, 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරන ලද නම්

කිසිදු අඩුකිරීමකට හිමිකම් නොලැබිය යුතුය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා ''අනුමත ව්‍යාපෘතිය'' යන්නෙන්--

(i) ආදායම් බදු ආඥාපනතේ 47අ වන වගන්තියේ කාර්ය සඳහා අනුමත ව්‍යාපෘතියක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලද යම් ව්‍යාපෘතියක් අදහස් වේ; නැතහොත්

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි තත් කාලයෙහි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන සහ අලුත් ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා වූ ද, එම අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට මේ උපවගන්තියේ කාර්ය සඳහා අනුමත ව්‍යාපෘතියක් ලෙස මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබුවා වූ ද ව්‍යාපෘතියක් අදහස් වන අතර, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන ඡේදයේ හෝ (vi) වන ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක් ද ඊට ඇතුළත් වේ."; තවද

(3) ඒ වගන්තියේ (9) වන උපවගන්තියෙහි-

(අ) ''යම් තැනැත්තකු විසින්'' යන වචනවල සිට ''යම් මුදලක් වෙනුවෙන් හෝ'' යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන්:

''යම් තැනැත්තකු විසින් වැහැරීම හා ගෙවීයාම නිසා යම් පිරියතක, යන්ත්‍රෝපකරණයක හෝ සවිකිරීම්වල අගය ක්ෂයවීම වෙනුවෙන් (1) (අ) වන හෝ (1) (ඌ) වන හෝ (1) (එ) වන උපවගන්තිය යටතේ හෝ යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, සවිකිරීම් හෝ ගොඩ-නැගිල්ලක් අලුත් කිරීම සඳහා වියදම් කරන ලද යම් මුදලක් වෙනුවෙන් (1) (ඒ) වන උපවගන්තිය යටතේ හෝ යම් පිරියතක්, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් මිලයට ගෙන පිහිටුවීමෙහි ලා වියදම් කරන ලද යම් මුදලක් සඳහා (1) (ඕ) වන හෝ (1) (ක) වන හෝ (1) (ග) වන උපවගන්තිය යටතේ හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙහි ලා වියදම් කරන ලද යම් මුදලක් සඳහා (1) (ච) වන හෝ (ජ) වන උපවගන්තිය යටතේ හෝ:''; තවද

(ආ) (අ) (1) වන ඡේදයෙහි '' 6 වන හෝ 7අ වන වගන්තිය'' යන වචනවල හා ඉලක්කම්වල සිට ''නිදහස් කරනු ලැබූ'' යන වචන තෙක් සියලු වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශකිරීමෙන්:-

'' (3 (1) (අ) වන වගන්තියේ අර්ථානුකූල වූ) සම්පූර්ණ ලාභය සහ ආදායම හෝ ඉන් යම් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ;''

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි-

(අ) (ඈඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ඈඇ) ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි කර ගෙන යන හෝ පවත්වා ගෙන යන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් කිරීමෙහි ලා 1965 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා දරනු ලැබුවා වූ ද 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඖ) ඡේදයෙහි විධිවිධාන යටතේ අඩු කරනු ලැබිය යුතු යම් වියදමක් නොවන්නාවූද, යම් වියදමක්.'';

(ආ) (ඊ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ඊ) 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඖ) ඡේදයෙහි සඳහන් ප්‍රචාරණ වියදම නොවන, ඒ තැනැත්තා විසින් කර ගෙන යන හෝ පවත්වා ගෙන යන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තා ගේ ප්‍රචාරණ වියදමින් හතරෙන් එකක්;'' සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

'(3) යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ හෝ යම් වෘත්තියක හෝ රක්ෂා වක යෙදී සිටින්නා වූ හෝ කිසිම තැනැත්තකුට, ස්වකීය කර්මාන්තයේ වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ කාර්ය සඳහා ගමන් කිරීම පිණිස පාවිච්චි කරනු ලබන යම් වාහනයක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තාගේ සේවයෙහි නියුක්තව සිටින විධායක නිලධරයකු නොවන යම් නිලධරයකු විසින් ඒ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන වාහනයක් සම්බන්ධයෙන් හැර, වැහැරීම හා ගෙවී යාම නිසා අගය ක්ෂයවීම සඳහා හෝ එය අලුත් කිරීමක් සඳහා යම් මුදලකට හෝ 10 (1) (ඕ)වන වගන්තිය හෝ 10 (1) (ක) වන වගන්තිය හෝ 10 (1) (ග) වන වගන්තිය යටතේ යම් දීමනාවකට හෝ හිමිකමක් නොතිබිය යුතුය; තව ද අවසානයට සඳහන් කළ වාහනය සම්බන්ධයෙන්, ඒ අගය ක්ෂයවීම වෙනුවෙන් සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන මුදලකට ඒ තැනැත්තාට හිමිකමක් තිබිය යුතුය;

එසේ වුව ද 1965 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා මෙ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන-

(අ) ''වාහනයක් සම්බන්ධයෙන් හැර'' යන වචන වෙනුවට ''මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් සම්බන්ධයෙන් හැර'' යන වචන; සහ

(ආ) ''අවසානයට සඳහන් කළ වාහනය'' යන වචන වෙනුවට '' ඒ මෝටර් බයිසිකලය හෝ බයිසිකලය'' යන වචන

ආදේශ කර ඇත්තාක් මෙන් බලපැවැත්විය යුතුය.;

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි, (ඇ) ඡේදය වෙනු වට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ඇ)6 වන වගන්තියෙහි හෝ 6ආ වන වගන්තියෙහි හෝ 6ඇ වන වගන්තියෙහි හෝ 6ඉ වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක් විසින් තක්සේරු වර්ෂයට ඉහතින් වූ යම් වර්ෂයකදී දරන ලද සහ අවසාවෝවිත පරිදි, (1අ) වන උපවගන්තියෙහි හෝ (1ඇ) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයට ගණන් බලා අඩු කරන ලද යම් අලාභයක ප්‍රමාණය; ''; සහ

(2) ඒ වගන්තියේ ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

''(1ඇ) (අ) මේ වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 6ඇ වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක් ආරම්භ කරන ලද දිනයෙන් ආරම්භව 1983 මාර්තු මස 31 වන දින තෙක් යම් තක්සේරු වර්ෂයක දී, ඒ ව්‍යාපාරය පවත්වා ගෙන යන තැනැත්තා විසින් දරන ලද ඒ ව්‍යාපාරයේ යම් අලාභයක්, 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදයමෙහි, ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදයම සංයුක්ත වන කොටසින් පමණක් අඩු කර ගනු ලැබිය යුතුය:

එසේ වුවද මේ ඡේදය යටතේ අඩු කිරීමක් හැකි තාක් දුරට අලාභය සිදු වූ වර්ෂයට ඉක්බිතිව එළ ඹෙන පළමු තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාපාර යෙන් ඒතැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදයමෙන් අඩු කර ගත යුතුය. එසේ කළ නොහැකි වූ විට, ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදායමෙන් යනාදී පිළිවෙලට අඩුකර ගත යුතුය.

(ආ) 6ආ වන වගන්තියෙහි හෝ 6ඇ වන වගන්තියෙහි හෝ 6ඉ වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක යම් අලාභයක් අඩුකර ගැනීමේ කාර්යය සඳහා, 1984 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයක් වෙනුවෙන් ඒ ව්‍යාපාරය පවත්වා ගෙන යන තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදයම ගණන් බැලීමේ දී, එම අලාභය, එම තැනැත්තා ඒ ව්‍යාපාරය පවත්වා ගෙන ගිය 1984අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ ව්‍යාපාරයෙහි දරන්නට සිදුවුන අලාභවල එකතුවෙන්—

(i) 1984 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදයමෙන් (අ) ඡේදය යටතේ අඩු කර ගෙන ඇති, ඒ ව්‍යාපාරය දූරු අලාභවල යම් කොටසක, සහ

(ii) ඒ ව්‍යාපාරයෙහි අලාභය සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක් තුළ දී ද ඒ වර්ෂයට ඉක් බිතිව ම වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදයම් බද්දෙන් නිදහස් කරන ලද ඒ ව්‍යාපාරයේ යම් ලාභවල

එකතුව අඩු කිරීමෙන් පසු ලැබෙන ශේෂය විය යුතුය.

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් අලාභය හෝ එහි කොටස 1984 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදයමෙන් අඩු කළ නොහැකි වන අවස්ථාවක, ඒ අලාභය හෝ ඒ අලාභයෙහි කොටස ඊළඟ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදයමින් යනාදී වශයෙන් අඩු කර ගත යුතුය.''.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(1) මේ උපවගන්තියෙහි ''අනුමත පරිත්‍යාගය'' යන්නෙන්-

(අ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙර මුදලින් හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙන ලද; නැතහොත්

(ආ) 67 වන වගන්තියේ අර්ථානුකූල වූ යම් අනුමත පුණ්‍යායතනයක් වෙත හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලද යම් පොදු පුණ්‍යභාරයක් හෝ ආයතනයක් වෙත හෝ මුදලින් දෙන ලද

ප්‍රමාණයෙන් රුපියල් එක් දහසකට අඩු නොවන පරිත්‍යාගයක් අදහස් වේ.

මේ වගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට දෙනු ලැබූ මුදලින් නොවන අන්‍යාකාර පරිත්‍යාගයක ප්‍රමාණය ඒ පරිත්‍යාගය පිළිබඳ වටිනාකම විය යුතු අතර ඒ වටිනාකම-

(i) තෑගි කරන ලද දේපළ සඳහා ත්‍යාග දායකයා විසින් දරන ලද නියම වියදම විය යුතු ය; නැතහොත්

(ii) නියම වියදම නිශ්චය වශයෙන් දැනගත නො හැකි අවස්ථාවක, තෑගි කරන ලද දේපළ පිළිබඳ වෙළෙඳ අගය විය යුතුය.''; තවද

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(4) යම් තැනැත්තකු විසින් එකම අනුමත පුණ්‍යායතනයකට හෝ එවැනි පුණ්‍යායතන කිහිපයකට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට නැතහොත් අනුමත පුණ්‍යායතන එකකට හෝ වැඩි ගණනකට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට පරිත්‍යාග දෙකක් හෝ වැඩි ගණනක් යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයේ දී දෙන ලද හෝ දෙනු ලැබූ ලෙස සලකනු ලබන අවස්ථාවක, ඒ පරිත්‍යාගවල මුළු එකතුවේ ප්‍රමාණය රුපියල් එක් දහසකට අඩු නොවේ නම්, ඒ ප්‍රමාණය, ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් එක් අනුමත පරිත්‍යාගයක් ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය:

එසේ වුව ද මේ උපවගන්තියේ විධිවිධාන, 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට දෙනු ලැබූ යම් පරිත්‍යාගයකට අදාළ නොවිය යුතුය.''.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇඇ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයෙහි සඳහන් ''යම් මුදලක්'' යන යෙදුම වෙනුවට ''යම් මුදලක්; හෝ යන යෙදුම අදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්: -

"(උ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව ගිවිසුමකට එළඹී යම් සමාගමක, පවත්නා කොටස් නොවන, සාමාන්‍ය කොටස් මිලයට ගැනීමෙහි ලා 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආයෝජනය කරනු ලැබූ යම් මුදලක්.''.

**11.** පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 16 ඊ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:—

''බදු අය කළ හැකි අ දයම ගණන් බැලීමේදී අනුමත වැය සඳහා වූ දීමනා තක්සේරු කළහැකි ආදයමෙන් අඩු කළ යුතු බව.

16ඊ. (1) මේ වගන්තියේ ''අනුමත වැය'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට, පළාත් පාලන ආයතනයකට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ අරමුදලකට හෝ පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අරමුදලකට මුදලින් දෙනු ලැබූ පරිත්‍යාගයක් හෝ දෙනු ලැබූ අන්‍යාකාර පරිත්‍යාගයක් සහ

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සංවර්ධන සැලැස්මකට ඇතුලත් වූ යම් ව්‍යාපෘතියක් සඳහා යම් තැනැත්තකු විසින් දරන ලද වියදම—

(i) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව දරන ලද නම්, සහ

(ii) ඒ ලිඛිත අනුමතය දෙනු ලබන වේලාවේදී, අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලැබිය හැකි නියම වලට සහ කොන්දේසිවලට අනුකූලව දරන ලද නම්,

ඒ වියදම අදහස් වේ.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට දෙනු ලැබූ මුදලින් නොවන අන්‍යාකාර පරිත්‍යාගයක ප්‍රමාණය ඒ පරිත්‍යාගය පිළිබඳ වටිනාකම විය යුතු අතර, ඒ වටිනාකම—

(i) තෑගි කරන ලද දේපළ සඳහා ත්‍යාගදායකයා විසින් දරන ලද නියම වියදම විය යුතුය, නැතහොත්

(ii) නියම වියදම නිශ්චය වශයෙන් දැනගත නොහැකි අවස්ථාවක, තෑගි කරන ලද දේපළ පිළිබඳ වෙළෙඳ අගය විය යුතුය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා භාර්යාවකගේ හෝ දරුවකුගේ තක්සේරු කළහැකි ආදයමේ සමස්තය ඒ භාර්යාව හෝ දරුවා හෝ සාමාජිකයකු වන පවුලේ ප්‍රධානියාගේ තක්සේරු කළහැකි ආදයම සමග එකතු කරනු ලැබූ අවස්ථාවක, ඒ භාර්යාව විසින් හෝ දරුවා විසින් හෝ කරනු ලැබූ යම් අනුමත වැයක්, පවුලේ ප්‍රධානියා විසින් කරනු ලැබූ අනුමත වැයක් ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(4) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් දරන ලද හෝ දරන ලදැයි සලකනු ලබන යම් අනුමත වැයක මුදල ඒ වැය දරන ලද හෝ දරන ලදැයි සලකනු ලබන වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ තක්සේරු කළහැකි ආදයමෙන් හැකි තරමින් අඩුකරනු ලැබිය යුතු අතර එසේ අඩුකළ නොහැකි මුදලක් වෙතොත්, ඒ මුදල ඊළඟ තක්සේරු වර්ෂය හා පසුව එළඹෙන තක්සේරු වර්ෂ යනාදී තක්සේරු වර්ෂ සඳහා වූ ඒ තැනැත්තාගේ තක්සේරු කළහැකි ආදයමෙන් අඩුකරනු ලැබිය යුතුය.''.

12 ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

''(1අ) 1969 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව: එහෙත් 1977 අප්‍රේල් මස 1 වන දින පසු නොවී, ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පවුලක් දරුවකු හෝ යැපෙන නෑයකු නොමැතිව ස්වාමිපුරුෂයාගෙන් සහ භාර්යාවගෙන් සමන්විත වන අවස්ථාවක, ඒ ස්වාමි පුරුෂයා සහ භාර්යාව සම්බන්ධයෙන් රුපියල් තුන්දහස් හයසියයක දීමනාවක්, ඒ පවුලේ ප්‍රධානියාගේ ඒ වර්ෂය සඳහා තක්සේරු කළ හැකි ආදායමෙන් ඒ වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී අඩුකරනු ලැබිය යුතුය.'';

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උප-වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(1ආ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පවුලක් ස්වාමිපුරුෂයාගෙන් සහ භාර්යාවගෙන් සමන්විතවන සහ දරුවකු හෝ යැපෙන නෑයකු නොමැති අවස්ථාවක,එම වර්ෂය සඳහා එම පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් ගැනීමේදී, ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන්, ඒ ස්වාමිපුරුෂයා සහ භාර්යාව වෙනුවෙන් රුපියල් පන්දහසක දීමනාවක් අඩුකරනු ලැබිය යුතුය.'';

(3) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

''(2අ) 1969 අප්‍රේල් මස 1 දින හෝ ඉන් පසුව එහෙත් 1977 අප්‍රේල් මස 1 වන දින පසු නොවී, ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් පවුලක් ස්වාමිපුරුෂයාගෙන් සහ භාර්යාවගෙන් සහ දරුවන් හෝ යැපෙන නෑයන් එක්කෙනෙකුගෙන් හෝ ඊට වැඩිදෙනෙකු ගෙන් හෝ දරුවන් සහ යැපෙන නෑයන් එක්කෙනෙකුගෙන් හෝ ඊට වැඩි දෙනෙකුගෙන් සමන්විත වන අවස්ථාවක ස්වාමිපුරුෂයා සහ භාර්යාව වෙනුවෙන් රුපියල් තුන්දහස් හය සියයක දීමනාවක්' සහ—

(අ) එක් දරුවකු හෝ එක් යැපෙන නෑයකු සිටින්නේ නම්, එම දරුවා හෝ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් හය සියයක දීමනාවක්.

(ආ) දරුවන් දෙදෙනකු හෝ යැපෙන නෑයන් දෙදෙනකු හෝ දරුවන් එක් කෙනෙකු සහ යැපෙන නෑයන් එක්කෙනකු සිටින්නේ නම්, ඒ දරුවන් හෝ එම යැපෙන නෑයන් හෝ ඒ දරුවා හා ඒ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් හයසියයක දීමනාවක්,

(ඇ) දරුවන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ දරුවන් සහ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු සිටින්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ දරුවන් හෝ ඒ දරුවන් සහ යැපෙන නෑයන් හෝ ඒ යැපෙන නෑයන් වෙනුවෙන් රුපියල් එක්දහස් දෙසියයක දීමනාවක්,

ඒ වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී, ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩුකරනු ලැබිය යුතුය.'';

(4.) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2ආ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්‍ෂයක් සඳහා, යම් පවුලක් ස්වාමිපුරුෂයාගෙන් සහ භාර්යාවගෙන් සහ දරුවන් හෝ යැපෙන නෑයන් එක් කෙනෙකුගෙන් හෝ වැඩි දෙනකුගෙන් හෝ දරුවන් සහ යැපෙන නෑයන් එක් කෙනකු ගෙන් හෝ වැඩි දෙනකුගෙන් සමන්විත වන අවස්ථාවක, ස්වාමිපුරුෂයා සහ භාර්යාව වෙනු-වෙන් රුපියල් පන්දහසක දීමනාවක්, සහ—

(අ) එක් දරුවකු හෝ එක් යැපෙන නෑයකු සිටින්නේ නම්, ඒ දරුවා හෝ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් එක්දහසක දීමනාවක්,

(ආ) දරුවන් දෙදෙනෙකු හෝ යැපෙන නෑයන් දෙදෙනකු හෝ එක් දරුවකු සහ එක් යැපෙන නෑයකු සිටින්නේ නම්, ඒ දරුවන් හෝ යැපෙන නෑයන් හෝ ඒ දරුවා සහ ඒ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් දෙදහසක දීමනාවක්,

(ඇ) දරුවන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ දරුවන් සහ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු සිටින්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ දරුවන් හෝ ඒ දරුවන් සහ යැපෙන නෑයන් හෝ ඒ යැපෙන නෑයන් වෙනුවෙන් රුපියල් තුන් දහසක දීමනාවක්,

ඒ වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළහැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය.";

(5) ඒ වගන්තියේ (3අ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3අ) 1969 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1977 අප්‍රේල් මස 1 වන දිනය පසු නොවී, ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පවුලක් යම් පුද්ගලයකුගෙන් සහ එක් දරුවකුගෙන් හෝ එක් යැපෙන නෑයකුගෙන් හෝ පුද්ගලයකුගෙන් සහ දරුවන් හෝ යැපෙන නෑයන් දෙදෙනෙකුගෙන් හෝ පුද්ගලයකුගෙන් සහ එක් දරුවකුගෙන් සහ එක් යැපෙන නෑයකුගෙන් සමන්විත වන අවස්ථාවක, ඒ පුද්ගලයා වෙනුවෙන් රුපියල් තුන් දහසක දීමනාවක් සහ අවස්ථාවෝචිත පරිදි, ඒ දරුවා හෝ යැපෙන නෑයා හෝ ඒ දරුවන් හෝ යැපෙන නෑයන් හෝ ඒ දරුවා සහ ඒ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් හයසියයක දීමනාවක්, ඒ වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය.";

(6) ඒ වගන්තියේ (4ආ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4ආ) 1969 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1977 අප්‍රේල් මස 1 වන දිනය පසු නොවී, ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් පවුලක් පුද්ගලයකුගෙන් සහ දරුවන් තුන් දෙනකුගෙන් හෝ ඊට වැඩි දෙනකුගෙන් හෝ යැපෙන නෑයන් තුන් දෙනකු ගෙන් හෝ ඊට වැඩි දෙනකුගෙන් හෝ දරුවන් සහ යැපෙන නෑයන් තුන්දෙනෙකුගෙන් හෝ ඊට වැඩි දෙනකුගෙන් සමන්විත වන අවස්ථාවක, ඒ පුද්ගලයා වෙනුවෙන් රුපියල් තුන්දහසක දීමනාවක් සහ ඒ දරුවන් හෝ යැපෙන නෑයන් හෝ ඒ දරුවන් සහ යැපෙන නෑයන් වෙනු වෙන් රුපියල් එක්දහස් දෙසියයක දීමනාවක්, ඒ වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතුය";

(7) ඒ වගන්තියේ (4ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්:—

''(4ඇ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පවුලක් පුද්ගලයකුගෙන් සහ දරුවන් හෝ යැපෙන නෑයන් එක්කෙනෙකුගෙන් හෝ ඊට වැඩි දෙනෙකුගෙන් හෝ දරුවන් සහ යැපෙන නෑයන් එක් කෙනෙකුගෙන් හෝ ඊට වැඩි දෙනෙකුගෙන් සමන්විත වන අවස්ථාවක, එම පුද්ගලයා වෙනුවෙන් රුපියල් තුන්දහසක දීමනාවක් සහ—

(අ) එක් දරුවකු හෝ එක් යැපෙන නෑයකු සිටින්නේ නම්, ඒ දරුවා හෝ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් එක් දහසක දීමනාවක්,

(ආ) දරුවන් දෙදෙනකු හෝ යැපෙන නෑයන් දෙදෙනකු හෝ එක් දරුවකු සහ එක් යැපෙන නෑයකු සිටින්නේ නම්, ඒ දරුවන් හෝ ඒ යැපෙන නෑයන් හෝ ඒ දරුවා සහ යැපෙන නෑයා වෙනුවෙන් රුපියල් දෙදහසක දීමනාවක්,

(ඇ) දරුවන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ දරුවන් සහ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ යැපෙන නෑයන් තුන් දෙනකු හෝ ඊට වැඩි දෙනකු සිටින්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ දරුවන් හෝ ඒ දරුවන් සහ යැපෙන නෑයන් හෝ ඒ යැපෙන නෑයන් වෙනුවෙන් රුපියල් තුන්දහසක දීමනාවක්,

ඒ වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේදී ඒ වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩුකරනු ලැබිය යුතුය'':

තවද (8) ඒ වගන්තියේ (7) වන උපවගන්තියෙහි ''(2) වන උපවගන්තිය'' යන ඉලක්කම් සහ වචනවල සිට '' (4ආ) වන උපවගන්තිය'' යන ඉලක්කම් සහ වචන දක්වා වූ වචන හා ඉලක්කම් වෙනුවට ''(2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය හෝ (2ආ) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ (3අ) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ (4ආ) වන උපවගන්තිය හෝ (4ඇ) වන උපවගන්තිය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.''

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ—

(අ) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඊ) 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සහ ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වූ ආදායම් බද්ද, මේ පනතේ දෙවන උපලේඛනයේ VII වන කොටසේ විධිවිධාන අනුව ආගණනය කළ යුතුය; තවද"; සහ

(ආ) (1) වන උපවගන්තියේ අගට පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන්;—

"(උ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ආදායම් බද්ද මේ පනතේ දෙවන උපලේඛනයේ VIII වන කොටසේ විධිවිධාන අනුව ආගණනය කළ යුතුය";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි "හෝ VII වන කොටස" යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''හෝ VII වන කොටස හෝ VIII වන කොටස'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (ඌ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඌ) 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා සහ ඉක්බිති වම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා සම්බන්ධයෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ VII වන කොටසේ විධිවිධාන අදාළවීමේ දී, ඒ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි, ඒ උපලේඛනයේ ඒ කොටසේ සඳහන් එක් එක් මුදල හෝ 23අ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයෙන් ආගණනය කරනු ලැබූ මුදල්වල එකතුව, ඔහු වාසිකව සිටි දින ගණන හා ඒ ඉහතින් වූ වර්ෂයේ දින ගණන හා අතර අනුපාතය අනුව අඩුකරනු ලැබුවාක් මෙන් බලපැවැත්විය යුතුය;"

තව ද

(2) ඒ වගන්තියේ අගට, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(එ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පුද්ගලයා සම්බන්ධයෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ VIII වන කොටසේ විධිවිධාන අදාළවීමේ දී, ඒ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි, ඒ උපලේඛනයේ ඒ කොටසේ සඳහන් එක් එක් මුදල හෝ 23අ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයෙන් ආගණනය කරනු ලැබූ මුදල්වල එකතුව, ඔහු වාසිකව සිටි දින ගණන හා ඒ ඉහතින් වූ වර්ෂයේ දින ගණන හාඅතර අනුපාතය අනුව අඩු කරනු ලැබුවාක් මෙන් බලපැවත්විය යුතුය",

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියෙහි—

(අ) (ආ) ඡේදයේ (ii) වන අනු ඡේදයෙහි, "සියයට 35" යන යෙදුම ආදේශකර තිබුනාක් මෙන්ද; යන වචන සහ ඉලක්කම් වෙනුවට, "සියයට 35" යන යෙදුම ආදේශ කර තිබුණාක් මෙන්ද, තව ද, යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

(ඇ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන එක් එක් තක්සේරු වර්ෂය සඳහා, ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබුවාක් මෙන්:—

"(ආ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගම විසින් ආදායම් බදු ගෙවනු ලැබුවේ හෝ සමාගම සම්බන්ධයෙන් ආදායම් බදු තක්සේරු කරනු ලැබුවේ යම් ලාභාංශ සම්බන්ධයෙන් ද, ඒ ලාභාංශ නොවන්නාවූ ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලබන්නේ යම් ලාභ මත ද, ඒ ලාභ අතුරින් එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේදී එම සමාගම විසින් බෙදා දෙනු ලබන්නාවූ ද දළ ලාභාංශවල මුළු ගණනින් සියයට 33 1/3 කට සමාන මුදලකින්,";

(2) ඒ වගන්තියේ (1ආ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(1ආ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන නොතකා, 1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් යටත්වන ආදායම් බද්ද ඒ සමාගම, ඒ තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂය මුළුල්ලේම ජනතා සමාගමක් වී නම් හෝ එකී තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වූ විට, එය සංස්ථාගත කරන ලද දිනයේ සිට, ඒ ඉහතින් වූ වර්ෂයේ අවසානය දක්වා ජනතා සමාගමක් වී නම්, —

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමෙන් සියයට හතළිහකට සමාන මුදලකින්, හා

(ආ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ආදායම් බදු ගෙවනු ලැබුවේ හෝ ඒ සමාගම සම්බන්ධයෙන් ආදායම් බදු තක්සේරු කරනු ලැබුවේ යම් ලාභාංශ සම්බන්ධයෙන්ද, ඒ ලාභාංශ නොවන්නා වූද, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආ ගණනය කරනු ලබන්නේ යම් ලාභ මතද, ඒ ලාභ අතුරින් එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී එම සමාගම විසින් බෙදා දෙනු ලබන්නා වූ ද දළ ලාභාංශවල සමස්ත මුදලින් සියයට 33 1/3 කට සමාන මුදලකින්, සමන්විත විය යුතුය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා ''ජනතා සමාගමක්'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික වන සහ—

(i) සමාගම් ආඥාපනතේ අර්ථානුකූලව පෞද්ගලික සමාගමක් නොවන;

(ii) 1979 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසාන වන යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වූ විට- සමාගමේ කොටස්කරුවන්ගේ සංඛ්‍යාව පණහක් ඉක්මවන සහ එම දින හෝ ඊට පසුව ආරම්භවන යම් කාල සීමාවක් සම්බන්ධයෙන් වූ විට සියයක් ඉක්මවන සහ එකී අවස්ථා දෙකෙන් කවර අවස්ථාවක වුවද, ඒ එක් එක් කොටසේ නාම මාත්‍ර වටිනාකම රුපියල් දහයක් නොඉක්මවන:

(iii) සමාගම විසින් කරනු ලබන කොටස් වෙන් කිරීමක දී හෝ විවෘත වෙළෙඳ පොළේදී හෝ යම් තැනැත්තකු විසින් සමාගමේ එක් කොටසක හෝ ඊට වැඩි කොටස් ගණනක ආයෝජනය කරනු ලැබිය හැකි.

(iv) එය කිසිම තැනැත්තකු විසින් පෞද්ගලිකව හෝ තමාගේ භාර්යාව හෝ බාලවයස්කාර දරුවන් සමඟ කෙළින් ම හෝ නම් කරනු ලැබූ තැනැත්තන් මාර්ගයෙන් හෝ—

(අ) 1979 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසානවන යම් කාල සීමාවක් සම්බන්ධයෙන් වන විට, සියයට දහයකට වඩා වැඩි , සහ

(ආ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වන විට, සියයට පහකට වඩා වැඩි, නිකුත් කරනු ලැබූ කොටස් ප්‍රාග්ධන නොදරන;

(v) එක්කෙනකුට කොටස් එකක් හෝ ඊට වැඩි ගණනක් අයිති, අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටින;

(vi) සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයකු වෙනත් යම් ජනතා සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස ධුරයක් නොදරන;

(vii) 1979 අප්‍රේල් මස 1 වන දිනදී හෝ ඉන් පසු කෙළින්ම හෝ නම්කරනු ලැබූ තැනැත්තන් මාර්ගයෙන් වෙනත් යම් සමාගමක් විසින් එහි යම් කොටස් නොදරන සමාගමක් බවට තක්සේරුකරු සෑහීමට පත්වන සමාගමක් අදහස්වේ''

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (අත) වන ඡේදයට ඉක්බිත්ව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:—

"(අතත) ලෝක සංචාරක සංවිධානය;".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (ආ)ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ආආ)ඔහු ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටි වර්ෂයට පසුව එළඹෙන වර්ෂය තක්සේරු වර්ෂය වන අවස්ථාවක හෝ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එන තක්සේරු වර්ෂ තුනෙන් එක් වර්ෂයක් තක්සේරු වර්ෂය වන අවස්ථාවක, 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (දඇ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ, එවැනි යම් ගිණුමක විදේශීය ව්‍යවහාර මුදල් වලින් ඔහුගේ බැරට ඇති මුදල්;" සහ

(2) ඒ උපවගන්තියේ (ජ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ජ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ තක්සේරු වර්ෂය ආරම්භවන අවස්ථාවක, වටිනාකමින් රුපියල් විසිපත් දහසක උපරිමයකට යටත්ව, සහ 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එම තක්සේරු වර්ෂය ආරම්භ වන අවස්ථාවක වටිනාකමින් රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ඔහුට අයිතිව තුබූ යම් ස්වර්ණාභරණ හෝ ඔහු පවුලක ප්‍රධානියා නම්, ඔහුට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට අයිති යම් ස්වර්ණාභරණ;"

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "යම් තැනැත්තකු විසින් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් සපයනු ලැබූ ධන වාර්තාව අනුව ඒ තැනැත්තා පවුලක ප්‍රධානියාවන අවස්ථාවක, ඒ පවුලේ සාමාජිකයකු වන එක් එක් පුද්ගලයාගේ ධනය ඒ පවුලේ ප්‍රධානියාගේ ධනයෙහි කොටසක් ලෙස මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ සියලු සාමාජිකයන්ගේ ශුද්ධ ධනයේ වටිනාකම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ ශුද්ධ ධනය හා සමග එකතු කරනු ලැබිය යුතු අතර—

(අ) 1964 මාර්තු මස 31 වන දින අවසන් වන තක්සේරු වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ ශුද්ධ ධනයේ එකතුව රුපියල් එක් ලක්ෂයක් වන හෝ ඊට වැඩි වන අවස්ථාවක. ඒ ශුද්ධ ධනය,

(ආ) 1964 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ඒ පවුලේ ප්‍රධානියාගේ ශුද්ධ ධනයේ එකතුව රුපියල් එක් ලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, ඔහුගේ ශුද්ධ ධනය රුපියල් එක් ලක්ෂය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණය, සහ

(ඇ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පවුලේ ප්‍රධානියාගේ ශුද්ධ ධනයේ එකතුව රුපියල් දෙලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, ඔහුගේ ශුද්ධ ධනය රුපියල් දෙලක්ෂය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින්ද, ඒ ප්‍රමාණය

ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ධනය විය යුතු අතර ඒ පවුලේ ප්‍රධානියා ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්දට යටත් විය යුතුය.';

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'(2)" පවුලක හෝ පුණ්‍යායතනයක ඇතුළත් කරනු ලැබූ පුද්ගලයකු නොවන තැනැත්තකුගේ ශුද්ධ ධනය—

(අ) 1964 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1978 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂය ඉක්ම වන්නේ, සහ

(ආ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දෙලක්ෂය ඉක්ම වන්නේ

යම් ප්‍රමාණයකින්ද, ඒ ප්‍රමාණය ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ධනය විය යුතු අතර ඒ තැනැත්තා ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්දට යටත් විය යුතුය.;.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පුණ්‍යායතනයක බදු අයකළ හැකි ධනය.

34. (1) (අ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා පුණ්‍යායතනයක ශුද්ධ ධනය රුපියල් එක් ලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, ඒ ශුද්ධ ධනයේ සමස්ථය ඒ ආයතනයේ බදු අය කළ හැකි ධනය විය යුතු අතර ඒ ආයතනය ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්දට යටත් විය යුතුය.

(ආ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, පුණ්‍යායතනයක ශුද්ධ ධනය රුපියල් දෙලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, ඒ ශුද්ධ ධනයේ, සමස්තය ඒ ආයතනයේ බදු අය කළ හැකි ධනය විය යුතු අතර ඒ ආයතනය ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්දට යටත් විය යුතුය.

(2)(අ) 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, බදු අය කළ හැකි ස්වකීය ධනය සම්බන්ධයෙන් පුණ්‍යායතනයක් ගෙවීමට යටත් වන්නා වූ ධන බද්දේ ප්‍රමාණය. කවර අවස්ථාවක දී වුව ද, එහි බදු අය කළ හැකි ධනය රුපියල් එක් ලක්ෂය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින්ද, ඒ ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

(ආ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, බදු අය කළ හැකි ස්වකීය ධනය සම්බන්ධයෙන් පුණ්‍යායතනයක් ගෙවීමට යටත් වන්නා වූ ධන බද්දේ ප්‍රමාණය, කවර අවස්ථාවකදී වුව ද එහි බදු අය කළ හැකි ධනය රුපියල් දෙලක්ෂය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණය නොඉක්ම විය යුතුය."

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ඇතැම් අවස්ථා වලදී ධන බද්ද අඩු කිරීම.

38. (1) 1972 අප්‍රේල් මස 1 වන දින පසු නොවී ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ධන බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් සියයට අසූවක් නොඉක්මවිය යුතුය.

(2) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ධන බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේද, මේ

LIBRARY OF MORATUWA

පනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ, එහෙත් ඒ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම් ආගණනය කිරීමේ දී ගණන් ගනු ලැබිය හැකිව තිබුණු ලාභ සහ ආදායම් වන, (පදිංචි ස්ථානයක වාර්ෂික ශුද්ධ වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් සහනාධාරයක් හැර) යම් ලාභවල සහ ආදායමේ ද මුළු ගණනෙන් සියයට අසූවක් නොඉක්මවිය යුතුය".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38ආ වන වගන්තියේ "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ;—

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) 1965 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1978 අප්‍රේල් මස 1 වන දින යට පෙරාතුව, ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම සඳහා, මේ පනතේ හයවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ අනුව; සහ"; තවද

(2) ඒ උපවගන්තියේ අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඈ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක්ම සඳහා, මේ පනතේ හයවන උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ අනුව."

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ;—

"(ඇ) ඒ පුද්ගලයාගේ යම් දරුවකුට, ඒ දරුවා වයස අවුරුදු විසි එකට වැඩි වුවද, අඩු වුවද ඒ දරුවාගේ විවාහ ප්‍රතිඥාවක් වශයෙන්, වටිනාකමින් රුපියල් දස දහසක් වූ උපරිමයකට යටත්ව, 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ තෑග්ග දෙනු ලැබූ අවස්ථාවක සහ ඒ දරුවාගේ විවාහය සම්බන්ධයෙන් වටිනාකමින් රුපියල් විසිපන් දහසක්වූ උපරිමයකට යටත්ව, 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තෑග්ග දෙනු ලැබූ අවස්ථාවක, ඒ තෑග්ගට;".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියෙහි "ඔහුගේ මවගේ හෝ පියාගේ ආදායමට එකතු කරනු නොලැබිය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශකිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ඔහුගේ මවගේ හෝ පියාගේ ආදායමට එකතු කරනු නොලැබිය යුතුය;

එසේ වුවද, 1975 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන එක් එක් තක්සේරු වර්ෂය සඳහා, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන, "විසිපස් වන වියට" යන යෙදුම වෙනුවට "විසි එක් වන වියට" යන යෙදුම ආදේශ කරනු ලැබූවා සේ අදාළ විය යුතුය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' (8) 1970 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් බැහැර යන අවස්ථාවක සහ ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැර ගියේ යම් දිනයකදී ද, ඒ දිනයේ සිට ගණන් බලනු ලැබූ, යටත් පිරිසෙයින් මාස දෙළහකවත් කාලයක් සඳහා ආපසු ශ්‍රී ලංකාවට නොපැමිණෙන අවස්ථාවක, ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැර ගියේ යම් දිනයකදීද. ඒදිනයෙන් ආරම්භ වන සහ ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණ ශ්‍රී ලංකාවේ වාසික වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යම් ස්ථානයකදී සේවා නියුක්තියෙන් උද්ගතවන හෝ උපදින ඔහුගේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69ඇ වන වගන්තියේ "1975 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර" යන යෙදුම වෙනුවට පහත දැක්වෙන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"1978 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර නැතහොත් ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත යන දින දෙක අතුරින් පසුව එළඹෙන කවර හෝ දිනයක,"

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:—

"ජාතික රාජ්‍ය සභාවේ විරුද්ධ පක්ෂයේ,නායක ධුරය තත්කාලයෙහි දරන තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්—

(අ) ඒ තැනැත්තාට සපයා දී ඇති නිවාස ස්ථානයෙහි කුලී වටිනාකම.

(ආ) නිල වාහනය නඩත්තු කිරීම සඳහා ඒ තැනැත්තාට ගෙවනු ලබන දීමනාව, සහ

(ඇ) ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකයෙන් රුපියල් හත්සියයක මුදලක් ඒ ධුරයෙන් ඒ තැනැත්තාට උද්ගතවන ලාභ හා ආදායම නිශ්චිත වශයෙන් දන ගැනීමේ දී සැලකිල්ලට නොගත යුතුය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73ආ වන වගන්තියේ "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන්නා වූ යම් තක්සේරු වර්ෂයකට" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී නැතහොත් 1977 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේදී."

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73ඇ වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;—

" 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී නැතහොත් 1977 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී. ".

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73ඇ වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට " යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය තුළ නැතහොත් 1977 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දී. ".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73ඊ වන වගන්තියේ 1 වන උපවගන්තියෙහි "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ නැතහොත් 1977 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ ".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) යම් තැනැත්තෙකුගේ ආදායම, ධනය හෝ තෑගි පිළිබඳව සහ ඔහුට භාර්යාවක් (සම්පූර්ණයෙන් ම ව්‍යාපෘතිය ආදායමක් ලබන්නා වූ දරුවකු නොවන) දරුවකු හෝ යැපෙන නෑයකු ඇත්නම් ඒ භාර්යාවගේ, දරුවාගේ හෝ යැපෙන නෑයාගේ ආදායම හෝ ධනය පිළිබඳව වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තාට දෙන ලද ලිඛිත දැන්වීම අනුව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක නැත හොත් 96ආ (4) වන වගන්තිය යටතේ සපයන ලෙස ඔහුට නියම කරන ලද වාර්තාවක් සැපයීම ඔහු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) ඒ දැන්වීමේ නියම හෝ ඒ වගන්තියේ නියම හෝ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා දණ්ඩන වශයෙන් රුපියල් දෙසිය පණහක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස, සහ

(ආ) එම වාර්තාව නිශ්චිත කාලයක් ඇතුළත සපයන ලෙස ඒ තැනැත්තාට ලිඛිත නියමයක් කරනු ලැබිය හැකි ය. ".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) තැනැත්තකු විසින් ආදායම, ධනය හෝ තෑගි පිළිබඳ වාර්තාවක් සපයා ඇති අවස්ථාවක, තක්සේරුකරු විසින්—

(අ) වාර්තාව පිළිගෙන ඒ අනුව තක්සේරුවක් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) ඔහු වාර්තාව පිළිනොගන්නේ නම් ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ බදු අය කළ හැකි ධනයේ හෝ බදු අය කළ හැකි තෑගිවල ප්‍රමාණය ඇස්තමේන්තු කර, ඒ අනුව ඒ තැනැත්තා තක්සේරු කොට වාර්තාව පිළිනොගැනීම සඳහා වූ හේතු ඒ තැනැත්තාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය හැකි ය. ".

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අතිරේක තක්සේරු

94. යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද අය කරනු ලැබිය යුතු යම් තැනැත්තකු තක්සේරු කරනු ලැබ නොමැති බව හෝ නිසි ප්‍රමාණයට අඩුවෙන් ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබ ඇති බව හෝ තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ස්වකීය විනිශ්චය අනුව, ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුත්තේ යම් ප්‍රමාණයකට ද නැතහොත් යම් අතිරේක ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයට හෝ අතිරේක ප්‍රමාණයට තක්සේරුකරු විසින් ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකි ය. තව ද තක්සේරුව පිළිබඳ දැන්වීම, ආයාචනය සහ වෙනත් කටයුතු පිළිබඳව වූ මේ පනතේ විධිවිධාන ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව සහ ඒ යටතේ අය කරනු ලබන බද්දට අදාළ විය යුතු ය :

එසේ වුව ද—

(අ) මේ පනත යටතේ ගෙවිය යුතු, අවස්ථාවෝචිත පරිදි, ආදායම් බද්ද හෝ ධන බද්ද සම්බන්ධයෙන් හෝ යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ දී දෙනු ලැබුවා වූ ද, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන මැයි මස පහළොස් වන දින හෝ එදිනට පෙර ත්‍යාගදායකයා විසින් ඉදිරිපත් කරන ලද ත්‍යාග පිළිබඳ වාර්තාවක ඔහු විසින් සඳහන්කර ඇත්තා වූ ද යම් ත්‍යාග වෙනුවෙන් මේ පනත යටතේ ගෙවිය යුතු තෑගි බද්ද සම්බන්ධයෙන්—

(i) 1972 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු හයකට පසුව ;

(ii) පිළිවෙළින් 1972 අප්‍රේල් මස 1 වන දින, 1973 අප්‍රේල් මස 1 වන දින සහ 1974 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ වෙනුවෙන්, 1979 මාර්තු මස 31 වන දිනයට පසුව; සහ

(iii) 1975 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු තුනකට පසුව

කිසිම තක්සේරුවක් කරනු නො ලැබිය යුතු ය.

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු තක්සේරු කරනු නොලැබීම හෝ ඔහු අඩුවෙන් තක්සේරු කරනු ලැබීම වංචාව හෝ ඕනෑකමින් ම වැළහීම නිසා වන අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ඒ තක්සේරු වර්ෂයේ අවසානයෙන් පසු කවර හෝ අවස්ථාවක තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් හෝ කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් තක්සේරු කරුවකු විසින් පිළිනොගෙන ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා සම්බන්ධයෙන් තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, ඒ වාර්තාව පිළිනොගැනීම සඳහා වූ ස්වකීය හේතු ඔහු විසින් ඒ තැනැත්තාට ලිඛිතව දැනුම් දිය යුතු ය. ''.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96ආ වන වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (4) 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද අය කරනු ලැබිය යුතු සෑම තැනැත්තකු ම විසින්, ඒ බද්ද ආදායම් බද්දක් වීම, ධන බද්දක් වීම හෝ තෑගි බද්දක් වීම අනුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියෙහි ඔහුගේ ආදායම, ධනය හෝ තෑගි පිළිබඳව සහ ඔහුට භාර්යාවක්, (සම්පූර්ණයෙන් ම ව්‍යාපෘතිය ආදායමක් ලබන්නා වූ දරුවකු නොවන) දරුවකු හෝ යැපෙන නෑයකු ඇත්නම්, ඒ භාර්යාවගේ, දරුවාගේ හෝ යැපෙන නෑයාගේ ආදායම හෝ ධනය පිළිබඳව වාර්තාවක්—

(අ) ඒ තක්සේරු වර්ෂය 1978 අප්‍රේල් මස 1 වන දිනයට පෙර ආරම්භ වන අවස්ථාවක ඒ බද්දේ ත්‍රෛමාසික වාරිකය ගෙවන අවස්ථාවේ දී; සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ මැයි මස පහළොස් වන දින හෝ එදිනට පෙර

කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතුය.''.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96ඇ වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දක්, ධන බද්දක් හෝ තෑගි බද්දක් අය කරනු ලැබිය යුත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ බද්දේ ත්‍රෛමාසික වාරිකය වශයෙන් ඔහු විසින් ගෙවනු ලැබිය යුතු නිසි ප්‍රමාණයට අඩු ප්‍රමාණයක් ත්‍රෛමාසික වාරිකය වශයෙන් ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක තක්සේරුකරුගේ විනිශ්චය අනුව, ඒ තැනැත්තා විසින් ගෙවිය යුත්තේ යම් ප්‍රමාණයක් ද ඒ ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර එසේ තක්සේරු කරන ලද ප්‍රමාණය හා ඒ තැනැත්තා විසින් ගෙවන ලද ප්‍රමාණය හා අතර ඇති වෙනස වහාම ගෙවන ලෙස ද ඒ තැනැත්තාට ලිඛිත දැන්වීමකින් නියම කළ යුතු ය:

එසේ වුව ද—

(අ) මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද හෝ ධන බද්ද සම්බන්ධයෙන් හෝ යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ දී දෙනු ලැබුවා වූ ද, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන මැයි මස පහළොස් වන දින හෝ එදිනට පෙර ත්‍යාගදායකයා විසින් ඉදිරිපත් කරන ලද ත්‍යාග පිළිබඳ වාර්තාවක ඔහු විසින් සඳහන් කර ඇත්තා වූ ද යම් ත්‍යාග වෙනුවෙන් මේ පනත යටතේ ගෙවිය යුතු තෑගි බද්ද සම්බන්ධයෙන්—

(i) පිළිවෙළින් 1972 අප්‍රේල් මස 1 වන දින, 1973 අප්‍රේල් මස 1 වන දින හා 1974 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ වෙනුවෙන්, 1979 මාර්තු මස 31 වන දිනයට පසුව, සහ

(ii) 1975 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්, ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනකට පසුව

කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය;

(ආ) මේ උපවගන්තිය යටතේ තක්සේරුවක් කරනු ලැබුවේ යම් පුද්ගලයකු සම්බන්ධයෙන්ද, ඒ පුද්ගලයා සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් අතිරේක තක්සේරුවක් මේ උපවගන්තියේ ඉහතින්.වූ විධිවිධාන අනුව කරනු ලැබීම එකී ඉහතින් වූ විධිවිධාන කිසිවකින් වළක්වනු නොලැබිය යුතුය;

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු තක්සේරු කරනු නොලැබීම හෝ ඔහු අඩුවෙන් තක්සේරු කරනු ලැබීම වංචාව හෝ ඕනෑකමින් ම වැළැක්වීම නිසා වන අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලද කුමක් සඳහන්ව ඇත ද, ඒ තක්සේරු වර්ෂයේ අවසානයෙන් පසු කවර හෝ අවස්ථාවක තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් හෝ කරනු ලැබිය හැකිය;

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනත්තකු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් තක්සේරු කරුවකු විසින් පිළිනොගෙන ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා සම්බන්ධයෙන් තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, ඒ වාර්තාව පිළිනොගැනීම සඳහා වූ ස්වකීය හේතු ඔහු විසින් ඒ තැනැත්තාට ලිඛිතව දැනුම් දිය යුතුය.".

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ (12) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (12අ) ආයාචනය සම්බන්ධයෙන් ආයාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, එම සාක්ෂි පිළිබඳ වාර්තාවක් පවත්වා ගෙන යාම හෝ පවත්වා ගෙන යාමට සැලැස්වීම ඔහු විසින් කළ යුතුය."

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) 97 (7) වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ආයාචක වෙත නිකුත් කරන ලද යම් දැන්වීමක් අනුව ක්‍රියා කිරීමේ දී ඔහු විසින් සපයන ලද ලේඛන ලැයිස්තුවේ හා තැනැත්තන්ගේ නම් ලැයිස්තුවේ පිටපතක්; සහ

(ආ) 97 (12අ) වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන සාක්ෂි පිළිබඳ වාර්තාවේ පිටපතක්

මණ්ඩලය වෙත යවනු ලැබිය යුතුය.''.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ වගන්තිය ඒ වගන්තියේ (1).වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්; හස

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියම ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්:-

" (2) (අ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකු යටත් වන ධන බද්දේ, සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා යටත් වන ආදායම් බද්දේ

එකතුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ සහ මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම වන්නා වූ ද ඒ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලැබිය යුතුවූ ද (පදිංචි ස්ථාන යක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් සහනාධාරයක් හැර) යම් ලාභවල හා ආදායමේ එකතුවට වඩා සියයට අසූවකින් වැඩි වන අවස්ථාවක ඒ වැඩි ප්‍රමාණය ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු යටත් වන්නේ යම් ධන බද්දකට ද ඒ ධන බද්දට හිලව් කරනු ලැබිය යුතුය.''.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "88 (1), 107 (6) '' යන යෙදුම වෙනුවට "88 (1), 96ආ (4), 107(6)'' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: —

(අ) "කාර්මික ව්‍යාපාරය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන්: —

" 10 වන වගන්තියේ කාර්ය සඳහා "කාර්මික ව්‍යාපාරය" යන්නෙන්-

(අ ) ව්‍යාපාරයෙහි කරනු ලබන වැඩවල සැහෙන කොටසක කාර්යය සඳහා යන්ත්‍රානුසාර ක්‍රම පාවිච්චි නොකරනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නා වූ ව්‍යාපාරයක් නොවන, යම් භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කිරීම සඳහා වූ හෝ සෑදීම සඳහා වූ හෝ යම් භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය යන්ත්‍රානුසාර ක්‍රම මඟින් යම් ක්‍රියා පද්ධතියකට යටත් කිරීම සඳහා හෝ පතල් කැණීම සඳහා හෝ මුද්‍රණය කිරීම සඳහා හෝ යන්ත්‍ර හෝ වාහන හෝ යාත්‍රා අලුත්වැඩියා කිරීම සඳහා වූ ව්‍යාපාරයක්, හෝ

(ආ) තැනැත්තන් හෝ බඩු ප්‍රවාහණය කිරීම සඳහා වූ ව්‍යාපාරයක්, හෝ

(ඇ) අක් වෙරළෙහි හෝ ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම සඳහා වූ ව්‍යාපාරයක්

අදහස් වේ;''; තවද

(ආ) " අඩු කළ අගය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන්:-

'" අඩු කළ අගය" යන්නෙන්, 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර මිලට ගන්නා ලද පිරියත, යන්ත්‍රොපකරණ හෝ සවිකිරීම් කිසිවක් සම්බන්ධයෙන් වූ විට හෝ විධානයෙහි සඳහන් පරිදි මාර්තු මස තිස් එක් වන දිනය නොවන යම් නිශ්චිත දිනයක් දක්වා ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කළ යුතු යයි 12(2) වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් විධාන කරනු ලැබ ඇති අවස්ථාවක, 1957 අප්‍රේල් මස 1 වනදින ආරම්භවන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඒ නිශ්චිත දිනයට පෙර, මිළට ගන්නා ලද පිරියත, යන්ත්‍රෝප කරණ හෝ සවිකිරීම් කිසිවක් සම්බන්ධයෙන් වූ විට එම පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් ඔහු විසින් මිලට ගනු ලැබූ දින පටන්, එහෙත් 1977 මාර්තු මස 31 වන දිනට පෙර, එම පිරිතේ, යන්ත්‍රෝපකරණවල හෝ සවිකිරීම්වල සිදුවී ඇති සම්පූර්ණ අගය ක්ෂයවීම නියෝජනය වන මුදලක සහ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයේ අතුරු ඡේදය යටතේ අඩු කරන ලද යම් මුදලක එකතුව අඩු කිරීමෙන් පසු, එහි අයිතිකරුට දැරීමට සිදු වූ එහි පිරිවැයෙහි ශේෂය අදහස් වේ. ආදායම් බදු ආඥා පනතේ 11 (1) වන වගන්තියේ, (ඇ) (1) ඡේදය හෝ (ඉ) (1) ඡේදය යටතේ ඒ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ සවිකිරීම් සම්බන්ධයෙන් යම් අඩු කිරීමකට ඉඩ හරිනු ලැබූ අවස්ථාවක, ඒ පිරිවැයෙහි නියම ගණන හා ඒ අඩු කිරීමේ ගණන හා අතර වෙනසේ ප්‍රමාණය ඒ පිරිවැය ලෙස සැල කිය යුතුය;'.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) නිර්වාසික පුද්ගලයන්ට අදාළ කරුණෙහි—

(අ) (ඊ) ඡේදයෙහි "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්:—

" 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඉන් ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා''; සහ

(අ) (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

" (උ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් තක්සේරු වර්ෂය සඳහා—

බදු අය කළ හැකි ආදායමේ පළමුවන රු. 15,000 සඳහා සියයට 15

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 20

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 25

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 30

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 40

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 50

බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 6,000 සඳහා සියයට 60

බදු අය කළ හැකි ආදායමේ ඉතිරි මුදල සඳහා සියයට 70;" සහ;

(2) " (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩුවලට" අදාළ කරුණ වෙනුවට පහත දක්වෙන අළුත් කරුණ ආදේශ කිරීමෙන්:—

" (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩුවල—

ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන ආණ්ඩුවල බදු අය කළ හැකි ආදායම—

(අ) 1965 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා— සියයට 63

(ආ) 1965 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1978 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා—සියයට 56

(ඇ) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා—සියයට 66.".

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපලේඛනයේ VII වන කොටසෙහි "1976 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන වෙනුවට පහත දැක්වෙන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්:—

" 1976 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඉන් ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා"; සහ

(2) ඒ උපලේඛනයේ VII වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන්:—

"VIII වන කොටස

1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දක්වෙන පරිදි විය යුතුය:—

බදු අය කළ හැකි ආදායමේ පළමුවන රු. 1,800 සඳහා සියයට 7 1/2
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 1,800 සඳහා සියයට 10
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 12 1/2
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 15
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 20
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 25
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 30
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 3,600 සඳහා සියයට 35
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 4,800 සඳහා සියයට 40
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 7,200 සඳහා සියයට 45
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 7,200 සඳහා සියයට 50
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 7,200 සඳහා සියයට 55
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 7,200 සඳහා සියයට 60
බදු අය කළ හැකි ආදායමේ ඊළඟ රු. 7,200 සඳහා සියයට 65
බදු අය කළ හැකි ආදායමේ ඉතිරි මුදල සඳහා සියයට 70."

45. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ.:—

"හයවන උපලේඛනය

I වන කොටස

1965 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1978 අප්‍රේල් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ දී දෙන ලද තෑගි වෙනුවෙන් වූ තෑගි බද්ද, 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළදී දෙන ලද තෑගි සඳහා බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමෙන් පළමු වන රු. 50,000 සඳහා වූ බදු අනුප්‍රමාණය පස්වන උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් සියයට 5 වෙනුවට සියයට 3 විය යුතුය යන වෙනස් වීමට යටත් ව, ඒ උපලේඛනයේ ඒ කොටසෙහි සඳහන් බදු අනුප්‍රමාණය ම හෝ බදු අනුප්‍රමාණයන් ම අනුව විය යුතුය.

II වන කොටස

1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ දී දෙන ලද තෑගි සඳහා තෑගි බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:—

බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ පළමුවන රු. 50,000 සඳහා නැත.
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 30,000 සඳහා සියයට 5
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 30,000 සඳහා සියයට 7 1/2
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 30,000 සඳහා සියයට 10
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 40,000 සඳහා සියයට 13
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 50,000 සඳහා සියයට 14
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා සියයට 16
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 100,000 සඳහා සියයට 18
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා සියයට 24
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා සියයට 30
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 1,25,000 සඳහා සියයට 32
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 1,25,000 සඳහා සියයට 36
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා සියයට 42
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 3,50,000 සඳහා සියයට 48
බදු අය කළ සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 5,00,000 සඳහා සියයට 55
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඊළඟ රු. 6,00,000 සඳහා සියයට 60
බදු අය කළ හැකි සියලු තෑගිවල වටිනාකමේ ඉතිරි මුදල සඳහා සියයට 70".

# 1978 අංක 5 දරන බදු සමා පනත

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

**තැනැත්තකු විසින් ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැත්තාවූ හෝ ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ එම තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තාවක හෙළිදරව් කර නොමැත්තා වූ සංචිත ලාභ සහ ආදායම දක්වෙන මුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශේෂ ගිණුම්වල තැන්පත් කිරීමට අවස්ථාව සැලසීම පිණිස ද එම විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් සම්බන්ධයෙන් බද්දක් පනවා අය කිරීම පිණිස ද එම විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් නිශ්චිත කාර්යයන් සඳහා ආපසු ලබාගැනීමට අවස්ථාව සැලසීම පිණිසද, එම විශේෂ ගිණුම්වල මුදල් තැන්පත් කරන තැනැත්තන්, එම මුදලින් දක්වෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඇතැම් බදු ගෙවීමට යටත් වීමෙන් සහ එම ලාභ සහ ආදායම් වලට අදාළ වැරදි සඳහා නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂා කරනු පිණිසද, ඒවාට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කරුණු සඳහාද වූ පනතකි.**

1. මේ පනත 1978 අංක 5 දරන බදු සමා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 1978 දෙසැම්බර් මස 1 වන දින සිට එය ක්‍රියාත්මක විය යුතුය.

2 (1) ආදායම් බදු පැනවීමට අදාළ ව තත් කාලයෙහි බලපවත්නා නීතිය යටතේ 1977 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම වෙනුවෙන් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බද්දක් ගෙවීමට යටත් වන්නා වූ ද එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම නීතියේ විධිවිධාන යටතේ ආදායම් වාර්තාවක් සපයා නොමැත්තා වූ හෝ එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම පනතේ විධිවිධාන යටතේ තමා විසින් සපයන ලද යම් වාර්තාවක එම ලාභ හෝ ආදායම හෙළිදරව් කිරීම පැහැර හැර ඇත්තාවූ ද යම් තැනැත්තකුට, (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව මේ පනත අදාළ විය යුතුය.

(2) 1977 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් තත් කාලයේ ආදායම් බදු පැනවීමට අදාළ නීතියේ විධිවිධාන යටතේ ගෙවිය යුතු යම් බද්දක් මගහැරියේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ විමර්ශන ආරම්භකර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(3) (2) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ වන තැනැත්තකු නොවන (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම තැනැත්තෙකුම, මින්මතු මේ පනතෙහි ''මේ පනත අදාළ වන තැනැත්තකු'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

3. මේ පනත අදාළ වන යම් තැනැත්තකුට 1977 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ ලාභ හෝ ආදායම දක්වෙන මුදල් ඇත්තාවූද තත් කාලයේ ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ—

(අ) ඒ සම්බන්ධයෙන් ආදායම් වාර්තාවක් සැපයීම ඒ තැනැත්තා විසින් පැහැර හැර තිබෙන්නා වූ; නැතහොත්

(ආ) ඒ තැනැත්තා විසින් සපයන ලද යම් ආදායම් වාර්තාවක එය හෙළිදරව් කිරීම ඔහු විසින් පැහැර හැර ඇත්තාවූ ද

අවස්ථාවක, එම තැනැත්තා විසින් එම මුදල, 1979 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ඔහු විසින් එම කාර්යය සඳහා නිශ්චය කරනු ලබන එවැනි යම් විශේෂ ගිණුමක තමාගේ බැරට බැංකුවෙහි තැන්පත් කළ හැකිය.

4. (1) 3 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකුවේ විශේෂ ගිණුමෙහි මුදල් තැන්පත් කරන සෑම තැනැත්තකු ම —

(අ) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙහි වූ ප්‍රකාශයක් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය; තවද

(ආ) එසේ තැන්පත් කරන ලද මුදලින් සියයට 30 කට සමාන මුදලක බද්දක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට යටත් විය යුතුය.

(2) යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද 3 වන වගන්තියෙහි සඳහන් පරිදි එවැනි යම් විශේෂ ගිණුමක එම තැනැත්තාගේ බැරට තිබෙන මුදල්වලින් බැංකුව විසින් 1979 අප්‍රේල් මස 30 දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතුය.

(3) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට තිබෙන්නා වූ මුදල්වලින් (2) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට බද්ද ගෙවීමට එම තැනැත්තා විසින් බලය දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බද්ද එම තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවන ලද සේ සලකනු ලැබිය යුතුය.

5. 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, 6 වන වගන්තියෙහි නිශ්චිත කාර්යයන් සඳහා හැර, 4 වන වගන්තියෙහි සඳහන් බද්දක් ගෙවීමෙන් පසුව එම විශේෂ ගිණුමෙහි එම තැනැත්තාගේ බැරට ඇති ඉතිරිව ඇති සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් (එම ඉතිරි මුදලට එකතුවන පොලිය හැර) 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආපසු ලබා ගැනීමට වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇතද බැංකුව විසින් ඉඩ නොදිය යුතුය.

6 (1) 3 වන වගන්තියෙහි සඳහන් පරිදිවූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවීමෙන් පසුව එම විශේෂ ගිණුමෙහි ඔහුගේ බැරට ඉතිරිව ඇති මුදල 1983 මාර්තු මස 31 වන දිනට පසුව ආපසු ලබා ගත හැකිය;

එසේ වුවද එම සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් —

(අ) (i) 1963 අංක 4 දරන දේශීය ආදයම් පනතේ 16 ඇඇ වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමාගමක;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹ ඇති යම් සමාගමක

සාමාන්‍ය කොටස් මිලට ගැනීම සඳහා: හෝ

(ආ) 1963 අංක 4 දරන දේශීය ආදයම් පනතේ 16ඊ වන වගන්තියේ අර්ථානුකූලව යම් අනුමත වියදමක් කිරීමේ කාර්යය සඳහා ; හෝ

(ඇ) ගෙයක් මිලට ගැනීම හෝ ඉදි කිරීම, සිය අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් මගින් ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් අනුමතකර ඇත්නම් එම ගෙය මිලට ගැනීම හෝ ඉදි කිරීම සඳහා

එම තැනැත්තා විසින් 1979 අප්‍රේල් මස 30 වන දිනයෙන් පසුව ආපසු ලබාගනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි කාර්ය සඳහා, ගෙයක් මිලට ගැනීම හෝ ඉදිකිරීම අනුමත කිරීම ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා වක, එම ප්‍රතික්ෂේප කිරීම නිසා අතෘප්තියට පත් යම් තැනැත්තකුට නිවාස විෂයය භාර අමාත්‍යවරයාවෙත ඒ සම්බන්ධයෙන් අභියාචනය කළ හැකිය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

(3) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක තමාගේ බැරට තිබෙන මුදල් 6 වන වගන්තියේ අතුරු වගන්තියෙහි නිශ්චිත යම් කාර්යයක් සඳහා 1979 අප්‍රේල් මස 30 වන දිනට පසුව ආපසු ලබාගන්නා යම් තැනැත්තකු, ඒ මුදල් ආපසු ලබාගන්නා ලද කාර්ය සඳහා ඒ මුදල් යොදා ගැනීම පැහැර හරින අවස්ථාවක, එම තැනැත්තා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතුය. තවද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ආපසු ලබාගන්නා ලද මුදලට සමාන වන්නා වූ මුදලකට සහ රුපියල් විසි දහසකට වැඩි නොවන්නා වූ දඩයකට ඔහු යටත් විය යුතුය,

(4) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක තමාගේ බැරට තිබෙන මුදල් 1979 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආපසු ලබාගෙන 6 වන වගන්තියේ අතුරු වගන්තියෙහි නිශ්චිත කාර්යයන්ගෙන් කිසිවක් සඳහා ඒ මුදල් යොදා ගන්නා වූ යම් තැනැත්තකුගේ 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමේදී, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇතද, එසේ යොදවන ලද මුදල් වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය.

7. 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවීමෙන් පසුව, 3 වන වගන්තියෙහි සඳහන් පරිදිවූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට තිබෙන ඉතිරි මුදල සම්බන්ධ යෙන් වෙනත් ඉතිරිකිරීමේ ගිණුම්වල බැරට ඇති මුදල් මත බැංකුව විසින් ගෙවිය හැකි පවත්නා පොලී ප්‍රමාණය අනුව පොලියක් බැංකුව විසින් ගෙවිය යුතුය. එසේ උපචිත වන පොලිය එම තැනැත්තා විසින් 1979 අප්‍රේල් මස 30 වන දිනයෙන් පසුව ආපසු ලබාගනු ලැබිය හැකිය.

8. 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කරනු ලැබුවාවූ ද, 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවා ඇතැයි ඒ වගන්තිය යටතේ සලකනු ලබන්නා වූද මේ පනත අදාළ වන යම් තැනැත්තකු —

(අ) ඒ මුදලින් දැක්වෙන ලාභ හෝ ආදායම හෝ ධනය වෙනුවෙන් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(i) තත් කාලයෙහි ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ යම් ආදායම් බද්දක් නැත හොත් ධන බද්දක්; හෝ

(ii) 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත යටතේ ප්‍රාග්ධන බද්දක්

ගෙවීමට හෝ, 1977, මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් කාර්තුවක් සඳහා, එම ලාභ වලින් හෝ ආදායමෙන් ලැබූ පිරිවැටුම සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ගෙවීමට; හෝ

(ආ) ඒ මුදලින් දක්වෙන ලාභ හෝ ආදායම හෝ ධනය වෙනුවෙන් හෝ ඒ ලාභ හෝ ආදායම ලැබුණේ යම් පිරිවැටුමකින්ද ඒ පිරිවැටුම වෙනුවෙන් හෝ ඒ ලාභ වලට, ආදායමට, ධනයට හෝ පිරිවැටුමට අදාළව හෝ 1977 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් ඇතහොත් 1977 අප්‍රේල් මස 1 වන දිනට පූර්වයෙන් වූ යම් කාල සීමාවක් සම්බන්ධයෙන්, තත් කාලයෙහි ආදායම් බදු පැනවීමට අදාළ නීතිය හෝ 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත හෝ 1963 අංක 11 දරන මුදල් පනත හෝ යටතේ යම් වරදක් සඳහා නඩු පවරනු ලැබීමට යටත් නොවිය යුතුය.

9. තත් කාලයෙහි ආදායම් බදු පැනවීමට අදාළ නීතියෙහි විධිවිධාන යටතේ 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර කරන ලද යම් තක්සේරුවක් හෝ එකී විධිවිධාන යටතේ අවසානාත්මක හා තීරණාත්මක වී ඇති වෙනත් යම් කාරණාවක් හෝ සංශෝධනයක් කිරීමට ඉහත දක්වෙන විධිවිධාන කිසිවකින් බලය පැවරෙන ලෙසට කියවා තේරුම් නොගත යුතුය.

10. (1) මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී තමන්ට දැනගන්නට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් බැංකුවේ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්ද රහස්‍යතාව රැකිය යුතු අතර, රහස්‍යතාව රැකීමට ආධාර කළ යුතුය;

එසේ වුවද බැංකුවෙහි යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්; 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ යම් විශේෂ ගිණුමකට අදාළ පහත දක්වෙන විස්තර, මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත හෝ යම් අධිකරණයක් වෙත දන්වා සිටිය හැකිය :—

ඒ විස්තර නම් —

(අ) ගිණුම දරන්නාගේ නම සහ ආදායම් බදු ලිපි ගොනුවේ අංකය;

(ආ) යම් වෙළෙඳ ව්‍යාපාරයක් වේනම් එහි නම සහ ආදායම් බදු ලිපිගොනුවේ අංකය ;

(ඇ) මුදල් තැන්පත් කළ දිනය හෝ ආපසු ලබාගත් දිනය ;

(ඈ) තැන්පත් කළ හෝ ආපසු ලබාගත් මුදල;

(ඉ) එම විශේෂ ගිණුමට අදාළව 4 (1) (අ) වන වගන්තිය යටතේ යම් ප්‍රකාශයක සඳහන් වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන වලට පටහැනිව ක්‍රියා කරන, බැංකුවෙහි හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත්විය යුතුය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස; මේ පනතෙහි —

"කොමසාරිස් ජනරාල්වරයා", "ලාභ", "ආදායම" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම් වලට 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි පිළිවෙළින් ඒ සඳහා ඇති අර්ථයම විය යුතුය.

"බැංකුව" යන්නෙන් 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුව අදහස්වේ ;

"තත් කාලයෙහි ආදායම් බදු පැනවීමට අදාළ නීතිය" යන්නෙන් ආදායම් බදු ආඥාපනත හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදහස්වේ ; තවද

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් සහ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.

## උපලේඛනය

### 1978 අංක දරන බදු සමා පනත
4 (1) (අ) වන වගන්තිය යටතේ ප්‍රකාශය

ආදායම් බදු ලිපිගොනුවක් තිබේනම් එහි අංකය:.........................................

විශේෂ සමාලාභි ඉතිරිකිරීමේ තැන්පත් ගිණුම් අංකය :...................................

වෙළඳ ව්‍යාපාරයක් තිබේනම් එහි නාමය:..........................................................

දිනය:....................................................

..........................................................................................................................

(ලිපිනය)

..................................හි ........................................................................

(සම්පූර්ණ නම)

.......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය වන මම/අපි

(1)(අ) .......................................................................................................හි

.......................................................................................................................ගේ

නමින් විශේෂ සමාලාභි ඉතිරිකිරීමේ තැන්පත් ගිණුමක තැබීම සඳහා රුපියල්

............................ (රු.....................)ක් 1978 අංක දරන බදු

සමා පනත ප්‍රකාර භාර ගන්නා ලෙසත්

(ආ) මේ මුදල මත ගෙවිය යුතුව ඇති රුපියල් ........................ (රු ..................)ක් වන්නා වූ බද්ද කෙළින් ම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන ලෙසත්

(ඇ) ඒ ගිණුමෙහි ඉතිරි මුදල රඳවා ගන්නා ලෙසත් මෙයින් ඔබගෙන් ඉල්ලා සිටිමි/සිටිමු,

එනම් —

| | |
|---|---|
| ඉදිරිපත් කරන ලද මුදල | රු..................... |
| අඩුකළ යුතු 30% බද්ද අඩු කරන්න | රු..................... |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විශේෂ සමාලාභි ඉතිරිකිරීමේ තැන්පත් ගිණුමෙහි රඳවාගත යුතු ඉතිරි මුදල | රු..................... |

(2) ඉහත සඳහන් පනතෙහි 6 වන වගන්තියෙහි නිශ්චිත කාර්යයන් සඳහා හැර, මේ ඉතිරි මුදලින් කිසිම කොටසක් 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආපසු ලබා නොගන්නා බවට මම/අපි පොරොන්දු වෙමි/වෙමු.

(3) මගේ/අපගේ විශේෂ සමාලාභි ඉතිරිකිරීමේ තැන්පත් පාස් පොත ඔබගේ බැංකුවේ ආරක්ෂා භාරයෙහි තැබීමට එකඟ වෙමි/වෙමු.

(4) තත් කාලයෙහි ඔබගේ බැංකුවේ ඉතිරිකිරීමේ තැන්පත් වලට අදාළ වන සහ කලින් කල ක්‍රියාත්මක වන රීතිවලින් බැඳී සිටීමට ද වැඩි දුරටත් මම/අපි එකඟ වෙමි/වෙමු,

.............................................

තැන්පත්කරුගේ අත්සන.

මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

.............................................

ශාඛා කළමනාකරුගේ අත්සන.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

## 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 11 වන දින]

**ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව පිහිටුවීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

### I වන කොටස

### ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සංයුතිය

**2.** (1) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව යනුවෙන් හැඳින්වෙන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් පිහිටුවිය යුතුය.

(2) (1) වන උප වගන්තියෙහි සංස්ථාවට දී ඇති නමින් එය සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් නඩු පැවරීම හා නඩු පවරනු ලැබීමද කළ හැකි විය යුතුය.

(3) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවිය යුතු අතර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංස්ථාව විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ශාඛා කාර්යාල පිහිටුවිය හැකිය.

**3.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය හා පරිපාලනය, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරෙන්නේය.

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා පත්කරනු ලබන සභාපතිවරයෙක්;

(ආ) මූල්‍ය මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයෙක්;

(ඇ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිලධරයෙක්;

(ඈ) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්; සහ

(ඉ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්.

(2) මේ පනතේ III වන කොටසේ විධිවිධාන මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ වන්නේය.

**4.** අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව සංස්ථාවේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම මණ්ඩලය විසින් කළ හැකි අතර ඒ විධාන පිළිපැදීම මණ්ඩලයේ යුතුකම වන්නේය.

## II වන කොටස

## අරමුණු, බලතල හා කාර්ය

5. සංස්ථාවේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතුය:—

(1) භාණ්ඩ සහ සේවා අපනයනය කරන්නන්ට ලැබිය යුතු ගෙවීම් වාණිජ හෝ වාණිජ නොවූ අහඹුවල ප්‍රතිඵලයක් වශයෙන් නොලැබීම හෝ ප්‍රමාද වී ලැබීම සම්බන්ධයෙන් ඔවුන්ට රක්ෂණ ඔප්පු නිකුත් කිරීම;

(2) නැව්ගත කිරීමට පෙර හෝ නැව්ගත කිරීමෙන් පසු අවශ්‍ය මුදල් දීම පහසු කරලීම පිණිස බැංකුවලට හා වෙනත් මූල්‍ය ආයතනවලට ඇප නිකුත් කිරීම;

(3) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් හෝ ආයතනයක් විසින් විදේශීය තැනැත්තන් හෝ ආයතන වෙත අපනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් නැතහොත් ඒ තැනැත්තන්ට හෝ ආයතනවලට ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ඉටු කළ යුතු සේවා කිසිවක් විධිමත් ලෙස ඉටු කිරීම සඳහා ඒ තැනැත්තන් වෙත හෝ ආයතන වෙත ඇප නිකුත් කිරීම;

(4) භාණ්ඩ සහ සේවා ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම, දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අපනයනය කරන්නන්ට මුදලින් ආධාර සැපයීම;

(5) විදේශීය රටවල අලෙවි සමීක්ෂණ, ප්‍රචාරය කිරීම සහ වෙනත් ප්‍රවර්ධනාත්මක පියවර කිසිවක් භාර ගැනීමෙහි ලා දැරීමට සිදුවිය හැකි පාඩු සම්බන්ධයෙන් අපනයනය කරන්නන්ට ඇප සැලසීම;

(6) අපනයන දියුණු කිරීම සඳහා බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් දෙනු ලබන ණය පහසුකම් සම්බන්ධයෙන් ඒ බැංකු වලට සහ ආයතන වලට ප්‍රතිමූල්‍ය සැපයීම සහ ප්‍රතිමූල්‍ය ලබා දීමේ පහසුකම් සැලැස්වීම;

(7) ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම දියුණු කිරීම සඳහා විදේශවල දී අලෙවි අධ්‍යයන කටයුතු භාර ගැනීම, අපනයනය දියුණු කිරීමේ විවිධ අංශ පිළිබඳ සම්මන්ත්‍රණ හා පාඨමාලා පැවැත්වීම, සහ අලෙවි කිරීමේ හැකියාවන් මෙන්ම අලෙවි කිරීමේ කාර්ය පටිපාටි සම්බන්ධ තොරතුරු රැස්කොට ප්‍රචාරය කිරීම;

(8) රක්ෂණ හා ඇප සම්පාදනය, ජාතික ශුභසිද්ධිය සඳහා අවශ්‍ය යයි ආණ්ඩුව විසින් සලකනු ලබන වගකීම් භාරගැනීම හා කාර්ය ඉටු කිරීම යන මෙහි ලා ආණ්ඩුවේ නියෝජිතයකු ලෙස නැතහොත් ආණ්ඩුවේ අනුමතය ඇතිව තමන් වෙනුවෙන්ම ක්‍රියා කිරීම;

(9) අපනයන විවිධාකරණයට හා අපනයන පුළුල් කිරීමටත් අළුත් වෙළෙඳ පොලවල් සොයා ඔවුන්ගේ භාණ්ඩ පිටරටවල දී තරඟකාරී ගෙවුම් කොන්දේසි අනුව විකිණීමටත් අපනයනය කරන්නන්ට උපකාරීවීම; සහ

(10) ස්වකීය අරමුණු කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය යයි සංස්ථාව විසින් සැලකිය හැකි වෙනත් කර්තව්‍ය ඉටු කිරීම.

6. ස්වකීය අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ල හෝ ඒවායින් කිසිවක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකිය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හා දැරීම මෙන්ම සංස්ථාව විසින් අත්කර ගනු ලැබූ හෝ දරනු ලැබූ යම් දේපළක් බැහැර කිරීම;

(ආ) විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු හෝ වෙනත් ගනුදෙනු කළ හැකි හෝ පැවරිය හැකි සාධන පත්‍ර පිළියෙල කිරීම, සෑදීම, භාර ගැනීම, වට්ටම් කිරීම, ලියා අත්සන් කිරීම, පිටසන් කිරීම, නිකුත් කිරීම හා ගනුදෙනු කිරීම;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි නියම හා කොන්දේසි පිට ණය ලබා ගැනීම;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය හා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංස්ථාව විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආණ්ඩුවේ උචිත සුරැකුම්පත්වල සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම;

(ඉ) යම් ආයෝජනයක් ආරක්ෂා කිරීම හෝ එහි ඵල සිද්ධිය සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල විය හැකි සියලුම පියවර ගැනීම;

(ඊ) අපනයන පුළුල් කිරීම වැඩිදියුණු කිරීම සඳහා අපනයනය කරන්නන්ට, බැංකු වලට හෝ වෙන යම් තැනැත්තකුට ඇප ඇතිව හෝ නැතිව ණය වශයෙන් මුදලින් ආධාර සැපයීම;

(උ) සංස්ථාවේ වැඩ කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම;

(ඌ) සංස්ථාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එහි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම පිණිස පවරා දීම අවශ්‍ය යයි සංස්ථාව විසින් සැලකිය හැකි සංස්ථාවේ කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් එහි යම් සාමාජිකයකුට හෝ නිලධරය කුට පවරා දීම;

(එ) සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරන ලද තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම, ඒ අරමුදලට දායක මුදල් ගෙවීම හා සේවකයන්ගේ මෙන්ම ඔවුන්ගෙන් යැපෙන්නන්ගේද ශුභ සාධනය සඳහා ණය, විශ්‍රාම වැටුප් හෝ වෙනත් ගෙවීම් ප්‍රදානය කිරීමට විධිවිධාන සැලැස්වීම;

(ඒ) සංස්ථාවේ නිලධරයන්, සේවකයන් හා නියෝජිතයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් පාලනය කිරීම සහ සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වූ සියලු කරුණු මෙහෙයවීම සහ තීරණය කිරීම;

(ඔ) එහි අරමුණු ඉටුකර ගැනීමට හා සපුරා ලීමට අවශ්‍ය හෝ ආනුෂංගික විය හැකි සියලුම ගිවිසුම් වලට බැඳී ඒවා ඉටු කිරීම;

(ඕ) සංස්ථාව විසින් නිකුත් කරන ලද යම් රක්ෂණ ඔප්පුවකින් හෝ ඇපවීමකින් උද්ගතවන යම් බැඳීමක් යම් රක්ෂණ කරුවකු සමග හෝ සංවිධානයක හෝ යම් ආණ්ඩුවක ප්‍රතිරක්ෂණය කිරීම හා වෙනත් රක්ෂණ කරුවන්ට ප්‍රතිරක්ෂණ ඉදිරිපත් කිරීම;

(ක) ප්‍රාදේශික හෝ අන්තර්ජාතික අපනයන ණය රක්ෂණ හෝ ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමවලදී වෙනත් රක්ෂණ කරුවන් සමග එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම;

(ග) ස්වකීය නිලධරයන්ට හා සේවකයන්ට කළමනාකාර, කාර්මික හා පරිපාලන පුහුණුව ලබාදීම;

(ච) ශ්‍රී ලංකාව තුළ හෝ එයින් පිටත යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් ආයතනයකට කළමනාකාර, කාර්මික හෝ පරිපාලන උපදෙස් හා සේවා ලබාදීම; සහ

(ජ) එහි අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ උපයෝගී වන සෙසු සියලුම දේ කිරීම.

## III වන කොටස

## අධ්‍යක්ෂ මණ්ඩලය

7. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන තැනැත්තකු වුවහොත්;

(ආ) සංස්ථාව විසින් හෝ වෙනුවෙන් ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වාසියක් කෙළින්ම හෝ අන් අයුරකින් දරන නැතහොත් භුක්ති විඳින තැනත්තකු වුවහොත්; හෝ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තම කාර්ය ඉටු කිරීමට හානි කර ලෙස බලපෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇතිව සිටියහොත්,

ඔහු මණ්ඩලයේ සභාපති ලෙස හෝ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට නැතහොත් එලෙසින් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතුය.

8. 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ සෑම සාමාජිකයකුම, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් නැතහොත් ඉවත් කරනු ලැබීමෙන් කලින් තම ධුරය හිස් කළහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර නැවත තෝරා පත්කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

9. මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් කවර වූ හෝ වේලාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

10. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සභාපති හෝ වෙනත් සාමාජිකයකු කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

එසේ වුවද කිසිම සාමාජිකයකු, ඒ සාමාජිකයා පත් කිරීමේදී අදහස් විමසනු ලැබුවේ යම් අමාත්‍යවරයකුගෙන් ද ඒ අමාත්‍යවරයාගේ අදහස් නොවිමසා හෝ ඒ සාමාජිකයා පත් කරනු ලැබුවේ යම් අමාත්‍යවරයකු හෝ බලධරයකුගේ නම් කිරීම නිසා නම් ඒ අමාත්‍යවරයාගේ නැතහොත් බලධරයාගේ අදහස් නොවිමසා ඒ සාමාජිකයා මේ උප වගන්තිය යටතේ අස් නොකළ යුතුය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු තම ධුරය හිස් කළහොත් එවිට හෝ ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් එවිට හෝ අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන අනුව ඒ සාමාජිකයා පත්කරනු ලැබූ ආකාරයෙන්ම වෙන තැනැත්තකු පත්කළ හැකිය. ඒ සාමාජිකයා වෙනුවට පත්කරනු ලබන යම් තැනැත්තකු තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඒ ධුරය දැරිය යුතුය.

(3) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් කරුණක් හේතු කොටගෙන මණ්ඩලයේ යම් සාමාජිකයකුට තම ධුරයෙහි කාර්ය ඉටුකිරීම තාවකාලිකව කළ නොහැකි වුවහොත්, ඒ කාලසීමාව තුළ ඔහු වෙනුවට වැඩ බැලීමට, ඒ සාමාජිකයා 3 වන වගන්තියේ විධිවිධාන අනුව පත්කරනු ලැබූ ආකාරයෙන්ම අමාත්‍යවරයා විසින් වෙන යම් තැනැත්තකු පත්කළ හැකිය.

11. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ සභාපතිට හෝ යම් සාමාජිකයකුට සංස්ථාවේ අරමුදලින් ගෙවිය හැකිය.

12. (1) මණ්ඩලයේ සියලුම රැස්වීම් වලදී, මණ්ඩලයේ සභාපති පැමිණ සිටී නම්, ඔහු විසින් මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපති පැමිණ නොසිටී නම්, ඒ රැස්වීමේ මුලසුන දැරීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් එක් සාමාජිකයකු තෝරා ගත යුතුය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඒ මණ්ඩලයේ රැස්වීම් වලට සම්බන්ධ කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම මණ්ඩලය විසින් විධිමත් කළ හැකිය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමකදී තීරණය කිරීමට ඇති සියලුම ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය. ඡන්ද සම වූ අවස්ථාවක, මූලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතුය.

13. සංස්ථාව විසින් කරනු ලබන හෝ කිරීමට අදහස් කරනු ලබන යම් කටයුත්තක් සම්බන්ධයෙන් කෙලින්ම හෝ අන් අයුරකින් යම් සම්බන්ධතාවක් ඇති යම් සාමාජිකයකු විසින්, ඒ කටයුත්ත මණ්ඩලයේ රැස්වීමකදී සාකච්ඡාවට ගනු ලබන අවස්ථාවක, ඒ සම්බන්ධතාවෙහි ස්වභාවය අනාවරණය කළ යුතුය. ඒ අනාවරණය මණ්ඩලයේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර ඒ කටයුත්ත සම්බන්ධයෙන් මණ්ඩලයේ කිසිම සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවී ඒ සාකච්ඡාව පැවැත්වෙන අතරතුර හෝ ඒ තීරණය කරනු ලබන විට, ඒ රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතුය.

14. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබූ පමණින් නැතහොත් එහි සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබූ පමණින්, එහි කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතුය.

15. (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් සංස්ථාවේ මුද්‍රාව වෙනස් කළ හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රය අත්සන් කළ යුතුය.

## IV වන කොටස

## මුදල්

16. (1) සංස්ථාවේ අනුදත් ප්‍රාග්ධනය රුපියල් පනස් ලක්ෂයක් විය යුතු අතර එයින් රුපියල් විසිපත් ලක්ෂයක් ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ආරම්භයේ දී සමානුපාතිකව ගෙවිය යුතුය.

(2) අනුදත් ප්‍රාග්ධනයේ ශේෂය වන රුපියල් විසිපත් ලක්ෂය, මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කරගනු ලැබූ කල්හි සංස්ථාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සමානුපාතිකව ලබාගත යුතුය.

(3) සංස්ථාවේ අනුදත් හා ගෙවා නිමි ප්‍රාග්ධනය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය හා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයකින් කලින් කල වැඩි කළ හැකිය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් පරිදි ප්‍රාග්ධනය යම් මුදල් ප්‍රමාණයකින් වැඩි කරන ලද්දේ ද ඒ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වාරික ගණනකින් සංස්ථාවට ගෙවිය යුතුය.

17. (1) අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට මුදල් විෂයය භාර අමාත්‍යවරයා, විසින්, සංස්ථාව විසින් නිකුත් කැරුණු රක්ෂණ ඔප්පු හා ඇප සම්බන්ධයෙන් සංස්ථාවේ බැඳීම ඔහු විසින් තීරණය කළ හැකි යම් ප්‍රමාණයක් දක්වා සහතික කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද ඇපයක් පියවීම සඳහා අවශ්‍ය යම් මුදලක් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.

(3) සංස්ථාව විසින් නිකුත් කරනු ලැබ ඇති රක්ෂණ ඔප්පු හෝ ඇප කිසිවක් සම්බන්ධයෙන් සංස්ථාවේ අවම සංචිත ඉක්මවා යන යම් ඉල්ලීමක් ගෙවීම සඳහා මණ්ඩලයේ යෝජනාවක් අනුව, සංස්ථාව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කළහැකි යම් කොටසක් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇප ප්‍රමාණයෙන් ලබාගත හැකිය.

18. සංස්ථාව විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු හා ඇප යටතේ සංස්ථාව විසින් වගකීම භාරගත හැකි උපරිම සීමාව මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කළ යුතුය.

19. (1) සංස්ථාවට ස්වකීය වූ අරමුදලක් තිබිය යුතුය.

(2) පහත සඳහන් මුදල් අරමුදලට ගෙවිය යුතුය:—

(අ) 16 වන හා 17 වන වගන්ති යටතේ සංස්ථාවට ගෙවනු ලබන යම් මුදලක්;

(ආ) සංස්ථාව විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු හා ඇප සම්බන්ධයෙන් වාර මුදල් වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල්;

(ඇ) ප්‍රදාන වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල්; හා

(ඈ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම යන මෙහිලා සංස්ථාවට ලැබෙන අයකර ගැනීම් හා ගාස්තු ඇතුළුව සියලු මුදල් ප්‍රමාණ.

(3) පහත සඳහන් මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවිය යුතුය:—

(අ) සංස්ථාව විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු හා ඇප යටතේ සංස්ථාව සතු බැඳීම් වලින් නිදහස් වීමට අවශ්‍ය සියලු මුදල් ගණන් හා

(ආ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම යන මෙහිලා සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් ගෙවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණ.

20. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය ම විය යුතුය.

(2) 1971 අංක 38 දරණ මුදල් පනතේ II වන කොටසේ අර්ථානුකූලව සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වූ විටක මෙන් ඒ සංස්ථාවේ මුදල් පාලනයට හා ගිණුම්වලට ඒ පනතේ ඒ කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතුය.

21. (1) එක් එක් වර්ෂයෙහි සංස්ථාවට ලැබෙන ශුද්ධ ලාභය ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, සංස්ථාවේ ලාභ ආයෝජනය කරනු ලබන ආකාරය සංස්ථාව විසින් තීරණය කළ හැකිය.

(3) සංස්ථාවේ ප්‍රාග්ධනය වෙනුවෙන් කිසිම ලාභාංශයක් නොගෙවිය යුතුය.

22. (1) අධ්‍යක්‍ෂවරයකු විසින් හෝ මණ්ඩලය විසින් ප්‍රකාශිතවම බලය දෙනු ලැබූ තැනත්තකු විසින් හැර, අන් කිසිම තැනැත්තකු විසින් මේ පනත යටතේ මණ්ඩලය විසින් පවරා නියම කොට නැතහොත් භාර කොට ඇති බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් ඒ අන් තැනත්තා විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම යන මෙහිලා, මණ්ඩලය විසින් අත්සන් කළ යුතුයයි හෝ ලියා අත්සන් කර දිය යුතුයයි නියමිත ලේඛන කිසිවක් අත්සන් කිරීම හෝ ලියා අත්සන් කර දීම නොකළ යුතුය.

(2) අධ්‍යක්ෂවරයන් විසින් අත්සන් කරනු ලබන ලදුපත් හෝ ඒ ලදුපත් අත්සන් කිරීමට මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් අත්සන්.කරනු ලබන ලදුපත්, සංස්ථාවට ගෙවනු ලබන මුදල් ප්‍රමාණ සාර්ථක ලෙස ගෙවා නිදහස් වූ බවට සාක්ෂි දැරිය යුතුය.

## V වන කොටස

## සංස්ථාවේ කාර්ය මණ්ඩලය

23. (1) සංස්ථාවේ සභාපති සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ යුතුය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට හා පාලනයට යටත්ව, සංස්ථාවේ කටයුතු මෙහෙයවීම, සංවිධානය, සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සංස්ථාවේ සේවකයන්ගේ පරිපාලනය යන මේවා සභාපති භාරයේ පැවතිය යුතුය.

(3) මේ පනතින් සභාපති වෙත පැවරෙන හෝ නියම කෙරෙන හෝ භාර කෙරෙන යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් සේවකයකුට පවරා දීම අවශ්‍ය යයි සභාපති විසින් සලකනු ලබන කවර අවස්ථාවක වුවද මණ්ඩලයේ අනුමතය ඇතිව ඔහු විසින් ඒ සේවකයාට ලියවිල්ලකින් එසේ පවරා දියහැකි අතර සභාපතිගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ සේවකයා විසින් ඒ බලය ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීම කළ යුතුය.

24. (1) මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන්ට හා සේවකයන්ට පාරිශ්‍රමික ගෙවීම මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි, ආකාරයක් හා ප්‍රමාණ අනුව, එසේ වූ සේවා කොන්දේසි වලට යටත්ව කළ යුතුය.

(3) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට සංස්ථාව විසින් එපරිද්දෙන්ම ලබාගත් කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයකට තාවකාලිව පත්කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(4) රාජ්‍ය සේවයෙහි යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන ඔහුට හා ඔහු සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතුය.

(5) රාජ්‍ය සේවයෙහි යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(6) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සංස්ථාවට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) සංස්ථාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, සංස්ථාව විසින් එපරිද්දෙන්ම ලබාගත් කැමැත්ත ඇතිව සේවය කරනු ලබන කාලයකට තාවකාලික වශයෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයට පත්කළ හැකිය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සම්බන්ධ අයිතිවාසිකම් ඇතුළුව, සංස්ථාව හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය විසින් නැතහොත් ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟ විය හැකි නියම හා කොන්දේසි අනුව ස්ථිර වශයෙන් ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා ඒ කාර්ය මණ්ඩලයට පත්කළ හැකිය.

(8) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවකට එපරිද්දෙන්ම ලබාගත් කැමැත්ත ඇතිව තාවකාලිකව සංස්ථාවේ කාර්ය මණ්ඩලයට පත්කළ හැකිය; නැතහොත් විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් සම්බන්ධ අයිතිවාසිකම් ඇතුළුව, සංස්ථාව හා එකී රාජ්‍ය සංස්ථාව විසින් එකඟ විය හැකි නියම හා කොන්දේසි අනුව ස්ථිර වශයෙන් ඒ නිලධරයා හෝ සේවකයා ඒ කාර්ය මණ්ඩලයට පත්කළ හැකිය.

LIBRARY

(9) (7) වන හෝ (8) වන උපවගන්තිය අනුව සංස්ථාවේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙන යම් සාමාජිකයකු යටත්වන විනය පාලනයටම ඒ තැනැත්තා යටත්විය යුතුය.

**25.** සංස්ථාවේ සියලු අධ්‍යක්ෂවරයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතුය.

**26**. අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් තේරුම් ගත යුතුය.

## VI වන කොටස

## සාමාන්‍ය

**27.** සංස්ථාව විසින් දරන ලද යම් අලාභයක් හෝ පාඩුවක් සංස්ථාවේ කිසිම අධ්‍යක්ෂ-වරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් ඕනෑකමින් ම කරන ලද ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හේතුකොටගෙන සිදුවුවහොත් මිස, ඔහු ඒ අලාභයට හෝ පාඩුවට වගකිවයුතු නොවන්නේය.

**28.** (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සංස්ථාවට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ සංස්ථාවේ මෙහෙයීමෙන් සංස්ථාවේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව හෝ

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොවිය යුතුය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන වියදම් කිසිවක් සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතු අතර එසේ වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාව විසින් අයකර ගනු ලබන යම් ගාස්තුවක් සංස්ථාවේ අරමුදලට බැර කළ යුතුය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ සංස්ථාවේ මෙහෙයවීමෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදයි අධිකරණය විසින් තිරණය කරනු ලැබුවහොත්, ඔහු විසින් ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගනු නොලැබුවේ නම්, සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතුය.

29. සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, සේවකයකු හෝ විගණක වරයකු විසින් ම තම කාර්ය ඉටු කිරීම ආරම්භ කිරීමට පෙර, සංස්ථාවේ සියලු ගනුදෙනු සම්බන්ධයෙන් හා ඒ ගනුදෙනුවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් ද දැඩි රහස්‍යභාවය රැක ගැනීමට පොරොන්දු වීමේ ප්‍රකාශකයක් අත්සන් කළ යුතු අතර ඒ ප්‍රකාශය මගින්, පහත සඳහන් අවස්ථා වලදී හැර, එසේ වූ යම් ගනුදෙනුවක් හෝ කාරණයක් අනාවරණය නොකිරීමට ද පොරොන්දු විය යුතුය:—

(අ) එසේ කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ අධිකරණයක් විසින් හෝ ගනුදෙනුවට නැතහොත් කාරණයට සම්බන්ධ තැනැත්තා විසින් ඉල්ලූ විට;

(ආ) තම කාර්ය ඉටු කරන විට; හා

(ඇ) මේ පනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන කිසිවක් පිළිපැදීම සඳහා

30. මේ පනත යටතේ හෝ එය යටතේ කරනු ලබන යම් නියෝගයක් යටතේ යම් තැනැත්තකු වෙත භාරදීමට නියමිත හෝ බලය දෙන ලද යම් දැන්වීමක්, නියමයක් හෝ ලේඛනයක්—

(අ) ඒ තැනැත්තාගේ ලිපිනය ලියූ කවරයක බහා ඒ තැනත්තාට භාරදීමෙන් හෝ ඒ තැනැත්තා සාමාන්‍යයෙන් හෝ අන්තිමට පදිංචිව හෝ ව්‍යාපාර ස්ථානය කරගෙන සිටියේ යයි දන්නා ලද ලිපිනයට භාර දීමෙන්;

(ආ) ඒ තැනැත්තා සාමාන්‍යයෙන් හෝ අන්තිමට පදිංචිව හෝ ව්‍යාපාර ස්ථානය කරගෙන සිටියේ යයි දන්නා ලද ලිපිනයට එය ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමෙන්,

එය ඒ තැනැත්තා වෙත භාර දිය හැකිය.

31. (1) නියෝග සෑදීමට නියම කරනු ලබන්නේ හෝ බලය දෙනු ලබන්නේ හෝ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණාවලට අදාළව අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එම නියෝගය පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක්ම ඒ අනනුමතියේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද කිසි දෙයක වලංගු භාවයට එයින් හානියක් නොවිය යුතුය.

32. (අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් කඩකරන; නැතහොත්

(ආ) මේ පනතේ කාර්ය සඳහා තම දැනුම ප්‍රකාර අසත්‍ය නොහොත් වැරදි තොරතුරක් සපයන හෝ අසත්‍ය නොහොත් වැරදි කරුණු නැතහොත් ඉන් කොටසක් ඇතුළත් ලේඛනයක් සපයන; නැතහොත්

(ඇ) සංස්ථාවේ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන යටතේ සිය කාර්ය ඉටු කරන විට ඕනෑකමින්ම ඊට බාධා පමුණුවන,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි හයමාසයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ යටත් විය යුතුය.

33. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන්නාවූ ද නියමිත දිනයෙහි පවත්නාවූ ද ඇහුරුම් ණය සහතික ක්‍රමය හා අපනයන කටයුතු පිළිබඳ සහතික ක්‍රම සම්බන්ධයෙන් (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ 108 වන වගන්තියේ විධිවිධාන යටතේ ආණ්ඩුවේ නියෝජිතයා ලෙස ක්‍රියා කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම්, ණය, බැරකම් හා බැඳීම් සියල්ල සංස්ථාවට පැවරිය යුතුය.

34. 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සංස්ථාවේ කොටස් ප්‍රාග්ධනයට දායක විය හැකිය.

35. 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනතේ නිශ්චිත රක්ෂණ ව්‍යාපාරය සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතුය.

36. මුදල් නීති පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංස්ථාවේ කොටස් ප්‍රාග්ධනයට දායක විය හැකිය.

37. (1) අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින්, සමාගම් ආඥාපනතේ විධිවිධාන කිසිවක් සුළු වෙනස් කිරීම් සහිතව හෝ රහිතව සංස්ථාවට අදාළ කිරීම සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(2) මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංස්ථාවට අදාළ කරනු ලබන සමාගම් ආඥාපනතේ විධිවිධාන හැර ඒ ආඥාපනතේ සෙසු විධිවිධාන සංස්ථාවට අදාළ නොවිය යුතුය.

38. වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර ඒ අනුව මේ පනතේ හා ඒ සෙසු පනතේ විධිවිධාන අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වූ විටක, මේ පනතේ විධිවිධාන සෙසු නීතියක විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතුය.

# 1978 අංක 18 දරන විසර්ජන පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 27 වන දින]

1979 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබාගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍යවන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.

1. මේ පනත 1978 අංක 18 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1979 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 ජනවාරි 1 වන දිනෙන් ආරම්භව 1979 දෙසැම්බර් 31 වන දින අවසන්වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වෙයැයි තක්සේරු කර ඇති රුපියල් එක් දහස් හයසිය අසූ හතර කෝටි විසි අට ලක්ෂ පනස් හතර දහස් හත්සිය හැත්තෑ හතරක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින්; හා

(ආ) ණය වශයෙන් ලබාගන්නා මුදල්වල සමස්තය රුපියල් අටසිය දහ අටකෝටි හැට ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින් පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් එක් දහස් හයසිය අසූ හතර කෝටි විසි අට ලක්ෂ පනස් හතර දහස් හත්සිය හැත්තෑ හතරක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන් කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

3. (1) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන එක් එක් කටයුත්තෙන් 2 වන වගන්තියෙහි සඳහන් මුදල් වර්ෂය තුළදී ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතුය. එහෙත්, එසේ බැර කරනු ලබන ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන අවම සීමාව නොඉක්මවිය යුතුය. එවැනි කටයුත්තකින් ඒ අවම සීමාව ඉක්මවා ලැබෙන ලැබීම් කිසිවක් වෙතොත් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය එම උප ලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් එම උපලේඛනයේ V වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුල යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේනම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතුයයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කළ හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙනලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසි යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් කිසි වැඩසටහනක් යටතේවූ පුනරාවර්තන වියදම්වලට මේ පනතේ පළමුවන උපලේඛනයේ විධි-විධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවාවූ ද, එහෙත් වියදම් නොකරන ලද්දවූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූද, යම් මුදලක් එම වැඩසටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ වෙනයම් වැඩසටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන්කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරුකරනු නොලැබිය යුතුය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩුවිය හැකි බවට; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට,

අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතිය ඇතිව කළ හැකිය.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයේ, IV වන තීරයේ හෝ V වන තීරයේ දැක්වෙන යම් උපරිම සීමාවක් හෝ III වන තීරයේ නියමිත අවම සීමාව හෝ ආණ්ඩුවේ අනුමතිය ඇතිව 1980 මැයි 31 වන දින හෝ ඊට පෙර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් වෙනස් කළ හැකිය. නැතහොත් අමුතු කළ හැකිය. එබඳු යම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව ම සඳහන් කරනු ලැබුව හොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත් වූ ලෙස සැලකිය යුතුය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් එකතු කිරීමෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.